ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය

# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 71

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල
දෙවැනි වාර්තාව
**(2021 දෙසැම්බර්)**

**නියෝජ්‍ය කථානායක සහ කාරක සභා සභාපති**
**ගරු අජිත් රාජපක්ෂ මහතා**
**විසින්**
**2023 ක් වූ ජූනි මස 20 වැනි දින ඉදිරිපත් කරන ලදී.**

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්ය මණ්ඩලය**

- සුදත් පෙරේරා මහතා, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - කාරක සභාවේ ලේකම්
- ශාන්ත ප්‍රනාන්දු මහතා, ප්‍රධාන නිලධාරී
- චන්දිමා සුබසිංහ මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී
- ශ්‍යාමා අල්විස් මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී
- ඕෂිලා වීරකෝන් මහත්මිය, නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි
- කෝසලා ප්‍රියදර්ශනී මෙනෙවිය, සහකාර ප්‍රධාන නිලධාරී
- නාමල් ප්‍රනාන්දු මහතා, සහකාර ප්‍රධාන නිලධාරී
- ඉසුරි සරත්චන්ද්‍ර මෙනෙවිය, පාර්ලිමේන්තු නිලධාරී
- රුක්මණී දේවී මහත්මිය, ජ්‍යෙෂ්ඨ භාෂා පරිවර්තක
- චතුරිකා ප්‍රියදර්ශනී මහත්මිය, ලඝු ලේඛක

**අමාත්‍යාංශ ලේකම්වරුන්**

- කේ.ඩී. ඔල්ගා මහත්මිය - බලශක්ති අමාත්‍යාංශය
- අනුරාධ විජේකෝන් මහතා - තරුණ හා ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශය
- වෛද්‍ය එස්.එච්. මුණසිංහ මහතා - සෞඛ්‍ය අමාත්‍යාංශය
- ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා මහතා - කර්මාන්ත අමාත්‍යාංශය
- ජෙනරාල් දයා රත්නායක මහතා - කර්මාන්ත අමාත්‍යාංශය
- එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ මහතා - කම්කරු අමාත්‍යාංශය
- එම්.හඳානි ජයවර්ධන මහත්මිය - වෙළෙඳ අමාත්‍යාංශය
- රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා - වැවිලි අමාත්‍යාංශය
- එන්.බී.එම්.රණතුංග මහතා - ප්‍රවාහන අමාත්‍යාංශය
- සිරිනිමල් පෙරේරා මහතා - නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
- ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා - ඉඩම් අමාත්‍යාංශය
- ජේ.ජේ. රත්නසිරි මහතා - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
- ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා - ආරක්ෂක අමාත්‍යාංශය
- ආර්.එම්.අයි. රත්නායක මහත්මිය - ධීවර අමාත්‍යාංශය
- මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා මහතා - අධ්‍යාපන අමාත්‍යාංශය
- ජයන්ත ද සිල්වා මහතා - තාක්ෂණ අමාත්‍යාංශය
- එම්.එම්.පී.කේ. මායාදුන්නේ මහතා - අධිකරණ අමාත්‍යාංශය

අනුමැතිය ලැබීම මත මාසික වාර්තාවට ඇතුළත් කරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| **අනු අංකය** | **අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම** | **දිනය** |
|---|---|---|
| 01. | බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.25 |
| 02. | තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.26 |
| 03. | සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.11.28 |
| 04. | කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.03 |
| 05. | කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2020.12.04 |
| 06. | වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.10 |
| 07. | වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.23 |
| 08. | ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.23 |
| 09. | නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.24 |
| 10. | ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.03.24 |
| 11. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.04.07 |
| 12. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.04.08 |
| 13. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.08.05 |
| 14. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.09.10 |

මේ වන තෙක් අනුමැතිය නොලැබීම හේතුවෙන් මාසික වාර්තාවට ඇතුළත් නොකරන ලද කාරක සභා කාර්ය සටහන් පහත දැක්වේ.

| අනු අංකය | අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ නම | දිනය |
|---|---|---|
| 01. | අමාත්‍යාංශයන්හි විෂය පථයට නොගැනෙන රාජ්‍ය ආයතන විසින් පාර්ලිමේන්තුවට පිළිගන්වනු ලබන විෂයයන් සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව | 2021.10.05 |
| 02. | කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.09 |
| 03. | ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.09 |
| 04. | මහජන ආරක්ෂක  කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.10 |
| 05. | ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.16 |
| 06. | වැවිලි  කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.22 |
| 07. | තරුණ හා ක්‍රීඩා  කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.23 |
| 08. | නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.24 |
| 09. | අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.24 |
| 10. | තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.24 |
| 11. | වෙළෙඳ  කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.25 |
| 12. | සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.11.27 |
| 13. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.12.02 |
| 14. | බලශක්ති  කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.12.03 |
| 15. | ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.12.03 |
| 16. | කර්මාන්ත  කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.12.06 |
| 17. | ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.12.07 |
| 18. | අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව | 2021.12.08 |

**බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 නොවැම්බර් 25**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු උදය ගම්මන්පිල මහතා (සභාපති)
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජානක වක්කුඹුර මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

### 1.1 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1 ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ දින 180 සම්පූර්ණ කළ සේවකයන් ස්ථිර කිරීම

සියළු බඳවා ගැනීම් අත්හිටුවීමේ චක්‍රලේඛයක් අනුව මෙය අත්හිටුවා ඇති බවත්, භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබුණු වහාම මෙම පත්වීම් ලබා දිය හැකි බවත් ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) කාරක සභාවට දැනුම් දෙන ලදි.

අවශ්‍ය පියවර ගෙන මීළඟ කාරක සභාව වෙත දැනුම් දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 1.1.2 ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවයේ නියුතු කළමනාකරණ සහකාරවරුන් කිහිප දෙනෙකු සහ රියදුරකු ස්ථිර කිරීම

මෙම කරුණ සම්බන්ධවද සුදුසු පියවරක් ගෙන මීළඟ කාරක සභාව වෙත දැනුම් දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

#### 1.1.3 කන්කසන්තුරේ ඛණිජ තෙල් ගොඩබෑම සඳහා සංවර්ධනය කිරීම

මේ සම්බන්ධයෙන් සකස් කරන ලද සැලසුම අනුව කෙලින්ම කන්කසන්තුරේ දී ඛනිජ තෙල් ගොඩබෑම සිදු කළ හැකි බව ගරු චන්දිම වීරක්කොඩි මහතා කාරක සභාවට දන්වා සිටින ලදි.

මේ සම්බන්ධයෙන් කැබිනට් ඇමති මණ්ඩල තීරණයට බැහැරින් කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්මික ජනපදයක් සඳහා අවශ්‍ය ඉඩමක් අත්පත් කරගෙන ඇති බව තව දුරටත් දන්වා සිටින ලදී.

මේ සම්බන්ධ ලිපි ලේඛන පරීක්ෂා කළ යුතු බවත්, කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා ගරු චන්දිම විරක්කොඩි මන්ත්‍රීතුමා පවසන ලද කැබිනට් අනු කමිටුවේ වාර්තාව පාදක කර ගත යුතු බවත් ගරු සභාපතිතුමා අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දෙන ලදී.

### 1.1.4 කොලොන්නාව තෙල් ටැංකි සංවර්ධනය කිරීම

ඉදිකිරීමට නියමිත තෙල් ටැංකි නවයෙන් හයක් පැරණි ගොඩනැගිලි ඉවත්කර ඉදිකරන අතර මේ වන විට පැරණි ගොඩනැගිලි ඉවත් කිරීම ආරම්භ කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදි. අළුතින්ම සාදන ටැංකිවලද වැඩ ආරම්භ කර ඇති බව තවදුරටත් දන්වා සිටින ලදී.

මෙම තෙල් ටැංකි ආශ්‍රිත  පරිගණක තොරතුරු පද්ධතිය (SAP) අත්‍යාවශ්‍ය තොරතුරු ඕනෑම අවස්ථාවකදී බලා ගත හැකි ලෙස සකසා ගත යුතු බවත් ගරු සභාපතිතුමා කාරක සභාවට දන්වා සිටින ලදි.

තවද, වාහන අධීක්ෂණ පද්ධතියක (tracking system)  වැදගත්කම පිළිබඳවද ගරු චන්දිම වීරක්කොඩි මහතා කාරක සභාවේ අවධානය යොමු කරන ලදි.

## 1.2 ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1 බණිජ තෙල් ප්‍රවාහනය සඳහා දුම්රිය යොදා ගැනීම

බණිජ තෙල් ප්‍රවාහනය සඳහා මෑත කාලයේදී බවුසර් වැඩිපුර යොදා ගැනීමෙන් සිදුවන මාර්ග තදබදය අවම කිරීමට ප්‍රධාන නගර ආශ්‍රිතව හෝ දුම්රිය මගින් බණිජ තෙල් ප්‍රවාහනය සඳහා කටයුතු කිරීම පිළිබඳව සළකා බලන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

බවුසර් මගින් බණිජ තෙල් ප්‍රවාහනය නිසා මාර්ග තදබදය, පරිසර දූෂණය හා වියදම වැඩි වන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

මේ වන විට දුම්රිය මගින් ප්‍රවාහනය වැඩි කිරීමට වැඩි ධාරිතාවකින් යුතු නව දුම්රිය එන්ජින් මිලදී ගැනීම වැනි දුම්රිය දෙපාර්තමේන්තුවේ යම් වෙනස්කම් සිදුවිය යුතු බව ද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

## 1.3 ගරු ජානක වක්කුඹුර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.3.1 ඉන්ධන පිරවුම්හල් රාත්‍රී 10 ට වසා දැමීම

රත්නපුර සිට ඉංගිරිය මාර්ගය ඔස්සේ කොළඹ දක්වා පැමිණෙන විට බොහෝ අවස්ථාවලදී ඉන්ධන ලබා ගැනීමට දුෂ්කරතා ඇති බවත්  යම් සීමාවකට එක පිරවුම් හලක් හෝ විවෘතව තැබීම සුදුසු බවත් ගරු ජානක වක්කුඹුර මහතා යෝජනා කරන ලදී .

ගිවිසුම් ප්‍රකාරව පැය 24 ම විවෘතව තැබිය යුතු සමහර ප්‍රදේශයන්හි පිරවුම්හල් මේ ආකාරයට වසාදමන බවත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

කලින් වසා තැබීමට අවසර දෙන ලද ඉන්ධන පිරවුම්හල් පිළිබඳව විස්තර ලබාදෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. මෙම වේලාවන් ඇතුළත පිරවුම්හල් විවෘතව තැබීම පිළිබඳව විමර්ශනයක් කළ යුතු බවත් පැය 24ම විවෘත කළ නොහැකි නම් ප්‍රධාන පාරවල් වල යම් ස්ථානයන්හි පැය 24 ම විවෘත ඉන්ධන පිරවුම්හල් තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

## 1.4 ගරු නිරෝෂන් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1 ඉන්ධන පිරවුම් හල්වල ඇතැම් විට ඉන්ධන නොමැති වීම

ඇතැම් අවස්ථාවලදී පිරවුම්හල්වල ඉන්ධන නොමැති බව පවසන බැවින් තොග කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බවට ගරු නිරෝෂන් පෙරේරා මහතා යෝජනා කරන ලදී.

පවත්වාගෙන යා යුතු අවම තොග මට්ටම පිළිබඳව රෙගුලාසියක් නිකුත් කළ යුතු බවත්, අඛණ්ඩව සේවාව සැපයීම සඳහා සෑම ඉන්ධන පිරවුම්හලකම ටැංකි ධාරිතාව, අවම තොග මට්ටම සලකා බලා නිසි කාලයේදී තොග ඇණවුම් කළ යුතු බවත් ගරු සභාපතිතුමා කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

මේ සඳහා යම් මෘදුකාංගයක් භාවිතා කිරීම යෝග්‍ය බව ගරු නිරෝෂන් පෙරේරා මහතා කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

අවම තොග මට්ටම පිළිබඳව මේ වන විටත් එකඟතාවයක් පවතින බවත් උදෑසන 7ට ඉන්ධන පිරවුම් හලේ ඇති ඉන්ධන ප්‍රමාණය ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා කළ යුතු බවත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති විසින් සඳහන් කරන ලදී.

පෙර අනුගමනය කළ මුදල් තැන්පත් කිරීම අනුව ඉන්ධන ලබා දෙන ලද ක්‍රමවේදය වෙනස් කර පිරවුම්හල් හිමියන්ට දින 30ක ණය කාලයක් ලබා දී ඇති බැවින් මුදල් හෝ ඉන්ධන ගැටළු ඇති නොවන බව ඔහු විසින් දැනුම් දෙන ලදී. යම් ගැටළුවක් ඇත්නම් නැවත සලකා බලන බවද ඔහු විසින් සඳහන් කරන ලදී.

## 1.5 ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.5.1 විකල්ප බලශක්ති මූලාශ්‍ර කෙරෙහි යොමු වීම

තෙල් සංස්ථාව බොහෝවිට පාඩු ලබන ආයතනයක් බැවින් විකල්ප බලශක්ති මූලාශ්‍ර භාවිතා කිරීමට අවධානය යොමු කිරීමේ වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විකල්ප බලශක්ති ප්‍රභවයන් ලෙස ජීව වායුව නිපදවීම, වාහන ඉන්ධන සඳහා එතනෝල් මිශ්‍ර කිරීම සම්බන්ධව අධ්‍යයනයක් කරනු ලබන බව ගරු සභාපතිතුමා කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

ගෘහාශ්‍රිතව ජෛව ඉන්ධන සකස් කර ගැනීමේ හැකියාවක් තිබේද යන්න ගැන ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විමසීමක් කරන ලදී.

ගෘහාශ්‍රිතව ජෛව ඉන්ධන නිෂ්පාදනය කිරීමට ඒකකයක් නිපදවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය වෙත යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, ලබන වසරේදී නිෂ්පාදනය කරන ලද ඒකක නිවාස වෙත ලබාදීමට අපේක්ෂා කරන බවත් ගරු සභාපතිතුමා කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.5.2 ඉන්ධන සම්බන්ධ ණය ප්‍රමාණය කළමනාකරණය කිරීම

රුපියල් බිලියන 550 ක පමණ ණය මුදල කළමනාකරණය කරනු ලබන්නේ කෙසේද යන්න ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විසින් විමසීමක් කරන ලදී.

විශාල ණය ප්‍රමාණය කළමනාකරණය සඳහා අනුගමනය කිරීමට අපේක්ෂා කරන සැලසුම් පිළිබඳව ගරු සභාපතිතුමා විසින් පැහැදිලි කරන ලදී.

ණය සම්පූර්ණයෙන් ගෙවීම සඳහා දිගු කාලීන විසඳුමක් ලෙස අප රටේ තෙල් සහ ගෑස් පවතීද යන්න පිළිබඳව අවධානය යොමු කරනු ලබන බවත්, මෙහිදී මන්නාරම් ද්‍රෝණියේ තෙල් සහ ගෑස් ස්වාභාවිකව ඇති බවට කැනීම් වලින් සොයා ගෙන ඇති බවත් ගරු සභාපතිතුමා කාරක සභාවට දන්වන ලදී.

මේ වන විට විශේෂඥ දැනුම සහිත විදේශ රටවල සේවය කරන ලද පුද්ගලයින් ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය සඳහා බඳවා ගෙන ඇති බවත්, තෙල් සහ ගෑස් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කර කැබිනට් මණ්ඩල අනුමැතිය ගෙන ගැසට් කර ඇති බවත් ගරු සභාපතිතුමා කාරක සභාවට දන්වන ලදී.

ආයෝජන සිදු කිරීමේ සුරක්ෂිතතාවය සඳහා නව පනතක් ඉදිරිපත් කරන බවත්, අනතුරුව අදාළ වෙන්දේසි කිරීම් කිරීමට සැලසුම් කරන බවත් ගරු සභාපතිතුමා කාරක සභාවට දන්වන ලදී.

මෙහිදී අප රටට ලැබෙන ආදායම් අවස්ථා පිළිබඳව ගරු උදයන කිරිඳිගොඩ මහතා කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

තෙල් සොයාගැනීමේදී රජයට ආදායම ලබා ගැනීමේ එක් එක් පියවරයන් ගැන දීර්ඝ විස්තරයක් ගරු සභාපතිතුමා කාරක සභාවට දැනුම් දෙන ලදි.

ශ්‍රී ලංකාව තුළ තෙල් කැණීම් අරඹා නැද්ද යන්න පිළිබඳව ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විමසීමක් කරන ලදී.

කැනීම් අත්හැර දැමීම් සිදු නොවන ආකාරයට සැලසුම් කරන බව ගරු සභාපතිතුමා කාරක සභාවට දැනුම් දෙන ලදි.

කලින් තෙල් කැණීම් සිදු කළ සමාගම ඩොලර් මිලියන 10.5ක මුදලක් මෙරටින් ලබාගෙන ගවේෂණ මගින් සොයාගත් දත්ත ද මෙරටට ලබා නොදුන්නේද යන්න ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා කාරක සභාවෙන් විමසන ලදී.

මෙය සාවද්‍ය තොරතුරක් බවත්, එම සමාගම විසින් මෙරටට ගෙවීම් කර ඇති බවත්, සියළු දත්ත මෙරට සතු බවත්, ගරු සභාපතිතුමා කාරක සභාවට දැනුම් දෙන ලදි.

## 1.6 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1 මන්නාරම් ප්‍රදේශයේ ජීව වායු නිෂ්පාදනය

මන්නාරම් ප්‍රදේශයේ තම නිවසේ වැසිකිලිය ආශ්‍රිතව ජීව වායු නිෂ්පාදනය කර නිවසේ අවශ්‍යතාවයන්ට පාවිච්චි කරන ස්ථානයක් ඇති බව ගරු චාල්ස් නිර්මලනාදන් මහතා කාරක සභාව වෙත දන්වා සිටින ලදී.
මෙම පුද්ගලයා අමාත්‍යාංශය වෙත හඳුන්වා දෙන ලෙස ගරු සභාපතිතුමා ඉල්ලීමක් කළ අතර, මෙම නිර්මාණය ද සලකා බලා වඩාත් සාර්ථක නිර්මාණයක් කරා යාමට හැකි බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 1.6.2 කොවිඩ් 19 හේතුකොටගෙන වසා දමා ඇති ප්‍රදේශවල ඉන්ධන පිරවුම්හල්

කොවිඩ් 19 හේතුකොටගෙන වසා දමා ඇති ප්‍රදේශවල ඉන්ධන පිරවුම්හල් හිමියන්ට යම්කිසි සහනයක් ලබා දී ඇත්ද යන්න ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විමසීමක් කරන ලදි.

දින 3ක ණය පදනමක් සහ 50%ක බැංකු ඇපකරයක් යටතේ ඉන්ධන ලබා දීමට කටයුතු කර ඇති බවත් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.6.3 ඉන්ධන පිරවුම්හලක නම වෙනස් කිරීම

වවුනියාවේ ඉන්ධන පිරවුම්හලක් වෙනත් පුද්ගලයකු විසින් මිලදී ගෙන ඇති බවත්, මෙහි නම වෙනස් කිරීම සඳහා අවශ්‍ය ලේඛන සියල්ල මීට වසරකට පමණ පෙර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලබා දී ඇති බවත්, මෙතෙක් මෙය සිදුවී නොමැති බවත් ගරු චාල්ස් නිර්මලනාදන් මහතා කාරක සභාවට දන්වා සිටින ලදි.

ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා දන්වා සිටින ලදී.

## 1.7 ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.7.1 අයි ඕ සී සමාගම වෙත ලබා දී ඇති ඉන්ධන පිරවුම්හල් නැවත මෙරට ව්‍යාපාරිකයන් වෙත ලබා ගැනීමේ හැකියාව

ඔවුන් සතුව පවතින ඉන්ධන පිරවුම්හල් 204 සඳහා වන විසි අවුරුදු ගිවිසුම අනුව මෙම පිරවුම්හල් නැවත අප සතු කර ගත නොහැකි බවත්, නමුත් නියාමන බලය ගරු අමාත්‍යවරයා සතුව ඇති බවත් ගරු සභාපතිතුමා කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

වෙළෙඳපොළ මේ වන විට 92% ක් ශ්‍රී ලංකා රජය සතු වන අතර අයි ඕ සී වෙළෙඳපොළ 8% දක්වා අඩුව ඇති බවත් ගරු සභාපතිතුමා කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

## 2. කාරක සභාව ප.ව. 3.15 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**තරුණ හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 නොවැම්බර් 26**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු තේනුක විදානගමගේ මහතා (රාජ්‍ය අමාත්‍ය) (සභාපති)
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ජේ. සී. අලවතුවල මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු ලලිත් එල්ලාවල මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

### 1.1 ගරු උදයන කිරිඳිගොඩ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1 පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්ට දීමනාවක් ලබාදීම

පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දෛනික ගෙවීම් ලබන පාසල් ක්‍රීඩා පුහුණුකරුවන්ට දීමනා නොලැබෙන බැවින් ඔවුන්ට සහනයක් සලසා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

සෑම පාසලකම සිටින උපදේශකවරුන් කණ්ඩායමක් සාදා ඔවුන් පිළිබඳ අවධානය යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

ක්‍රීඩා උපදේශකවරුන් පාලනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් බව රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

### 1.1.2 ක්‍රීඩා උපදේශකවරුන්ගේ අධ්‍යාපන තත්ත්වය නංවාලීම

ක්‍රීඩා උපදේශකවරුන්ගේ අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨයේ ක්‍රීඩා පිළිබඳව ස්පෝර්ට්ස් සයන්ස් (Sports Science) යනුවෙන් පැවැත්වූ ඩිප්ලෝමා පාඨමාලාව නැවත ආරම්භ කර එය උපාධියක් ප්‍රදානයක් දක්වා වැඩිදියුණු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ක්‍රීඩා විද්‍යායතනය විශ්වවිද්‍යාලයක් බවට පත් කිරීම දැනට සාකච්ඡා කරමින් පවතින බවත්, ජාතික විශ්වවිද්‍යාල තුනක ක්‍රීඩා අධ්‍යාපනය සම්බන්ධ උපාධි ලබා දීම සිදු කරන බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.3 මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ක්‍රීඩාංගණය ඉදිකිරීම

මහනුවර ධර්මරාජ විද්‍යාලයේ ක්‍රීඩාංගණය ඉදිකිරීමේදී ක්‍රීඩාගාරයක් ස්ථාපනය කිරීමද වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

## 1.2 ගරු ලලිත් එල්ලාවල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1 බණ්ඩාරගම ක්‍රීඩාපිටිය

කළුතර දිස්ත්‍රික්කයටම තිබූ එකම මීටර 400 ධාවන මංතීරුව ක්‍රිකට් ක්‍රීඩාංගනයක් බවට පරිවර්තනය කිරීම ප්‍රදේශයේ දරුවන්ට සිදුකළ අසාධාරණයක් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. එමෙන්ම මෙය ආශ්‍රිතව ඇවිදින මංතීරුවක්ද ඉදි කළ හැකිව තිබුණු බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ශ්‍රී ලංකා ක්‍රිකට් මණ්ඩලයේ ඉල්ලීමක් අනුව මීටර් 400 ධාවන පථයක් සහිත මෙම ක්‍රීඩා පිටියේ අනෙක් ක්‍රීඩා කිරීම සඳහා ඉඩ පහසුකම් සහිතව ක්‍රිකට් තණ තීරුව සාදා ඇති බව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3 ගරු ජයන්ත සමරවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.3.1 පානදුර ක්‍රීඩා පිටිය

අක්කර නවයක් පමණ වූ පානදුර ක්‍රීඩා පිටියෙන් සැලකිය යුතු කොටසක් වෙනත් ව්‍යාපාරික කටයුතු සඳහා බදු දී ඇති බව මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. බදු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කරන ලෙසත්, මෙය සංවර්ධනය කර සුගතදාස ක්‍රීඩාංගණයට ආදේශක ක්‍රීඩාංගනයක් බවට පත්කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

මෙම කරුණ සඳහා මැදිහත් වීමට අමාත්‍යාංශය කැමති බව මේ වන විට දිස්ත්‍රික් ලේකම් වෙත දන්වා ඇති බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි. මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ එකඟතාවය ලැබුණු පසු මෙම ගැටළුව පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා කොට එම ගිවිසුම අහෝසි කිරීමේ ඉදිරි කටයුතු වලට යොමු විය හැකි බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදි.

## 1.4 ගරු අමරකීර්ති අතුකෝරල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1 පොළොන්නරුව ප්‍රදේශයේ ක්‍රීඩාංගණ සම්බන්ධ ගැටළු

රුපියල් ලක්ෂ 250ක් පමණ වියදම් කර සකස් කරන ලද පොළොන්නරුව ජාතික ක්‍රීඩාංගණයේ ආපනශාලාව ප්‍රයෝජනයට නොගෙනම විනාශ වී යා හැකි තත්වයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

පොළොන්නරුව නගරාසන්නව ඇති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීමට වැඩපිළිවෙළක් අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදි.

මෙම ක්‍රීඩා පිටියන්හි අඩුපාඩු සකසා අංග සම්පූර්ණ කිරීමට ගරු අමාත්‍යතුමා උපදෙස් දී ඇති බවත් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

## 1.5 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.5.1 රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සහ වෙනත් කරුණු

සබරගමුව පළාතේ රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය සඳහා කෘතිම ධාවන පථයක් (Synthetic Track) සහ පිහිනුම් තටාකයක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා ඉල්ලීමක් කරන ලදී. එමෙන්ම අවශ්‍ය මූලික පහසුකම්ද ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දීර්ඝ කාලයක් ක්‍රීඩා සංවර්ධන නිලධාරියෙකු නොමැති බැවින් නිලධාරියෙකු අනුයුක්ත කිරීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 1.5.2 රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය ක්‍රීඩා පාසලක් ලෙස සංවර්ධනය කිරීම

නේවාසිකාගාර පහසුකම් සහිත රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය ක්‍රීඩා පාසලක් ලෙස සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.5.3 තරුණ ව්‍යවසායකයින් සඳහා ග්‍රාමීය මට්ටමෙන් පිහිටුවනු ලබන ව්‍යාපෘතිය

වෙළඳ අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වීමට නියමිත ග්‍රාමීය මට්ටමේ තරුණ ව්‍යවසායකයින් සඳහාවූ "කිව් ෂොප් (Q Shop)" ව්‍යාපෘතියේ කටයුතු කිරීමට ක්‍රීඩාවෙහි යෙදුණු අයකු යොදවා ගැනීම වඩාත් සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

## 1.6 ගරු වරුණ ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1 රත්නපුර ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම

රත්නපුර පළාත් සභාවට අයත් ක්‍රීඩාංගනයේ සමහර ක්‍රීඩාවන් සඳහා ක්‍රීඩාංගන සකස් වුවත් කෘතිම ධාවන පථයක් ස්ථාපිත කර නැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. මෙම කරුණ නිසා සබරගමුව පළාත් ක්‍රීඩා උළෙල පැවැත්වීමට නොහැකි බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නාය යාමක් නිසා වැඩකටයුතු ඇණහිටියද මේ වන විට ක්‍රීඩාංගනය භාවිතයට ගනු ලබන බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී. පිහිනුම් තටාකයේ වැඩ අවසන් කර කඩිනමින් ලබාදෙන බවත් ඔහු විසින් දැනුම් දෙන ලදි. ලැබී තිබෙන ඉල්ලීම පරිදි මෙය ලබා දෙන්නේ නම් අවබෝධතා ගිවිසුමක් මත ලබා දෙන බව අධ්‍යක්ෂ ජනරාල් විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නායයාම සිදු වූ අන්තයේ බැම්මක් සැකසීම සඳහා ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය වෙත භාරදී ඇති බව අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 1.6.2 පාසල් ක්‍රීඩා උපදේශකවරු

පාසැල් ක්‍රීඩා උපදේශකවරුන්ගේ සම්පූර්ණ සේවා කාලය තුළ පුහුණුකිරීම් සිදු නොවන බව නිරීක්ෂණය වන බැවින් මෙය විධිමත් කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ක්‍රීඩාවට සම්බන්ධ නොවූ පුද්ගලයන් ක්‍රීඩා උපදේශකවරුන් ලෙස බඳවා ගැනීම නිසා පාසල් දරුවන්ට අපහසුතාවයකට පත්වී ඇති බවත් ගරු මිලාන් ජයතිලක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ක්‍රීඩා උපදේශකවරුන් යම් යම් නිර්ණායක වලට අනුකූලව බඳවා ගෙන ඇති බවත්, ඒ අය ජාතික මට්ටමේ හෝ පළාත් මට්ටමේ කුසලතා සහිත අය බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

## 1.7 ගරු මිලාන් ජයතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.7.1 ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් ක්‍රීඩාංගන සංවර්ධනය කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් සඳහා කෘතිම ධාවන පථයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා මට්ටමේ පවතින අතර ගම්පහ දිස්ත්‍රික්කයට වෙනම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට නියමිත බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම එක් ක්‍රීඩාපිටියක් සංවර්ධනය කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටින ලදී.

### 1.7.2 යෝජිත නව ක්‍රීඩා පාසල්

අළුතින් ඇති කිරීමට නියමිත ක්‍රීඩා පාසල් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී ක්‍රීඩා පාසල් තේරීම සිදු කරන බවත් රුපියල් මිලියන 50ක මුදලක් මෙම වසර සඳහා එම පාසල් වලට වෙන් කර ඇති බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.7.3 ගම්පහ දිස්ත්‍රික්කයේ නැදුන්වල ප්‍රදේශයේ යොවුන් සේනාංක පරිශ්‍රය රක්නාලංකා සමාගම වෙත පවරා දීම සම්බන්ධ ගැටළුව

තරුණ තරුණියන් පුහුණුව ලබන මෙම පරිශ්‍රය රක්නාලංකා සමාගම සඳහා පැවරීමට යන බවට ආරංචි මාර්ග පවතින බවත්, එම සමාගම සඳහා විකල්ප ස්ථානයක් සපයාදීම යෝග්‍ය බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

දෙහිඕවිට, කනංගම ප්‍රදේශයේ වැසී ගිය පාසලක් යොවුන් සේනාංකයක් බවට පත් කළ නමුත් මේ වන තෙක් ඵලදායි කාර්යයක් ඉටු නොවූ බව ගරු සුදත් මංජුල මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

යොවුන් සේනාංක තරුණ සේවා සභාව යටතේ පාලනය නොවන බව තරුණ සේවා සභාවේ සභාපති විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

එම කරුණ පිළිබඳව සොයා බලා කාරක සභාව දැනුවත් කරනු ලබන බවට අමාත්‍යාංශ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.7.4 සුවතා මංතීරු වැඩසටහන ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධ විමසීම්

සුවතා මංතීරු වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන්නේ කෙසේද යන්න ගැන පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මේ පිළිබඳව ඉදිරියේ දී ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කරනු ලබන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදී.

## 1.8 ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.8.1 ග්‍රාමීය තරුණයන් ක්‍රීඩා කෙරෙහි යොමු කරවීම

ග්‍රාමීය තරුණයන් ක්‍රීඩාව කෙරෙහි යොමු කරවීම වෙනුවෙන් වොලිබෝල් ක්‍රීඩාව සඳහා අවශ්‍ය උපකරණ ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.8.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ක්‍රීඩා පහසුකම් සහිත පාසලක් ඇති කිරීම

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් සඳහා අවම වශයෙන් එක් ක්‍රීඩා පාසලක් සංවර්ධනය කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ක්‍රීඩා පාසල් බවට පත්වී ඇත්තේ ජාතික හා තරඟකාරී පාසල් බවත්, 8 වසර සඳහා ක්‍රීඩකයින්ගෙන් සමන්විත නව පන්තියක් ඇති කිරීමට කටයුතු සම්පාදනය කර ඇති බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

ජනප්‍රිය පාසල් වලට ඇතුලත් වූ ශිෂ්‍යයන් ක්‍රීඩාවට යොමු වීම සැක සහිත බව ගරු වරුණ ලියනගේ මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදි.

දරුවන් අයථා මාර්ගවලින් 8 වසර පන්තියට ඇතුලත් වීම වැළැක්විය යුතු බවත්, මෙම අවස්ථාව ක්‍රීඩකයන් සඳහා පමණක්ම ලබා දිය යුතු බවත්, අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 1.9 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.9.1 දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීම

දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය දුර්වල වී ඇති නිසා මීටර් 10,000 දුර දිවීම වැනි ඇතැම් ක්‍රීඩා ඉසව් නොපවත්වන තත්වයට පත්වී ඇති බවත්, එබැවින් දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ අවධානය යොමු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදී.

### 1.9.2 කරාටේ වැනි ක්‍රීඩා කෙරෙහි දක්ෂතාවය ඇති දරුවන් හඳුනාගැනීම

කරාටේ වැනි ක්‍රීඩා කෙරෙහි දක්ෂතාවය ඇති දරුවන් හඳුනාගෙන ඒ අය සඳහා වැඩපිළිවෙළක් සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.3 අත්තනගල්ල වතුපිටිවල යොවුන් සේනාංක මධ්‍යස්ථානය වටා තාප්පයක් ඉදි කිරීම

වතුපිටිවල යොවුන් සේනාංක මධ්‍යස්ථානය නිරෝධායන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම ගැන ප්‍රදේශවාසින්ගේ දැඩි විරෝධතාවයක් ඇති බවත් එබැවින් ඒ වටා තාප්පයක් ඉදි කිරීමට අවධානය යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.9.4 ගම්පහ ජාතික පාසල් දෙකක් සංවර්ධනය කිරීම

වේයන්ගොඩ බණ්ඩාරනායක විද්‍යාලය සහ හොරගොල්ල සංඝබෝධි විද්‍යාලය යන ජාතික පාසල් දෙකෙහි ක්‍රීඩා පහසුකම් අඩු බවත්, එම නිසා මෙම පාසල් සංවර්ධනය කර දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණ සඳහා ලිඛිත යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

### 1.9.5 ප්‍රදේශයේ නේවාසිකව වාසය කරන ඇඟලුම් කම්හල් සේවකයන් සඳහා ක්‍රීඩා පිටියක් ලබා ගැනීම

ප්‍රදේශයේ නේවාසිකව සිටින ඇඟලුම් කම්හල් සේවකයන්ට ක්‍රීඩා කිරීම සඳහා මාතලාන කණිෂ්ඨ විද්‍යාලයට අයත් විශාල ක්‍රීඩා පිටිය යම් අය කිරීමක් සහිතව ලබා දිය හැකි නම් පාසලේ නඩත්තු කටයුතු සඳහාත් ප්‍රයෝජනවත් වන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදි.

### 1.9.6 වතුපිටිවල ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු

වතුපිටිවල ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු කඩිනම් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම ක්‍රීඩාංගනයේ කටයුතු නිරීක්ෂණය කළ අතර පිහිනුම් තටාකය, ක්‍රීඩාංගනය සහ ප්‍රධාන ක්‍රීඩාගාරය මසක් ඇතුලත සම්පූර්ණ කර දීමට කොන්ත්‍රාත්කරුවන් එකඟ වූ බව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කාරක සභාව වෙත දැනුම් දෙන ලදි. ගෘහස්ථ ක්‍රීඩාංගනය සම්පූර්ණ කර දීමට මාස තුනක් අවශ්‍ය බව ප්‍රකාශ වූ බවද දැනුම් දෙන ලදී.

පාසල් දරුවන්ට ක්‍රීඩාංගනය වෙත පැමිණීම සඳහා ගරු අමාත්‍යතුමා විසින් යෝජිත බස් රථ සේවාව යොදා ගැනීමෙන් එම අපහසුතාවයද මග හරවා ගත හැකි බවත් ඔහු විසින් දැනුම් දෙන ලදි.

### 1.9.7 යෞවන සමාජවල තරුණ දරුවන් සඳහා යම් වැඩ පිළිවෙලක් හඳුන්වා දීම

යෞවන සමාජවල තරුණ දරුවන් සඳහා යම් වැඩ පිළිවෙලක් හඳුන්වා දීම වැදගත් බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට යෝජනා කරන ලදි.

### 1.9.8 තරුණයන්ගේ විවාහ කඩා වැටීම හරහා සිදුවන සමාජ බිඳ වැටීම

තරුණ පිරිස් වල විවාහ බිඳ වැටීම් හරහා සිදුවන සමාජ ව්‍යසනය වැළැක්වීම සඳහා යම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

### 1.9.9 පාරම්පරික කර්මාන්ත නගා සිටුවීම

පාරම්පරික කර්මාන්තකරුවන්ට නව තාක්ෂණය හඳුන්වා දීමටත් ණය පහසුකම් ලබා දෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත යෝජනා කරන ලදී.

මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**1.10 ගරු ලලිත් එල්ලාවල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.10.1 ප්‍රදේශයේ තරුණයන් අධික ලෙස මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම - ගරු ලලිත් එල්ලාවල මහතා**

බණ්ඩාරගම ප්‍රදේශයේ අධික ලෙස මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූ පුද්ගලයන් සිටින බව හඳුනාගෙන ඇති බවත්, මෙයට පිළියමක් ලෙස ක්‍රීඩාපිටියක් සෑදීම සඳහා යෝජනා කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 1.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

-----------------------------------------------------------------------------------------------

**සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 නොවැම්බර් 28**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (සභාපති)
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු එම්.යූ.එම්.අලි සබ්රි මහතා
ගරු ලසන්ත අලගියවන්න මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ඩී.බී. හේරත් මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කාදර් මස්තාන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු ජගත් කුමාර මහතා
ගරු කේ.පී.එස්.කුමාරසිරි මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා
ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු එම්.එම්. සමන්ප්‍රිය හේරත් මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු රංජිත් බණ්ඩාර මහතා
ගරු මොහොමඩ් මුසම්මිල් මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

## 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

## 1.1 ගරු ජානක වක්කුඹුර මහතා විසින් ඉදිරපත් කරන ලද යෝජනා

### 1.1.1 අයගම රෝහලේ නේවාසික වෛද්‍යවරයා විසින් රෝගියෙකු රෝහලට භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම

මෙම ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම පරිදි රෝහලට වෙනත් වෛද්‍යවරයෙකුගේ සේවා ලබා දීමට කටයුතු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 1.2 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1 කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ඉන්දික ජාගොඩ මහතාගේ ක්‍රියාකලාපය

මේ පිළිබඳව මූලික විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කරන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.3 ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.3.1 මහනුවර මහරෝහලට අයත් අක්කර 22 ක භූමි ප්‍රමාණය අත්කර ගැනීමට කටයුතු කිරීම

මහනුවර මහරෝහලට  අයත් අක්කර 22 ක භූමි ප්‍රමාණයක් ප්‍රදේශවාසීන් විසින් අත්පත් කරගෙන ඇති බැවින් එම ඉඩම් නැවත රෝහලට ලබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.3.2 මහනුවර හාරිස්පත්තුව, අකුරණ, බුළුගොඩතැන්න ප්‍රදේශයේ කොරෝනා ආසාදිතයන් සංඛ්‍යාව සීඝ්‍ර ලෙස වැඩිවීම

එම ප්‍රදේශයේ සිදු කරන පීසීආර් පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.4 ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1 පවතින කොවිඩ් (COVID) වසංගත උවදුරින් ආරක්ෂාවීම සඳහා නිසි සෞඛ්‍ය උපදෙස් පිළිපැදීමට කටයුතු කිරීමේ වැදගත්කම

සෞඛ්‍ය සහ අනෙකුත් කාර්ය මණ්ඩල වලට ස්තූති කළ ගරු මන්ත්‍රීතුමා, වසංගතය මැඩලීම සඳහා ජනතාවගේ සහභාගීත්වය සහ උනන්දුව අත්‍යාවශ්‍ය බවද සඳහන් කරන ලදී.

කොරෝනා වසංගතය සම්බන්ධයෙන් කාරක සභාවක් පත්කරන ලෙසද ඉල්ලීමක් කරන ලදී.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව එයට ප්‍රමාණවත් බව ගරු සභාපතිතුමිය විසින් සඳහන් කරන ලදී.

## 1.5 ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.5.1 පාර්ලිමේන්තු භෝජනාගාරයේ ආහාර බෙදීම/පිළිගැන්වීම සඳහා ආහාරපාන දෙපාර්තමේන්තුවේ සේවකයකු යෙදවීමේ අවශ්‍යතාවය

එය කාලීන අවශ්‍යතාවයක් බැවින් ඒ පිළිබඳව පාර්ලිමේන්තු මහලේකම් දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා කාර්යාංශයේ නිලධාරීන්ට දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් තවදුරටත් අවධානය යොමුකරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) වෙත දැනුම් දෙන ලදී.

## 1.6 ගරු ජගත් කුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1 ජනාකීර්ණ ගමක් තුළ ස්ථාපිත කර ඇති නිරෝධායන මධ්‍යස්ථානය වෙනත් ස්ථානයකට රැගෙන යාමේ අවශ්‍යතාවය

මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.7 ගරු ප්‍රසන්න රණතුංග මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.7.1 මිනුවන්ගොඩ රෝහලට නව ගිලන් රථයක් ලබා ගැනීම

මිනුවන්ගොඩ රෝහලට නව ගිලන් රථයක් ලබා දෙන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී

### 1.7.2 ගම්පහ රෝහල ජාතික රෝහලක් බවට පත් කිරීම

මහා භාණ්ඩාගාරයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව පළාත් සභාවට අයත් රෝහල් මධ්‍යම රජයට පවරා ගත නොහැකි බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.8 ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.8.1 ග්‍රාමීය මට්ටමින් කොවිඩ් පැතිරීම පාලනය කිරීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම

ප්‍රාදේශීය මට්ටමින් කමිටු ඇති කිරීම තුළින් මෙම තත්ත්වය අධීක්ෂණය කළ හැකි බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.9 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.9.1 පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණයෙන් කොවිඩ් පාලනය කිරීමේ කටයුතු නියාමනය කිරීමේ අවශ්‍යතාවය

පළාත් පාලන ආයතන හා සම්බන්ධීකරණයෙන් මෙම කටයුතු නියාමනය කළයුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.9.2 මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ පුරප්පාඩු පිරවීම

ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.10 ගරු විදුර වික්‍රමනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.10.1 ප්‍රාදේශීය කොවිඩ් කමිටු රැස් කිරීමේ අවශ්‍යතාවය

ප්‍රාදේශීය කොවිඩ් කමිටු රැස්වීම අනිවාර්ය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.11 ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.11.1 ග්‍රාමීය මට්ටමේ නිරෝධායන ක්‍රියාවලිය තුළ අංශ කීපයක් සම්බන්ධවීමේදී පැන නඟින ප්‍රායෝගික ගැටළු

ග්‍රාමීය ප්‍රදේශවල නිරෝධායන ක්‍රියාවලියේදී ශ්‍රී ලංකා පොලීසිය, ප්‍රාදේශීය ලේකම්, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරීන් (MOH) හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHI) සම්බන්ධවීමේදී තොරතුරු සන්නිවේදනය වීමේ ගැටළු පැන නැගී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.12 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.12.1 මන්නාරම දිස්ත්‍රික් මූලික රෝහලේ බාහිර රෝගී අංශය සහ හදිසි අනතුරු අංශය ප්‍රතිසංස්කරණය කිරීම

මන්නාරම දිස්ත්‍රික් මූලික රෝහලේ බාහිර රෝගී අංශය සහ හදිසි අනතුරු අංශය සඳහා නව ගොඩනැගිල්ලක් ලබාදෙන ලෙසත් එම රෝහලට සී.ටී. ස්කෑන් යන්ත්‍රයක් ලබාදෙන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.12.2 වවුනියාව දිස්ත්‍රික්කයේ සෙට්ටිකුලම් මූලික රෝහලට කණිෂ්ඨ වෛද්‍ය නිලධාරියෙක් පත්කරන ලෙස ඉල්ලීම

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමුකර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) වෙත උපදෙස් ලබාදෙන ලදී.

## 1.13 ගරු මුජිබුර් රහුමාන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.13.1 උතුරු කොළඹ සහ මැද කොළඹ ප්‍රදේශවල ජනතාවගේ පීසීආර් පරීක්ෂණ ප්‍රමාණය වැඩි කිරීම

පීසීආර් පරීක්ෂණ ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ඊට අමතරව එම ප්‍රදේශයේ මහල් නිවාසවාසීන්ට ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂාව (Rapid Antigen Test) සිදු කිරීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිවයින පුරා දෛනිකව පීසීආර් පරීක්ෂණ 11,000ක් පමණ සිදුකරන බවත්, එයින් වැඩි ප්‍රමාණය කොළඹ අවට හුදෙකලා කරන ලද ප්‍රදේශවල සිදුකරන බවත් ඊට

අමතරව එම ප්‍රදේශවල ක්ෂණික ප්‍රතිදේහ පරීක්ෂාව (Rapid Antigen Test) සිදුකරන බවත් නියෝජ්‍ය වසංගත රෝග විද්‍යාඥවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.13.2 කොළඹ අවට ප්‍රදේශවල මිය යන වැඩිහිටි පිරිසගේ පීසීආර් පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබා දීමට ක්‍රමවේදයක් සැකසීම

මේ සඳහා ක්‍රමවේදයක් සකසා ඇති බවත් මුස්ලිම් ජාතිකයන්ගේ මෘත දේහවල පීසීආර් පරීක්ෂණ සිදු කිරීම සඳහා කුඩා පරීක්ෂණාගාරයක් ඉදිකිරීමට සැලසුම් කර ඇති බවත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.14 ගරු බී.වයි.ජී. රත්නසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.14.1 දඹදෙණිය නිරෝධායන මධ්‍යස්ථානයේත් නාරම්මල, අඹන්පොල රෝහල්වල මලාපවාහන පද්ධති උතුරායාම හේතුවෙන් ඇතිවන ගැටළුකාරී තත්ත්වය

මෙම කරුණ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.15 ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.15.1 සුවසැරිය ගිලන් රථ සේවය

සුවසැරිය ගිලන් රථ සේවය සඳහා 2021 වර්ෂයට සම්බන්ධීකරණ ජාලයක් (Substantive network) යටතේ ස්ථාන 48 ක් ඉදි කිරීමට ප්‍රතිපාදන වෙන් වී ඇති බැවින් එම කටයුතු කඩිනමින් සිදු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.16 ගරු එස්.ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.16.1 දූපත්වල පිහිටා ඇති රෝහල්වලට පහසුකම් ලබාගැනීම

උතුරේ පිහිටා ඇති නෙඩුද්තීවු, අනලතීවු, නයිනාතීවු, එළුවතීවු යන දූපත්වල පිහිටා ඇති රෝහල්වලට දීර්ඝ කාලයක සිට ස්ථිර වෛද්‍යවරුන්, හෙදියන් හා කාර්යය මණ්ඩල සේවකයින් හිඟ බවත් ගිලන් රථ ලෙස යොදාගැනීම සඳහා බෝට්ටු නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වෛද්‍ය නිලධාරින් අනුයුක්ත කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.16.2 කිලිනොච්චිය දිස්ත්‍රික් රෝහලේ හදිසි අනතුරු අංශයක් පිහිටුවීම

කිලිනොච්චිය රෝහලට හදිසි අනතුරු අංශයක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.16.3 උතුරු පළාතේ රෝහල් වල සෞඛ්‍ය සේවා රියදුරන්ගේ ගැටළු

මෙම රියදුරන් ස්ථිර සෞඛ්‍ය සේවයට බඳවා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උතුරු පළාත් ආණ්ඩුකාරතුමා සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගන්නා බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.17 ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.17.1 කුලියාපිටිය ශික්ෂණ රෝහලේ කොරෝනා රෝගීන් සඳහා වෙන් කරන ලද වාට්ටුවට අවශ්‍ය උපකරණ ලබා ගැනීම

ඒ සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.18 ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.18.1 අම්පාර දිස්ත්‍රික්කය සඳහා වෙන් කර ඇති ත්‍රිපෝෂ ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය දිස්ත්‍රික් රෝහලේ ලොරි රථ යොදා ගැනීම

මෙම කරුණ පිළිබඳව විමර්ශනයක් කර අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.18.2 "අළුත් රටට අළුත් බෙහෙත්" වැඩ පිළිවෙල යටතේ දේශීය බෙහෙත් නිෂ්පාදනය කිරීමේදී සිදු වී ඇතැයි කියනු ලබන මූල්‍යමය පාඩුව

මේ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීමක් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

දේශීය බෙහෙත් නිෂ්පාදන ක්‍රියාවලියේදී ලාභයක් මිස මූල්‍යමය පාඩුවක් කිසිසේත්ම සිදු වී නොමැති බව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.19 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.19.1 ඉන්දියාවෙන් කල් ඉකුත් වූ බෙහෙත් මෙරටට ගෙන්වන ලද "හාර්කෝට්ස් ෆාමා" (Harcourts Pharma) නම් සමාගම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග

මීළඟ උපදේශක කාරක සභාවට වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමිය විසින් රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

"ෆාමේස්" (Pharmace) සමාගමට එරෙහිව සිදුකරන ලද පරීක්ෂණය පිළිබඳව සම්පූර්ණ වාර්තාවක්ද මීළඟ උපදේශක කාරක සභාවට ලබා දෙන බව සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.20 ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.20.1 දේශීය ඖෂධ නිෂ්පාදනය සම්බන්ධයෙන් පළවන අසත්‍ය ප්‍රචාර නැවැත්වීම සඳහා මාධ්‍ය ආයතන මගින් ප්‍රචාරයක් කිරීමේ අවශ්‍යතාවය

ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා බව රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සභාපතිවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.21 ගරු විදුර වික්‍රමනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.21.1 දැනට වැඩ නිම වී ඇති හොරණ ඔසුසල විවෘත කිරීමට කටයුතු කිරීම

නාගරික සංවර්ධන අධිකාරියේ ගොඩනැගිල්ලක් සඳහා ඉල්ලීමක් කර ඇති අතර, එය ලැබුණු විගස මෙම ඔසුසල විවෘත කිරීමට කටයුතු කරන බව රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.21.2 රයිගම රෝහල ඉදිකිරීමේ කටයුතු කඩිනම් කිරීම

එම කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමුකර කඩිනම් පියවර ගන්නා බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.21.3 කළුතර රෝහලට පීසීආර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීම

බොඩිලයින් (Bodyline) ආයතනය විසින් කළුතර රෝහලට පීසීආර් යන්ත්‍රය මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වලින් කොටසක් පරිත්‍යාග කිරීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති බැවින් ඉතිරි මුදල සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් සැපයීමේ හැකියාව පිළිබඳ ගරු මන්ත්‍රීවරයා විසින් විමසීමක් කරන ලදී.

එම ප්‍රතිපාදන සැපයීමට හැකි බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.22 ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා විසින් ඉදිරපත් කරන ලද යෝජනා

### 1.22.1 බණ්ඩාරවෙල රෝහල මූලික රෝහලක් බවට පත් කිරීම

මෙම රෝහල මූලික රෝහලක් බවට පත් කර දෙන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම රෝහලේ ඊඑන්ටී අංශයට පහසුකම්, සීටී ස්කැනර් යන්ත්‍රයක්, ඩිජිටල් එක්ස් කිරණ යන්ත්‍රයක් සපයා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී. පරීක්ෂණාගාරය වැඩි දියුණු කරන ලෙසත්, ලේ බැංකුව සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරදෙන ලෙසත් ඉල්ලීමක් කරන ලදී.

වෛද්‍ය පුරප්පාඩු පිරවීමට හා අවශ්‍ය උපකරණ සැපයීමට හා ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ලද එම රෝහලට අවශ්‍ය පහසුකම් සැපයීමට හැකිතාක් දුරට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.23 ගරු කංචන විජේසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.23.1 මාතර සහ හම්බන්තොට රෝහල් සඳහා පීසීආර් පරීක්ෂණාගාර ලබා ගැනීම

එම රෝහල් සඳහා පීසීආර් පරීක්ෂණාගාර ලබාදීමට කටයුතු කරන ලෙස ගරු අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මත්තල ගුවන් තොටුපලට පීසීආර් පරීක්ෂණාගාරයක් ලබාදීමට අදහස් කරන බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් අවධානයක් යොමු කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.23.2 විශ්‍රාම ගිය මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සේවය ලබා ගැනීම

මෙම නිලධාරීන් සේවයට බඳවා ගැනීමට කටයුතු කරන්නේ නම් ඔවුනට ධීවර අමාත්‍යාංශය මගින් ගෙවීම් කළ හැකි බවත් ඔවුන්ගේ සේවය ධීවර වරායන් හා පැලියගොඩ මත්ස්‍ය වෙළඳපලට ලබා ගත හැකි බවටත් ගරු මන්ත්‍රීවරයා විසින් දැනුම් දෙන ලදී.

### 1.23.3 කොටුව හා පිටකොටුව තොග වෙළඳ මධ්‍යස්ථාන විවෘත කිරීමට අවසර ලබා ගැනීම

තොග වෙළඳ මධ්‍යස්ථානය විවෘත කර ආහාර තොග නිදහස් කිරීමට අවශ්‍ය අවසරය ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.24 ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.24.1 රේගුවේ ආනයනික ආහාර පරීක්ෂා කරන ස්ථානයේ සෞඛ්‍යාරක්ෂකභාවය

ශ්‍රී ලංකා රේගුවේ ආනයනික ආහාර පරීක්ෂා කරන ස්ථානයේ සෞඛ්‍යාරක්ෂිත බව පිළිබඳ අවධානය යොමු කළයුතු බව ගරු ඇමතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.24.2 ආනයනික ආහාරවල ගුණාත්මකභාවය සොයා බැලීම සඳහා අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණයක් ඇති කර ගැනීම

ගුණාත්මකභාවයෙන් අඩු ආහාර ආනයනය කිරීම බහුල වශයෙන් සිදුවන බැවින් වෙළඳ අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණයෙන් ඒ පිළිබඳව නිරීක්ෂණය කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව ගරු අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.24.3 ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත සංශෝධන කිරීමේ කටයුතු කඩිනම් කිරීම

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත සංශෝධන කිරීමේ කටයුතු කඩිනම් කළයුතු බවත් ඊට සමගාමීව විලවුන් නියාමන පනතද සංශෝධනය විය යුතු බව ගරු අමාත්‍යවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත තුළට විලවුන් නියාමන පනතේ විධිවිධානයන් ඇතුළත් කරමින් පනත සංශෝධනය කිරීමේ කටයුතු මාසයක් ඇතුළත අවසන් කර අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.24.4 කොරෝනා වසංගතය හේතුවෙන් ඇඳිරිනීතිය බලපැවැත්වූ කාල වකවානුවේ සිට අඛණ්ඩව සේවය කරන රාජ්‍ය නිලධාරීන් ඇගයීමට කටයුතු කිරීම

මෙම නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගේ සේවය ඇගයීමට කටයුතු කළයුතු බව ගරු අමාත්‍යවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.24.5 ග්‍රාමීය බෙහෙත් ශාලාවල සිටින ඖෂධ සංයෝජකවරුන් මගින් ගම්වාසීන්ගේ සායනික බෙහෙත් ලබාදීම

ග්‍රාමීය වෛද්‍ය මධ්‍යස්ථානවල සිටින ඖෂධ සංයෝජකවරුන්ගේ සේවය ලබාගෙන ගම්වාසීන්ගේ මාසික සායනික බෙහෙත් එම මධ්‍යස්ථානවලින් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.25 ගරු එම්. උදයකුමාර් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.25.1 පුත්තලම මහ රෝහලේ උපකරණ හිඟය

පුත්තලම මහ රෝහලේ කාර්ය මණ්ඩලයේ හිඟතාවය සහ උපකරණ හිඟය පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.25.2 වෛද්‍ය හිඟය

කාර්තිව් හා වන්නතීව් රජයේ බෙහෙත් ශාලාවල වෛද්‍යවරුන් හිඟයක් පවතින බැවින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

අලුතින් බඳවාගන්නා වෛද්‍යවරුන් එම ප්‍රදේශයට අනුයුක්ත කිරීමට කටයුතු කරන බවටත්, ඉදිරියේදී එම රෝහල පරීක්ෂා කිරීමට පැමිණෙන බවටත් ගරු සභාපතිතුමිය විසින් දැනුම් දෙන ලදී.

## 1.26 ගරු ජයන්ත සමරවීර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.26.1 කළුතර නාගොඩ රෝහලට පීසීආර් යන්ත්‍රයක් ලබා ගැනීම

කළුතර මහ රෝහලට පීසීආර් යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනවලින් කොටසක් දැනටමත් ලැබී ඇති බැවින් අවශ්‍ය ඉතිරි මුදල අමාත්‍යාංශයෙන් ලබාදීමට හැකිදැයි ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අවශ්‍ය අමතර මුදල ලබාදීමට හැකි බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.26.2 කළුතර නාගොඩ මහරෝහලට ස්කෑනර් (Scanner) යන්ත්‍රයක් ලබා ගැනීම

දැනට භාවිතා කරන සීටී ස්කෑනර් යන්ත්‍රය ක්‍රියා විරහිත වී ඇති බැවින් අලුතින් කොළඹ ජාතික රෝහලට ගෙන්වන ස්කෑන් යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සම්බන්ධයෙන් පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.26.3 පානදුර රෝහල නව රෝහලක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම

විදේශාධාර ලබන ව්‍යාපෘති මේ වන විට නතර කර ඇති බැවින් මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොමැති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එමෙන්ම මේ සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ඉදිරි කාරක සභා රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් අමාත්‍යාංශ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.26.4 ආහාර පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය

ආහාර පානවල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ආහාර පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය ගරු මන්ත්‍රීවරයා විසින් අවධාරණය කරන ලදී.

ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.27 ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.27.1 මහනුවර මහ රෝහලට පීසීආර් පරීක්ෂණ යන්ත්‍රයක් ලබා ගැනීම

මහනුවර මහ රෝහලට පීසීආර් පරීක්ෂණ යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම රෝහල සඳහා අත්‍යාවශ්‍ය වන රොබෝටික් ආර්ම් (Robotic Arm) උපකරණයක් ලබාදීමේ කටයුතු සිදු කරමින් පවතින බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.27.2 කඩුගන්නාව දිසා රෝහල මහ රෝහලක් බවට පත් කිරීම

කඩුගන්නාව දිසා රෝහල මහ රෝහලක තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.27.3 මහනුවර මහ රෝහලේ වෛද්‍ය හෙද සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම

රෝහලේ වෛද්‍ය, හෙද පුරප්පාඩු විශාල ප්‍රමාණයක් ඇති බැවින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.28 ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.28.1 පොළොන්නරුව මහරෝහලට පීසීආර් යන්ත්‍රයක් ලබා ගැනීම

පීසීආර් යන්ත්‍රයක් ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.28.2 පොළොන්නරුව මහ රෝහලේ සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම

මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.28.3 මැදිරිගිරිය රෝහල මහ රෝහලක් බවට පත් කිරීම

එම රෝහල මහ රෝහලක් බවට පත් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අවශ්‍ය සේවක පුරප්පාඩු කඩිනමින් පිරවීමටත් මැදිරිගිරිය රෝහලේ අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බවටත් ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.28.4 වැඩ නිමකර ඇති වකුගඩු රෝහල හැකි ඉක්මණින් විවෘත කිරීමට කටයුතු කිරීම

එම රෝහල ඉක්මණින් විවෘත කිරීමට අපේක්ෂා කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.28.5 ඉදිවෙමින් පවතින ආසාත ඒකකය, ඊඑන්ටී (ENT) ඒකකය, හදිසි අනතුරු ඒකකයේ වැඩ හැකි ඉක්මණින් අවසන් කිරීම

ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.28.6 මැදිරිගිරිය, හිඟුරක්ගොඩ සහ බකමූණ රුධිර කාන්දුකරණ (Dialysis) ඒකක ආරම්භ කිරීම

රුධිර කාන්දුකරණ ඒකක සඳහා ගොඩනැගිලි ඉදිකර ඇතත් මේ වනතුරුත් ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බව ගරු මන්ත්‍රීවරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ඒකක කඩිනමින් විවෘත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 1.29 ගරු එස්.එම්.එම් මුෂාරෆ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.29.1 අම්පාර පොතුවිල් රෝහල රේඛීය අමාත්‍යාංශයට පවරාගැනීමට කටයුතු කිරීම

ඉහත අඩු පහසුකම් යටතේ පවත්වාගෙන යන පොතුවිල් රෝහල රේඛීය අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

එමෙන්ම එම රෝහලට අවශ්‍ය වෛද්‍ය උපකරණ ලබාදීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.29.2 අම්පාර, පොතුවිල් ප්‍රදේශයට රාජ්‍ය ඔසුසලක අවශ්‍යතාවය

රාජ්‍ය ඔසුසලක් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.30 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.30.1 කෑගල්ල, අගුරුවැල්ල ප්‍රදේශයේ විශ්‍රාමික වෛද්‍යවරයකුට කොවිඩ් ආසාධනය වීම

මෙම වෛද්‍යවරයා දින 04ක් තුළ මුව ආවරණ රහිතව රෝගීන් 400-500 අතර ප්‍රමාණයකට ප්‍රතිකාර කර ඇති අතර ඔහුට හා ඔහුගේ බිරිඳට කොවිඩ් ආසාධනය වී ඇති බවට තහවුරු වී ඇත. එබැවින් සියළුම ආශ්‍රිතයන් ස්වයං නිරෝධානයට යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ සියළුදෙනා නිවස තුළ නිරෝධායනය කිරීමටත් ඔවුන් පීසීආර් පරීක්ෂණ සඳහා යොමු කිරීමටත් කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් නියෝජ්‍ය වසංගත රෝග විද්‍යාඥවරයාට උපදෙස් ලබා දෙන ලදී.

මෙම කරුණ පිළිබඳව නිරෝධායන පනත යටතේ නීති මාර්ගයෙන් කටයුතු කිරීම සුදුසු බව ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම වෛද්‍යවරයා සුව වූ පසු මෙම කරුණ සම්බන්ධව විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.30.2 කරවනැල්ල මූලික රෝහලේ අඩුපාඩු සම්පූර්ණ කර එය දිස්ත්‍රික් රෝහලක් බවට පත් කිරීම**

සේවක පුරප්පාඩු පිරවීම, අක්ෂි ඒකකයක්, කන නාසය සහ උගුර පිළිබඳ ඒකකයක් සහ හෘද ඒකකයක් ලබාදීම ඇතුළුව අවශ්‍ය උපකරණ ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.31 ගරු එම්.නන්දසේන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.31.1 මැදවච්චිය මූලික රෝහලට අවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කිරීම**

මැදවච්චිය කැබිතිගොල්ලෑව හා පදවිය මූලික රෝහල් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ලබා දී නොමැති බැවින් මැදවච්චිය මූලික රෝහලට හෝ අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.32 ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.32.1 ඇඹිලිපිටිය මහ රෝහල මූලික රෝහලක් බවට පත් කිරීම**

පළාත් සභාවට අයත් රෝහල් මධ්‍යම රජයට පවරාගත නොහැකි බව මහා භාණ්ඩාගාර චක්‍රලේඛයක් මගින් දන්වා ඇති බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.32.2 ඇඹිලිපිටිය රෝහලේ ඖෂධ හිඟය**

අත්‍යවශ්‍ය ජීවිතාරක්ෂක ඖෂධ (Life Saving Drugs)කීපයක හිඟයක් පවතින බැවින් ඒවා සපයාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමිය විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**1.32.3 සැත්කම් සඳහා යොදාගන්නා උපකරණ වල හිඟයක් පැවතීම**

එම උපකරණ සඳහා ප්‍රසම්පාදන කටයුතු කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමිය විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**1.32.4 සීමාවාසික වෛද්‍යවරුන්ගේ පත්වීම් ලබා දීම ප්‍රමාදවීම**

සීමාවාසික වෛද්‍යවරුන්ගේ පත්වීම් ලබාදීම අවුරුදු 03ක් පමණ ප්‍රමාද වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමිය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සේවා) වෙත උපදෙස් ලබා දෙන ලදී.

**1.32.5 මොණරාගල රෝහලට අවශ්‍ය පහසුකම් ලබාදීම**

මොණරාගල රෝහලේ මානසික රෝගීන් හා පිළිකා රෝගීන් සඳහා වාට්ටු නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.32.6 රෝහල් භූමියෙන් අක්කර 22 ක් බාහිර පාර්ශව විසින් අත්පත් කරගැනීම**

මෙම භූමි ප්‍රමාණය රෝහලේ සංවර්ධන කටයුතු සඳහා ලබාගත යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.32.7 වැල්ලවාය රෝහලේ වකුගඩු ඒකකයේ වැඩ අවසන් නොවීම හා රෝහලට මලපවහන පද්ධතියක් නොමැති වීම**

ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.33 ගරු දයාසිරි ජයසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**1.33.1 ගල්ගමුව මහ රෝහලේ අඩුපාඩු සම්පූර්ණ කිරීම**

සේවක පුරප්පාඩු පිරවීමෙන් සහ අනෙකුත් අඩුපාඩු සම්පූර්ණ කිරීමෙන් එම රෝහල සක්‍රීය රෝහලක් බවට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු අමාත්‍යවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමිය විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2. ග්‍රාමීය පළාත්වල වෛද්‍යවරු සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග**

ග්‍රාමීය පළාත්වල වෛද්‍යවරුන් වැඩිදුර අධ්‍යාපනයට සහ පුහුණු සඳහා යොමුවීමේදී නැවත සේවයට පැමිණීමේ යම් ගිවිසුමකට එළැඹීමට අවශ්‍ය පියවර ගතයුතු බව ගරු සභාපතිතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව පස්වරු 2.00ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 දෙසැම්බර් 03**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු විමල් වීරවංශ මහතා (සභාපති)
ගරු දයාසිරි ජයසේකර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ලොහාන් රත්වත්තේ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ප්‍රසන්න රණවීර මහතා (රාජ්‍ය අමාත්‍ය)

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු ගයාෂාන් නවනන්ද මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා

## 1. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

### 1.1 ගරු අසංක නවරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.1.1 කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැටි කර්මාන්ත ගම්මාන නගා සිටුවීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැටි කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීමට ගැටළු පවතින හෙයින් එම ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා මෙම කර්මාන්තය දියුණු කිරීම සඳහා කඩිනම් පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් පැවති බවත්, ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි කර්මාන්තකරුවන්ට මැටි කියුබ් 3 දක්වා ප්‍රවාහනයට අනුමැතිය දී ඇති බව ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මහතා කාරක සභාවට දන්වා සිටින ලදී.

එමෙන්ම මෙම කර්මාන්තකරුවන්ව ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

#### 1.1.2 ප්‍රාදේශිය නව කර්මාන්ත ඇරඹීම

කර්මාන්ත අමාත්‍යාංශය මගින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත යොමු කරන ලද ලිපියක් මගින් දන්වා සිටින ලද නව කර්මාන්ත යෝජනා සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙතින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

ගරු මන්ත්‍රීවරුන්ගෙන් තම ප්‍රදේශවල ඇති අමුද්‍රව්‍ය, ස්වාභාවික සම්පත් සහ වෙනත් සාධක මත ඇරඹිය යුතු නව කර්මාන්ත ව්‍යාපෘති සම්බන්ධ යෝජනා ලබාගැනීම අදාළ ලිපිය යොමුකිරීමෙන් බලාපොරොත්තු වූ බව ගරු සභාපතිවරයා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

එමෙන්ම කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය පුහුණුව හා සමහර තාක්ෂණික සහාය ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් සහ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියෙන් ලබාදීමට කටයුතු කරන බවද ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.1.3 කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙරලියාවල සහ දන්ගස්පිටිය කර්මාන්තපුර

මෙම කර්මාන්තපුරයන්හි ඉඩම් ලබා ගත් සමහර ව්‍යවසායකයින් කර්මාන්ත ස්ථාපිත නොකිරීමේ ගැටළුවක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වයඹ පළාත් ආණ්ඩුකාරවරයා සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.4 කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය සහ වැළඩ ප්‍රදේශයේ පැවති පිඟන් සංස්ථාවට අයත් කර්මාන්තශාලා නැවත ඇරඹීම

මෙම ප්‍රදේශවල පිඟන් සංස්ථාවට අයත් කර්මාන්තශාලා නැවතත් ආරම්භ කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

බිංගිරිය කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කරගෙන යන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වැළඩ කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් අදාළ සභාපතිවරුන් සමඟ සාකච්ඡා කර තීරණයක් ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 1.1.5 පිඟන් සංස්ථාවට අයත් කර්මාන්තශාලා වලින් නිපදවන උළු රජයේ නිවාස වැඩපිළිවෙල සඳහා යොදා ගැනීම

උළු නිෂ්පාදනය කරන අම්පාර, මහියංගණය කර්මාන්තශාලා මගින් නිපදවන උළු රජයේ නිවාස වැඩපිළිවෙල සඳහා යොදා ගන්නා මෙන් ගරු මන්ත්‍රීවරයා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

දැනටමත් මෙම උළු රජයේ අවශ්‍යතා සඳහා යොදා ගන්නා බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 1.2 ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1 මඩකලපුව දිස්ත්‍රික්කයේ අත්යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදන සඳහා වෙළඳපොලක් ලබාදීම

අත්යන්ත්‍ර පේෂකර්ම නිෂ්පාදනය කරන කර්මාන්තශාලා විශාල වශයෙන් ඇති බැවින් නිෂ්පාදන වලට වෙළඳපොලක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

පළාත් සභා අධ්‍යක්ෂවරුන් හරහා එම නිෂ්පාදනයන්හි විස්තර ලබා ගෙන කර්මාන්තයට අවශ්‍ය සහාය ලබාදීමට කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

#### 1.2.2 මඩකලපුව දිස්ත්‍රික්කයේ පොරොතිව්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මන්ඩූර් ප්‍රදේශයේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම.

මෙම ප්‍රදේශයේ දශක ගණනාවකට පෙර ප්‍රසිද්ධ උළු කැට නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවති බවත් ප්‍රදේශයේ ස්වභාවික සම්පතක් ලෙස පවතින මැටි උපයෝගී කරගෙන කර්මාන්තශාලාවක් ඇති කිරීම තුළින් ග්‍රාමීය ආර්ථිකයට ශක්තියක් ලබාදිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

#### 1.2.3 වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ ඇති ස්වභාවික අමුද්‍රව්‍ය මත වෙනත් කර්මාන්ත ශාලා පිහිටුවීම

මෙම ප්‍රදේශයේ පවතින ස්වභාවික සම්පත් අමුද්‍රව්‍ය භාවිතාකර නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කිරීමට පියවර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාව ආශ්‍රිත කලාපය තුළ කඩදාසි කර්මාන්තය හා බැඳුණු විවිධාංගිකරණය වූ වෙනත් කර්මාන්ත ඇති කිරීමට පමණක් මණ්ඩල අනුමැතිය ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

#### 1.2.4 ප්‍රදේශයේ පවතින වැලි උපයෝගී කරගෙන කර්මාන්ත ඇරඹීම

ප්‍රදේශයේ ස්වභාවික සම්පතක් ලෙස පවතින වැලි උපයෝගී කරගෙන වෙනත් අමාත්‍යාංශ සම්බන්ධ කරගෙන හෝ නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කල හැක්කේ පරිසර අමාත්‍යාංශයට බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.3 ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 1.3.1 හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරින්ද ප්‍රදේශයේ පිහිටි වැලි නිධියේ කැණීම් කටයුතු

මෙම වැලි නිධියේ පර්යේෂණ කටයුතු පෞද්ගලික සමාගමක් විසින් සිදු කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන් විරුද්ධ වූ බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම වැලි නිධියේ කැණීම් කටයුතු ලංකා ඛනිජ වැලි සංස්ථාව (LMSL) යටතට ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

#### 1.3.2 හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම නගරයේ පිහිටි පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩම

තිස්සමහාරාම නගරයේ ඇති පේෂකර්ම දෙපාර්තමේන්තුවට අයත් ඉඩමේ පෞද්ගලික ව්‍යාපාර ආයතනයක් පවත්වාගෙන යන හෙයින් රජයේ ඵලදායි

කටයුත්තකට මෙම ඉඩම භාවිතා කර ගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී සාකච්ඡා කිරීම වඩාත් සුදුසු බව ගරු රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා විසින් ගරු මන්ත්‍රීතුමාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.3.3 හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිගල්ල ප්‍රදේශය ආශ්‍රිත ස්වර්ණාභරණ ගම්මාන

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බෙලිගල්ල ආශ්‍රිත ග්‍රාම සේවා වසම් 04 ක ස්වර්ණාභරණ නිෂ්පාදකයන් විසිර සිටින හෙයින් එම පුද්ගලයන් සඳහා අමාත්‍යාංශයෙන් පහසුකම් සැලසීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් සාකච්ඡා කර ඇති බවත් අමාත්‍යාංශයේ ලියාපදිංචි නිපැයුම්කරුවන් සඳහා අඩු පොලී ප්‍රතිශතයකට රුපියල් ලක්ෂ දහයක ණය මුදලක් ලබා දෙන බව රාජ්‍ය අමාත්‍ය ගරු ලොහාන් රත්වත්තේ මහතා කාරක සභාවට දන්වා සිටින ලදී.

අමාත්‍යාංශය සමඟ සම්බන්ධිකරණ කටයුතු කරන ලෙසද එම නිපැයුම්කරුවන් මේ සඳහා යොමු කරන ලෙසද ගරු රාජ්‍ය අමාත්‍යතුමා ගරු මන්ත්‍රීතුමාට උපදෙස් ලබා දෙන ලදී.

### 1.3.4 හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැටි කර්මාන්තය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැටි කර්මාන්තය ආශ්‍රිත සේවා නියුක්තිකයන් වෙත නව තාක්ෂණය හා උපකරණ හඳුන්වාදීම තුළින් අපනයන අභිමුඛ වෙළඳපොල සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

නව තාක්ෂණය සහ නව උපකරණ ලබාදීමේ ඉදිරි වැඩපිළිවෙල යටතේ මේ සඳහා කටයුතු කිරීමේ හැකියාව පවතින බව ගරු රාජ්‍ය අමාත්‍ය ප්‍රසන්න රණවීර මහතා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

ගරු මන්ත්‍රීතුමා විසින් යොමුකරන ලද ගැටළු වලට අදාළ විස්තර ලබාගන්නා මෙන්ද අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කරන මෙන් ද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

## 1.4 ගරු අශෝක ප්‍රියන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1 නාත්තන්ඩිය නගරයේ අත්යන්ත්‍ර පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගිය ඉඩම සහ ගොඩනැගිල්ල භාවිතයට ගැනීම

මෙම ඉඩම සහ ගොඩනැගිල්ල සුදුසු ඵලදායි ව්‍යාපෘතියක් සඳහා යොදාගන්නා මෙන් ගරු මන්ත්‍රීතුමා කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් පළාත් පේෂකර්ම අධ්‍යක්ෂ සමඟ සාකච්ඡා කරන බව රාජ්‍ය අමාත්‍ය ගරු දයාසිරි ජයසේකර මහතා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

පළාත් සභාවේද එකඟතාවය මත සුදුසු කාර්යයක් සඳහා මෙම ඉඩම සහ ගොඩනැගිල්ල භාවිතයට ගත හැකි බව ගරු සභාපතිතුමා විසින්ද කාරක සභාවට දන්වා සිටින ලදී.

## 1.5 ගරු අංගජන් රාමනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.5.1 පරන්තන් රසායනික ද්‍රව්‍ය කම්හල

පරන්තන් රසායනික ද්‍රව්‍ය කම්හල සංවර්ධනය කිරීමේ රජයේ ඉදිරි වැඩපිළිවෙල සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

අක්කර 217 කින් සමන්විත මෙම භූමිය රසායනික කර්මාන්ත කලාපයක් බවට පත්කිරීමට සැලසුමක් සකසා ඇති බවත් පෞද්ගලික අංශයේද සහාය ඇතිව රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.5.2 යාපනය දිස්ත්‍රික්කයේ අලිමංකඩ ලුණු ලේවාය

අලිමංකඩ ලුණු ලේවාය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

වර්තමානයේ “ මාන්තායි සෝල්ට් සමාගම” හා සම්බන්ධ මෙම ආයතනය ඉදිරියේදී ජාතික ලුණු සමාගම ලෙස පවත්වාගෙන යාමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත් ඒ අනුව සංවර්ධන කටයුතුද කරගෙන යන බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.5.3 යාපනය දිස්ත්‍රික්කයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව

කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව සම්බන්ධව රජයේ ඉදිරි වැඩපිළිවෙල පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් විමසීමක් කරන ලදී.

වර්තමානයේ පෞද්ගලික අංශයේ මැදිහත්වීම මත නිෂ්පාදන කටයුතු ඇරඹීම සඳහා නව යෝජනා කිහිපයක් ලැබී ඇති බවද එම යෝජනා සම්බන්ධයෙන් අධ්‍යයනය කර වඩාත් සුදුසු යෝජනාවක් මත ලබන වසරේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන බවද ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.5.4 යාපනය දිස්ත්‍රික්කයේ අච්චුවේලි කාර්මික සංවර්ධන ජනපදයේ ජල හිඟය හා සනීපාරක්ෂක කටයුතු සම්බන්ධ ගැටළු

අච්චුවේලි කාර්මික ජනපදයේ ජල හිඟය හා සනීපාරක්ෂක කටයුතු සම්බන්ධ ගැටළු පවතින හෙයින් ඒ සඳහා විසඳුම් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා කර දෙවන අදියර යටතේ අදාළ කටයුතු ක්‍රියාත්මක කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 1.5.5 අච්චුවේලි කාර්මික සංවර්ධන ජනපදයේ කර්මාන්ත සඳහා විදුලි පරිභෝජනය වෙනුවෙන් සහන ලබාදීම

අච්චුවේලි කාර්මික ජනපදයේ කර්මාන්ත සඳහා විදුලිය වෙනුවෙන් ලබා දී තිබූ 50% සහනාධාරය ලබාදෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා මෙවර අයවැය තුළින් ප්‍රතිපාදන වෙන් කර නොමැති බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

### 1.5.6 අච්චුවේලි කාර්මික සංවර්ධන ජනපදයේ කඩදාසි නිෂ්පාදන කර්මාන්තශාලාව

ප්‍රතිචක්‍රීකරණය කල හැකි කඩදාසි නිපදවනු ලබන කඩදාසි කර්මාන්ත ආයතනයේ (Nobel Paper Factory) වෙනත් විදේශිය නිෂ්පාදිත කඩදාසි ආනයනය මත ගැටළු මතුව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

පවතින ගැටළු සාකච්ඡා කිරිම සඳහා අදාළ කර්මාන්තකරු අමාත්‍යාංශය වෙත සම්බන්ධ කරන මෙන් ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

### 1.5.7 යාපනයේ අච්චුවේලි කාර්මික සංවර්ධන ජනපදයේ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම

නව ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීමට යෝජිතව ඇති හෙයින් කාර්මික ජනපදයේ පවතින ජල ගැටළුව සඳහා විසඳුමක් ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා ගරු රාජ්‍ය අමාත්‍යවරයා සහ ජල සම්පාදන අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

## 1.6 ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1 හිරියාල මැතිවරණ කොට්ඨාශයේ ඇති රෙදී විවීමේ ආයතන

හිරියාල මැතිවරණ කොට්ඨාශයේ ඇති රෙදි විවීමේ ආයතන සක්‍රීය තත්වයට පත්කිරීම සඳහා කටයුතු සලසා දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව වෙතින් ඉල්ලීමක් කරන ලදී.

### 1.6.2 හිරියාල මැතිවරණ කොට්ඨාශයේ මැටි කර්මාන්තය

මැටි ආශ්‍රිත කර්මාන්තවල යෙදී සිටින ගම්මාන වල ජනතාව සඳහා විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කර පහසුකම් සහ සහන සලසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ඉදිරි කාලසීමාවේදී ක්ෂේත්‍ර පරීක්ෂාවක් කර ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ගැටළු සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කරන බව ගරු රාජ්‍ය අමාත්‍ය දයාසිරි ජයසේකර මහතා විසින් කාරක සභාව වෙත දන්වා සිටින ලදී.

**2.** කාරක සභාව ප.ව. 3.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**පළමුවැනි රැස්වීම - 2020 දෙසැම්බර් 04**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (සභාපති)
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු රෝහණ දිසානායක මහතා
ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා

# 1. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

## 1.1 ගරු හේෂා විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.1.1 වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රු.1000 දක්වා වැඩි කිරීම

නිෂ්පාදනය හා සම්බන්ධවන ආකාරයෙන් මෙම වැටුප් ලබාදීම සිදුවිය යුතුය යන අදහස මත මේ සම්බන්ධව දැනට පවත්නා සාමූහික ගිවිසුමක් වශයෙන් කම්කරු වැටුප් පාලනය වීම හෝ අවුට් ග්‍රෝ (out grow) ක්‍රමයකට ලබා දීම සම්බන්ධව අයවැය ලේඛනය සම්මත වූ පසු කම්කරු වෘත්තීය සමිති, හාම්පුතුන්ගේ සංගම් සමඟ සාකච්ඡා කිරීමට යෝජිත බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය වැවිලි සමාගම් මඟින් වරින් වර වතු අතහැර දැමීමත් වෙනත් පාර්ශවයන්ට බදු දීමත් නිසා වැටුප් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීමේ ගැටළු පවතින බව ගරු වඩිවේල් සුරේෂ් මහතා විසින් දැනුම් දෙන ලදී.

## 1.2 ගරු වඩිවේල් සුරේෂ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.2.1 වතු කම්කරු අයිතිවාසිකම් බිඳවැටීම සහ වතු කම්කරුවන්ට රු. 1000 ක වැටුප ලබාදීම

රජයේ වතු 1992 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට බදු දීමෙන් පසු ඇතැම් ආයතන විසින් වරින් වර වතු අතහැර දැමීමත් එම වතු අතුරු බදු ගිවිසුම් මඟින් වෙනත් ආයතන වෙත පැවරීමත් සිදුකර ඇති බව දැනුම් දෙන ලදී. ඒ හේතුවෙන් වතු කම්කරු අයිතිවාසිකම් බිඳ වැටෙන අතර ඇතැම් විට මානව අයිතිවාසිකම් උල්ලංඝණයවීම් පවා සිදුවන බවද දැනුම් දෙන ලදී.

රජයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කර ඇති අවධියක වතු හිමියන්ට ඒ පිළිබඳ වගකීම් හා වියදම් අවම වී ඇති බැවින් ඔවුන්ට මෙම රු. 1000 ක වැටුප ලබාදීම කළ හැක්කක් බව ගරු මන්ත්‍රීතුමා පැවසීය.

## 1.3 ගරු ජගත් පුෂ්පකුමාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.3.1 රජය වතු කළමණාකාරීත්වය සමඟ ඇති කර ගත් ගිවිසුම් සම්බන්ධ යෝජනා

රජය වතු කළමණාකාරීත්වය සමඟ ඇති කර ගත් මුල් ගිවිසුම් බිඳ දැමීම සම්බන්ධව සොයා බැලීම සඳහා කම්කරු, වැවිලි කර්මාන්ත හා මුදල් යන අමාත්‍යාංශ සමඟ සාමූහික සාකච්ඡාවක් පැවැත්විය යුතු යැයි ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

### 1.3.2 අර්ධ රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීම්, පත් කිරීම්, මාරු කිරීම් හා උසස් කිරීම්

දේශපාලනික වෙනස්වීම් හෝ බලපෑම් මත ශ්‍රී ලංගම වැනි අර්ධ රජයේ ආයතනවලට කරන ඇතැම් බඳවා ගැනීම්, උසස් කිරීම් හා මාරු කිරීම් සිදුවීම් වැළැක්වීමට කටයුතු කළ යුතු යැයි ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කළේය.

මේ සම්බන්ධව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

### 1.3.3 විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සිදු වී ඇතැයි වාර්තා වූ වංචා දූෂණ සොයා බැලීමේ ක්‍රියාවලිය

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සිදු වී තිබෙන අක්‍රමිකතා පිළිබඳ සොයා බැලීමට අභ්‍යන්තර කමිටුවක් පත් කළ බවත් එහි පළමු වාර්තාව ගරු රාජ්‍ය අමාත්‍යවරයාට භාර දී ඇති බවත් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති, කමල් රත්වත්තේ මහතා විසින් දැනුම් දෙන ලදී. මෙහි දෙවැනි කොටස ද බාර දීමට සූදානම් බවද දැනුම් දෙන ලදී.

### 1.3.4 විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් යොමු කිරීමේ දී නියෝජිතායතන විසින් විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත කරනු ලබන කොමිස් ගෙවීම්

විදේශගතවීමකදී විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විදේශ නියෝජිතායතනවලින් ගාස්තු අය කිරිමේ ක්‍රම, විදේශගතවන තැනැත්තා විදේශගත වීමකදී අය කරන ගාස්තු, රැකියා නියෝජිතායතන හරහා විදේශගත වීමකදී අය කරන ගාස්තු සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට විවිධ අවස්ථාවන්හිදී ලැබෙන ගාස්තු පිලිබඳව අතිරේක සාමාන්‍යාධිකාරී, ඩී. ඩී. පී. සේනානායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී

විදේශ නියෝජිතායතන සමඟ පැවැත්වූ සාකච්ඡාවකදී මැදපෙරදිග රටවල් සඳහා ගෘහ සේවිකාවන් සැපයීමෙන් එක් අයෙක් සඳහා රු.1,000,000ක මුදලක් නියෝජිතයන්ට ලැබෙන බව අනාවරනය වූ අතර ගෘහ සේවිකාවන් සඳහා එහි වාසිය නැවත ගලා යන ක්‍රමවේදයක් ඇත්දැයි ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

කාර්යාංශයේ නිළධාරීන්ගේ අවංකභාවය පිළිබඳව විමසිලිමත්ව කටයුතු කරන බවත් ගුවන්තොටුපළ රාජකාරී නිසි ආකාරයෙන් සිදු නොවන බැවින් හමුදාව යෙදවීමේ අවශ්‍යතාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.4 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.4.1 රාජ්‍ය දේපළ පෞද්ගලිකරණය කිරීම ඔස්සේ ඇති වී තිබෙන අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය සහ පීඩාවට පත්වන කම්කරුවන්හට පැමිණිලිවලට අවධානය යොමු කිරීමට ක්‍රමවේදයක් සෑදීම

මෙම කරුණු ගැන විශේෂ අවධානයක් යොමු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 1.4.2 වතු ජනතාව පිළිබඳ පරීක්ෂා කිරීමට මෑත කාලයේදී රාජ්‍ය සේවයට බඳවා ගත් උපාධිධාරීන් යෙදවීම

මෙම කරුණු ගැන විශේෂ අවධානයක් යොමු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 1.5 ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා විසින් කරන ලද යෝජනා

### 1.5.1 වතු සංස්කෘතිය වෙනස් කිරීම

මෙතෙක් පැවති වතු සංස්කෘතිය වෙනස් කර වතු අධිකාරීවරුන් විසින් වතු ජනතාව අනවශ්‍ය ආකාරයට පාලනය කිරීම මැඩ පවත්වා දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල මෙන් ග්‍රාම සේවා නිලධාරී වැනි රාජ්‍ය නිළධාරීන්ගේ ඍජු පාලනයට මැදිහත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 1.5.2 නුවරඑළිය හා හැටන් කම්කරු කාර්යාල ගොඩනැඟිලි

කම්කරු කාර්යාලය සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කම්කරු කොමසාරිස්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

හැටන් කම්කරු කාර්යාලය ලබන වසරේ අප්‍රේල් මාසය වන විට සම්පූර්ණ කරන බව ද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 1.6 ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 1.6.1 කෝවිඩ් වසංගත රෝගී තත්ත්වය නිසා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග

ශ්‍රී ලකාවට නැවත පැමිණීමට අපේක්ෂිත විදේශගතවූවන් 46000ක් අතරින් 16000ක් මේවන විට ගෙන්වා තිබෙන බවත් නිරෝධායනය කිරීමේ දුෂ්කරතා, පී.සී.ආර්. පරීක්ෂණ සිදු කිරීමේ දුෂ්කරතා හා ගුවන් ගමන් වාර ගණනේ සීමාවන් වැනි කරුණු මෙම ක්‍රියාවලියට බලපාන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. ඉදිරි මාස කිහිපය තුළ සියළු ශ්‍රමිකයන් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව ද දැනුම් දෙන ලදී.

විශේෂ හෝ හදිසි අවශ්‍යතා මත ගෙන්වා ගැනීම් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන බව ද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා විසින් දැනුම් දෙන ලදී.

### 1.6.2 දෙනියාය වතු කම්කරුවන් සඳහා මොරවක කම්කරු කාර්යාල මඟින් සිදු කරන සේවාව

මෙම ප්‍රදේශයේ කම්කරු කාර්යාලයෙන් සිදුවන සේවාව අතෘප්තිකර බවත් එම කාර්යාලය පෞද්ගලික ස්ථානයක පවත්වාගෙන යාම හා දමිළ භාෂාව කතා කරන එකදු නිළධාරියකු කාර්යාලයේ සේවයේ නිරත නොවීම යන කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කම්කරු කාර්යාලයට නව ගොඩනැඟිල්ලක් සඳහා 2021 වර්ෂයේ ප්‍රතිපාදන ප්‍රමුඛතාවය ලබාදීමට හා දමිළ භාෂාව කතාකරන කම්කරු කොමසාරිස්වරයෙකුට එම කාර්යාලයට ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට උපදෙස් ලබා දෙන ලදී.

**2.** කාරක සභාව ප.ව. 3.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

-----------------------------------------------------------------------------------------------

**වෙළෙඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 10**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (සභාපති)
ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු රෝහණ දිසානායක මහතා
ගරු නලින් ප්‍රනාන්දු මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු අනුප පස්කුවල් මහතා

**1.** අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා ක්‍රමය වඩා ඵලදායි සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවය ගරු සභාපතිතුමා විසින් අවධාරණය කරන ලද අතර එම කර්තව්‍යය සිදුකල යුතු අකාරය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා විසින් ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

දීර්ඝ කාලක සිට පවතින අවශ්‍යතාවයක් වන ජාතික වෙළඳ ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා විද්වත් කමිටුවක් පත්කර ඇති බවත් එම කමිටුවෙන් මේ දක්වා සිදුකරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සමූපකාර ව්‍යාපාරය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහාද විද්වත් කමිටුවක් පත්කර ඇති බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගි
යවන්න මහතා සහ ගරු රෝහණ දිසානායක මහතා ද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

**2.** **වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තාවලට කාරක සභාව එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, වෙළෙඳ අමාත්‍ය සහ කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා විසින් 2021 මාර්තු මස 26 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදී.

**2.1** 2017 වර්ෂය සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වාර්ෂික වාර්තාව
**2.2** 2016 වර්ෂය සඳහා ලංකා සතොස ආයතනයේ වාර්ෂික වාර්තාව

**2.3** 2017 වර්ෂය සඳහා ලංකා සතොස ආයතනයේ වාර්ෂික වාර්තාව
**2.4** 2017-2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව
**2.5** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**2.6** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**2.7** 2018 වර්ෂය සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තාව හා ගිණුම්
**2.8** 2019 වර්ෂය සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
**2.9** 2015 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
**2.10** 2016 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

## 3. 2020.12.01 දින පැවති රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු

**3.1 උතුරු පළාත් සමුපකාර පුහුණු මධ්‍යස්ථානය නැවත ලබා ගැනීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**
(2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.6.2)

කාරක සභාව විසින් මෙම කරුණ සලකා බලන ලදී.

**3.2 වෙන්නප්පුව සමුපකාර සමිතියේ අධ්‍යක්ෂ ධුරය පිළිබඳව ගැටළුව - ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.7)

කාරක සභාව විසින් මෙම කරුණ සලකා බලන ලදී.

**3.3 රුවන්වැල්ල සමුපකාර සමිතිය යළි නඟා සිටුවීම - ගරු සුදත් මංජුල මහතා**
(2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.8)

කාරක සභාව විසින් මෙම කරුණ සලකා බලන ලදී.

**3.4 හිඟුරක්ගොඩ වෙළඳ සංකීර්ණය සහ වී මෝල දියුණු කිරීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**
(2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.9)

කාරක සභාව විසින් මෙම කරුණ සලකා බලන ලදී.

## 4. අමාත්‍යාංශයීය කටයුතු පිළිබඳ සාකච්ඡාව

### 4.1 ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.1.1 මාතලේ අළුවිහාරේ ප්‍රදේශයේ පැවති සතොස වෙළඳ සැල වසා දැමීම

මෙම වෙළඳසැල වසා දැමීමට කටයුතු නොකරන බවත් එය උකුවෙල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට කටයුතු කරන බවත් සතොස සභාපති විසින් දන්වා සිටින ලදී.

මූල්‍ය අක්‍රමිකතාවයන් නිසා පාඩු ලබන තත්වයට පත්වී ඇති ලංකා සතොස ආයතනය නැවත ලාභ ලබන තත්වයට පත්කිරීම සඳහා පියවර රාශියක් ගෙන ඇති බවත් සතොස ආයතනය සම්බන්ධයෙන් ‍වෝහාරික විගණනයක් සිදු කෙරමින් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මූල්‍ය අක්‍රමිකතා නැති කිරීමේ මූලික පියවර වශයෙන් ලංකා සතොස ගබඩා සහ ශාඛාවන් පරිගණක ගත කිරීමට පියවර ගෙන ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 4.2 ගරු නලීන් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.2.1 ලංකා සතොස වෙළඳ සැල් සඳහා ගොඩනැගිලි තෝරාගැනීම

ලංකා සතොස වෙළඳ සැල් පිහිටුවීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් දීර්ඝ පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

වර්තමානයට ගැළපෙන අයුරින් සතොස අලෙවි ශාඛා ජාලය වෙනස් වියයුතු බවත්, කුඩා අලෙවිසැල් වෙනුවට විශාල ශාඛා ආරම්භ කළයුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා රජයේ ආයතන වලට අයත් භාවිතා නොකරන ඉඩම් ලංකා සතොස අලෙවි ශාඛා ගොඩනැගිලි සෑදීම සඳහා යොදා ගත හැකි බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙගා සතොස නමින් නව සංකල්පයකට අනුව අඩු පිරිවැයක් සහිතව ප්‍රධාන නගර වල ඇති ලංකා සතොස අලෙවිසැල් වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

## 4.3 ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.3.1 පොළොන්නරුව බකමූණ නගරයේ පවතින සතොස අලෙවිසැල

පොළොන්නරුව බකමූණ නගරයේ තිබෙන සතොස අලෙවිසැල පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් එම ගොඩනැගිල්ල ආපසු ඉල්ලා ඇති බැවින් සමූපකාර දෙපාර්තමේන්තුවට අයත් දැනට භාවිතා නොකරන ගොඩනැගිල්ල ඒ සඳහා යොදාගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කඳුරුවෙල නගරයේ තිබෙන ශාඛාව නුසුදුසු ස්ථානයක පිහිටුවීම නිසා එය වසා දැමීමට සිදුවූ බවත්, එම ශාඛාව නැවත විවෘත කරදීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ශාඛාවක් පොළොන්නරුවට ලබාදෙන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලා සිටින ලදී.

## 5. කාරක සභාව පස්වරු 3.00 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදි.

---

**වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 23**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (සභාපති)
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු ජානක වක්කුඹුර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු කනක හේරත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජයන්ත සමරවීර මහතා
ගරු රොෂාන් රණසිංහ මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු කපිල අතුකෝරල මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු එම්. උදයකුමාර් මහතා
ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු සුදත් මංජුල මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු මධුර විතානගේ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

සලකා බැලීමෙන් අනතුරුව, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තාවලට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**1.1** 2017 වර්ෂය සඳහා සී/ස හලාවත වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව
**1.2** 2018 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව
**1.3** 2018 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.4** 2018 වර්ෂය සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව
**1.5** 2018 වර්ෂය සඳහා පොල් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**1.6** 2018 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**1.7** 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ වාර්ෂික වාර්තාව

**2. පසුගිය රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු**

**2.1 පොල් ඉඩම් කට්ටි කිරීම හා රබර් ඉඩම්වල රබර් ගස් හෙළීම සම්බන්ධව නීතිය විධිමත් වීම- ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

පොල් ගසට අමතරව කිතුල් ගස සහ තල් ගස ආහාර පනතට ඇතුළත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

මාතර දිස්ත්‍රික්කයේද මෙම පොල් ඉඩම් කැබලි කිරීම විශාල ගැටලුවක් වී ඇති බවත් මෙම පනත සංශෝධනය කරන තෙක් ගැසට් පත්‍රයක් මගින් හෝ මෙය නවත්වන මෙන් ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

පොල් හෙක්ටයාර එකකට වඩා වැඩි ඉඩම් කැබලි කිරීම සඳහා තේ, රබර් සහ පොල් වතු කැබලි කිරීමේ පාලන මණ්ඩලයේ අවසරය අවශ්‍ය වන ලෙස 1958 අංක 2 දරන තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීම පාලන) පනත සඳහා ගෙන එන ලද සංශෝධන මේ වන විටත් ගරු නීතිපතිතුමා වෙත යොමුකර ඇති බවත් මේ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණු පසු ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

පොල් ගස, ගස් හෙළීමේ පනතට ඇතුළත් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

ඉඩම් කැබලි කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන විවිධාකාරයේ අනුනීති සහ රෙගුලාසි සාදන බැවින් මේ පිළිබඳ වගකීම එක් ආයතනයකට ලබා දීමට කටයුතු කරන ලෙස ගරු රෝහණ දිසානායක මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

**2.2 ගුඩ්සයිඩ් වත්ත, මැදදුම්බර ප්‍රදේශයේ අපනයන ගම්මානයක් ඇති කිරීම - ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා**

මෙම කරුණ පිළිබඳව ගරු මන්ත්‍රීතුමා වෙත පිළිතුරු යවා ඇති බව දැනුම් දෙන ලදී.

**2.3 මහනුවර නාථ දේවාල ඉඩම් පුස්සැල්ලාව වතු සමාගමෙන් ඉවත් කර ගැනීම - ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා**

මෙම කරුණ සම්බන්ධයෙන් මේ වන විටත් පිළිතුරක් ගරු මන්ත්‍රීතුමා වෙත යවා ඇති බවත් රජය සහ එම වැවිලි සමාගම අතර නඩු කටයුත්තක් පවතින බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.4 ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගමෙහි පුද්ගලික අංශයේ ආයෝජනය හා ලාභාංශ පිළිබඳ සහ රජයට ලැබිය යුතු මුදල් නොලැබීයාම - ගරු මධුර විතානගේ මහතා**

ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමා විසින් ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගමෙහි පුද්ගලික අංශයේ ආයෝජනය, රජයට ලැබිය යුතු මුදල් නොලැබීයාම පිළිබඳව සහ එම සමාගමේ අවිධිමත් ක්‍රියාකලාපය පිළිබඳ දීර්ඝ කරුණු දැක්වීමක් සිදුකරන ලදී.

අමාත්‍යාංශයේ මැදිහත් වීම මත මෙම ආයතනය සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග සහ නියාමනය පිළිබඳ දැඩි පසුවිපරමක් සිදුකරන බවත් රාජ්‍ය අමාත්‍යාංශය හරහා රජයේ දායකත්වය වෙනුවෙන් ලැබිය යුතු ලාභාංශ හා මෙම ආයතනය විධිමත් ආකාරයෙන් පවත්වා ගෙන යාම සඳහා කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ගල්ඔය වැව්ලි (පුද්ගලික) සමාගමෙහි පුද්ගලික අංශයේ ආයෝජනය පිළිබඳ විගණනයක් සිදුකළ යුතු බව ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා විසින් යෝජනා කළ අතර, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා විසින් මෙම කරුණ පාර්ලිමේන්තු පසු අධීක්ෂණ කමිටුවල අවධානයට යොමු වන්නේ නම් වඩාත් සුදුසු බව යෝජනා කරන ලදී.

**3. ගරු මන්ත්‍රීවරුන්ගේ ලිඛිත යෝජනා**

**3.1 හලාවත වැව්ලි සමාගමට අයත් කිනියම වත්තෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරපොකුණ ප්‍රදේශයේ පොදු කටයුතු සඳහා අක්කර 02 ක ඉඩම් කොටසක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම - ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 95)**

මෙම යෝජනාව සඳහා වන පිළිතුරු වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**4. වෙනත් කටයුතු**

**4.1 ශාන්ත බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**4.1.1 අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ක්‍රමවේදය කඩිනම් කිරීම පිළිබඳව**

දැනට පවතින නීතිමය තත්වය අනුව අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ක්‍රියාවලියට අවම වශයෙන් මාස හයක පමණ කාලයක් ගත වන බැවින් අනතුරුදායක ගස් ඉවත් කිරීම කඩිනම් කල හැකි ක්‍රමවේදයක් හඳුන්වා දීම වඩාත් යෝග්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් අවධාරණය කරන ලදී.

අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා අවසරය එම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයාගෙන් ලබාගත හැකි වන පරිදි අදාළ නීතිමය ප්‍රතිපාදන සංශෝධනය කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.2 ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.2.1 හැඳලි වතුයායෙන් උද්භිද උද්‍යානයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් ලබා ගැනීම

රක්වාන ආසනයේ දෙනියාය මාර්ගයේ තිබෙන හැඳලි වතුයායෙන් අක්කර 100ක් උද්භිද උද්‍යානයක් ඉදි කිරීම සඳහා ලබා ගැනීමට කරන ලද ඉල්ලීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

මෙම ඉල්ලීම සඳහා අදාළ වතු සමාගම එකඟතාවය පළකිරීමෙන් අනතුරුව අමාත්‍යාංශයට මැදිහත් වීමක් සිදු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමියට දන්වා සිටි අතර ඉදිරියේදී මේ සම්බන්ධව පිළිතුරක් ගරු මන්ත්‍රීතුමියට ලබා දෙන ලෙස වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂක වෙත දන්වා සිටින ලදී.

## 4.3 ගරු සම්පත් අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.3.1 ඇල්පිටිය වතු සමාගමෙන් ඉඩම් ප්‍රමාණයක් ලබා ගැනීම සම්බන්ධව

ගිංගඟ පාලන ව්‍යාපෘතිය නිසා ඉඩම් හා නිවාස අහිමි වන පුද්ගලයන් හට ඇල්පිටිය වතු සමාගමෙන් අක්කර 400ක පමණ ඉඩම් ප්‍රමාණයක් ලබා ගැනීමට ගාල්ල දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී යෝජනාවක් සම්මත වූ බැවින් එම කරුණ සම්බන්ධීකරණය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.3.2 වැවිලි සමාගම්වලට අයත් ඉඩම්වල ජීවත්වන ජනතාව මුහුණපාන දුෂ්කරතා පිළිබඳව

ඇල්පිටිය සහ වටවල වැවිලි සමාගම් වලට අයත් ඉඩම්වල එම ඉඩම් වැවිලි සමාගම් වලට අයිති වීමට පෙර ජීවත්වූ ජනතාව ඔවුන්ගේ දෛනික කටයුතු කරගෙන යාමේ දී විවිධ දුෂ්කරතාවලට මුහුණ පාන බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

වැවිලි සමාගම් එකඟතාවය පළ කරන ඉඩම්වල අයිතිය එම පදිංචිකරුවන්ට ලබාදීමට කටයුතු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 4.3.3 අතිරික්ත ඉඟුරු එලදාව මිලදී ගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳව

නෙළුව ඇතුළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3ක කිලෝග්‍රෑම් 8000 කට ආසන්න විශාල ඉඟුරු එලදාවක් ලැබී තිබෙන බැවින් එය මිලදී ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.4 ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.4.1 වැවිලි සමාගම්වලට අයත් ඌණ උපයෝජන ඉඩම් රජයට පවරා ගැනීම

මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර නගර සංවර්ධන සැලැස්ම සඳහා වැවිලි සමාගමෙන් අක්කර 5ක ඉඩම් කොටසක් ලබා ගැනීමට අවුරුදු 20ක් ගතවී ඇති නමුත් එය විසඳී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සම්බන්ධීකරණය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම වැව්ලි සමාගම් සමඟ පවතින බදු ගිවිසුම් සඳහා මැදිහත්වීමක් සිදු කිරීමට අමාත්‍යාංශයට නෛතික බලයක් නොමැති බැවින් එය බලාත්මක කිරීමට නව පනතක් මේ වන විට සම්පාදනය කරමින් පවතින බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 4.4.2 මාතර දිස්ත්‍රික්කයේ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් ආශ්‍රිත ගැටලු

මාතර දිස්ත්‍රික්කයේ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ට නැවත තේ වගාව සඳහා ලබාදෙන සහනාධාරය ප්‍රමාණවත් නොවන බවත් මීළඟ දළු මුරය නෙලන තෙක් කුඩා තේ වතු හිමියන්ට සහනාධාරයක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ට නැවත වගාව සඳහා ලබාදෙන සහනාධාරය හෙක්ටයාරයකට ලක්ෂ 7.5 දක්වා වැඩි කිරීමට තීරණය කර ඇති බවත් කුඩා තේ වතු හිමියන්ට අක්කර භාගයකට රුපියල් පන්දාහක දීමනාවක් මාස 24 ක කාලයක් සඳහා ලබා දීමට යෝජනා කර කැබිනට් පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලය වෙත යොමුකර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම සහනාධාරය අක්කර භාගයකට රුපියල් 5000 වෙනුවට රුපියල් 10,000 දක්වා වැඩි කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.5 ගරු සිසිර ජයකොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.5.1 දේශීය ඖෂධ වර්ග වගා කිරීමට අවශ්‍ය සහය ලබා දෙන ලෙස ඉල්ලීම

අප රටේ ඇති දේශීය ඖෂධ වර්ග වලට ලෝකයේ විශාල ඉල්ලුමක් ඇති වී තිබෙන කාලයක අපනයන ක්ෂේත්‍රයේ පිබිදීමක් ඇති කිරීම සඳහා දේශීය ඖෂධ වර්ග මෙරට තුළ වගා කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

## 4.6 ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.6.1 වයඹ විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයක් ඉදි කිරීමට ඉඩමක් ලබා ගැනීම

කුලියාපිටිය ප්‍රදේශයේ පිහිටා ඇති වයඹ විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ඉදි කිරීමට අක්කර 12 ක ඉඩමක් අවශ්‍යව ඇති බැවින් කුරුණෑගල වැව්ලි සමාගමට අයත් ඉඩමකින් එම භූමි ප්‍රමාණය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉඩම දැනටමත් වෙඩි බෙහෙත් ගබඩාවක් පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට ලබා දී ඇති බව කුරුණෑගල වැව්ලි සමාගමේ සභාපතිනිය විසින් දැනුම් දෙන ලදී.

## 4.7 ගරු කපිල අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.7.1 කන්තලේ සීනි කර්මාන්තායතනයේ සේවය කරන සේවකයින් හට ලබා දෙන ඉඩම් කොටස් පිළිබඳව

කැබිනට් මණ්ඩල තීන්දුවකට අනුව කන්තලේ සීනි කර්මාන්තායතනයේ නිල නිවාස වල පදිංචි වී සිටින සේවකයින් හට ජීවත්වීමට එම ප්‍රදේශයෙන් ඉඩම් කොටසක් ලබාදීමට තීරණය කර තිබුණද මෙතෙක් එය සිදුවී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරවන ලදී.

### 4.7.2 කන්තලේ සීනි කර්මාන්තායතනය නැවත ආරම්භ කිරීම

කන්තලේ සීනි කර්මාන්තශාලාව ආරම්භ කිරීමට බලාපොරොත්තු වන කාලය සහ එසේ ආරම්භ කිරීමට ඇති බාධාවන් කවරේද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම කර්මාන්තායතනය එම්. ජී. ෂුගර් නම් පෞද්ගලික ආයතනයකට ගිවිසුමකට අනුව බදු දී ඇති බවත් බේරුම්කරණයේදී මෙම ආයතනයට වන්දියක් ගෙවීමට සිදුවී ඇති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.7.3 උක් වගා කිරීමට නොහැකි ඉඩම් වී වගා කිරීම සඳහා ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම

කන්තලේ සීනි කර්මාන්තායතනයට අයත් වගා කිරීමට හැකි ඉඩම් අතරින් උක් වගා කිරීමට නොහැකි අක්කර 300ක් 400ක් පමණ ඉඩම් එම ප්‍රදේශයේ ජනතාවට වී වගා කිරීමට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් සිදුකරන ලදී.

එම්.ජී. ෂුගර් සමාගම 2016 වසරේදී ඇති කරගෙන තිබෙන ගිවිසුමට අනුව මෙම ඉඩම් වල වී වගා කිරීමට අවසර නොලැබෙන බවත් එම සමාගම සමඟ එකඟතාවයකට පැමිණ මෙම වසර තුළ මෙම ප්‍රශ්නය විසඳා ගත හැකි බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.7.4 ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පවත්වන ලද පොල් පැළ බෙදාදීමේ වැඩසටහන්

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය තුළ පොල් සංවර්ධන මණ්ඩලය විසින් පොල් පැළ බෙදාදීමේ වැඩසටහන් කීපයක් පවත්වා ඇති නමුත් එකී දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති ලෙස තමන් මේ පිළිබඳව දැනුවත් වී නොමැති වී බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙය නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් සිදුකළ යුතු බවට ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී.

## 4.8 ගරු රොෂාන් රණසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.8.1 පොල් පැළ ලබා ගැනීම

පොළොන්නරුව ප්‍රදේශය සඳහා මේ කාලයේදී වර්ෂාව නොලැබෙන බැවින් පොල් පැළ ලබාදීම ප්‍රායෝගික නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එළැඹෙන සැප්තැම්බර් මාසයේදී පවුල් 10000කට අවශ්‍ය පොල්පැළ ලබාදීමට ඇති හැකියාව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් සිදු කරන ලදී.

### 4.8.2 පොල් සංවර්ධන මණ්ඩලයේ පොල් පැළ තබා ගැනීමට ස්ථානයක් ලබා දීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොල් සංවර්ධන මණ්ඩලයේ පොල් පැළ තබා ගැනීමට ස්ථානයක් නොමැති බැවින් ඒ සඳහා භූමියක් වෙන් කර දිය හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ස්ථානය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දිය හැකිද යන්න පිළිබඳව ද විමසීමක් කරන ලදී.

### 4.8.3 අපනයන කෘෂිකර්ම බෝග වගා කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

අපනයන කෘෂිකර්මාන්තය නගා සිටුවීම සඳහා කහ, ඉඟුරු, ගම්මිරිස් වැනි වගාවන් සඳහා වැඩි අවධානයක් යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සැප්තැම්බර් මාසයන්හිදී මේ සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ඇති හැකියාව පිළිබඳව ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් සිදු කරන ලදී.

## 4.9 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.9.1 වැලිකඩමුල්ල පැළ තවානේ දෛනිකව වැටුප් ලබන සේවකයින් ස්ථිර කිරීම

ගම්පහ වැලිකඩමුල්ල පැළ තවානෙහි දෛනික වැටුප් ලබන (check roll පදනම) 40- 50 ක් පමණ සේවකයින් සේවයේ ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් සිදු කරන ලදී.

### 4.9.2 අත්තනගල්ල ප්‍රදේශය සඳහා තේ ක්ෂේත්‍ර නිලධාරියෙකුගේ අවශ්‍යතාවය

අත්තනගල්ල, ඌරාපොල සහ රුවන්වැල්ල යන ප්‍රදේශ වල තේ වගාව සඳහා ක්ෂෙත්‍ර නිලධාරියෙක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සඳහා අලුතින් බඳවාගත් නිලධාරින්ගෙන් එක් නිලධාරියෙක් මෙම ප්‍රදේශය ආවරණය කිරීම සඳහා යොදවන ලෙස ගරු සභාපතිතුමා විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත දැනුම් දෙන ලදී.

### 4.9.3 කුරුඳු වගාව සඳහා අවශ්‍ය පුහුණුව ලබා දෙන ලෙස ඉල්ලීම

අත්තනගල්ල ප්‍රදේශයේ මේ වන විට සාර්ථකව කුරුඳු වගාව සිදුකරගෙන යන නමුත් කුරුඳු තැලීමට සහ කුරුඳු වෙළඳපොළ සකස් කර ගැනීමට දැනුමක් ඇති පුද්ගලයින් එම ප්‍රදේශයේ හිඟ බැවින් කුරුඳු වගාව සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් සිදු කරන ලදී.

### 4.9.4 පොල් පැළ තවාන් වල දෙමුහුම් පොල් පැළ වල හිඟකම

කිරිදිවැල සහ ගම්පහ පොල්පැළ තවාන් වල අවශ්‍ය ප්‍රමාණයට පොල්පැළ නොමැති බැවින් දෙමුහුම් පොල්පැළ ලබාදීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානය යොමු කරන ලදී.

## 4.10 ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.10.1 පොල් වගාව සම්බන්ධ ආයතන තුන ඒකාබද්ධ කිරීම පිළිබඳව

පොල් පර්යේෂණායතනය, පොල් සංවර්ධන මණ්ඩලය සහ පොල් වගා කිරීමේ මණ්ඩලය යන ආයතන වෙනුවට තනි ආයතනයක් පිහිටුවීමට රජය තීරණයකට එළැඹී ඇත්ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම ආයතන තුන පොල් වගාව සම්බන්ධයෙන් එකිනෙකට වෙනස් එහෙත් එකිනෙකට සම්බන්ධ කරුණු රාශියක් ඉටු කරන බැවින් එම ආයතන තුනෙහි පරිපාලන ව්‍යුහය එක් පරිපාලන යාන්ත්‍රණයකින් සිදුවීම එහි කටයුතු වලට පහසුවක් වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.10.2 අමාත්‍යාංශය යටතේ ඇති පර්යේෂණායතන

වැවිලි අමාත්‍යාංශය යටතේ ඇති පොල්, තේ, රබර්, උක් සහ තල් පර්යේෂණායතන පිළිබඳ රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් සිදු කරන ලදී.

විද්‍යාඥයින් හා පර්යේෂකයින් මෙම ආයතන හැරයාම නිසා පොල්, තේ, රබර්, උක් සහ තල් පර්යේෂණායතන සියල්ලම විශ්වවිද්‍යාල මට්ටමට ගෙන ඒමට රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබෙන බව ගරු අරුන්දික ප්‍රනාන්දු රාජ්‍ය අමාත්‍යතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.11 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.11.1 යාපනය නෙඩුන්තීවු දූපතෙහි පොල් සහ රටඉඳි වගා කිරීමට අවශ්‍ය සහාය

යාපනය දිස්ත්‍රික්කයට අයත් නෙඩුන්තීවු දූපතෙහි පොල්, තල් සහ වර්ෂ පහකින් ඵල නෙලා ගතහැකි රටඉඳි නව ප්‍රභේද වගාකිරීම සම්බන්ධ ව්‍යාපෘතියක් සකසන ලෙසත්, ගරු සභාපතිතුමාට එම ප්‍රදේශ වල සංචාරය කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නෙඩුන්තීවු දූපතෙහි පොල් සහ තල් වගා කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දිය හැකි බවත් රටඉදි වගාව සඳහා බීජ සහ පැළ ලබා ගැනීමේදී ගැටලුවක් පවතින බැවින් එය සඳහා විසඳුමක් තිබේදැයි ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

රටඉදි පැළ ඉන්දියාවෙන් ගෙන්වාගත හැකි බවත් දැනටමත් නැගෙනහිර පළාතේ රටඉදි සාර්ථකව වගාකර එළ නෙලාගනිමින් තිබෙන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ලදී.

පොල් පර්යේෂණායතනයේ සභාපතිතුමාට සහ තල් සංවර්ධන අධිකාරියේ සභාපතිතුමාටත් මීළඟ රැස්වීමට පැමිණෙන විට රටඉදි පැළ ලබාගතහැකි ක්‍රමවේදය පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා සිටින ලදී.

### 4.11.2 තල් නිෂ්පාදනය සම්බන්ධ සමුපකාර සමිති වල නිලවරණ පැවැත්වීම පිළිබඳව

කිලිනොච්චියේ තල් නිෂ්පාදන හා සම්බන්ධ සමුපකාර සමිති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දේශපාලන මැදිහත්වීම් සිදුවන බැවින් නිලවරණයක් පවත්වා නව සාමාජිකයින් පත්කර එම සමිති අලුතින් පිහිටුවීම සඳහා අවධානය යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

තල් හා සම්බන්ධ සමුපකාර සමිති මගින් තල් රා ස්කාගාර ක්‍රියාත්මක වන අතර මෙම සමුපකාර සමිති සම්බන්ධ නිලවරණ පැවැත්වීමේදී ව්‍යවස්ථාවෙන්ම තල් සංවර්ධන අධිකාරියට ද යම් බලයක් හිමි වී තිබෙන බැවින් එම අධිකාරියේ මැදිහත්වීම මත නිලවරණ පැවැත්වීම සිදු කරන බව ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් සඳහන් කරන ලදී.

තවද තල් ආශ්‍රිත නිෂ්පාදන හා රා කර්මාන්තය දියුණු කිරීම සඳහා අවශ්‍ය සියලුම සහාය ලබා දීමට කටයුතු කරන බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

### 4.11.3 පලෙයි ප්‍රදේශයේ පොල් වගාව සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම

යාපනය දිස්ත්‍රික්කයේ පලෙයි ප්‍රදේශයේ පොල් වගා කිරීමේ මණ්ඩලය සතු සරුසාර පොල් ඉඩමෙහි පදිංචි ජනතාව එම ඉඩම ඉදිරිපිට තිබෙන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමෙන් කොටසක් ලබා දී පදිංචි කරවීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදිය හැකිද යන්න පිළිබඳව ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් විමසීමක් කරන ලදී.

ඉඩම් හිමියන් හමුවී ඔවුන්ගේ ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කර ඉඩම් හිමිකම් පිළිබඳ ලේඛණ පරිශීලනය කර සත්‍ය තත්වය පැහැදිලි කරදීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

## 4.12 ගරු සුදර්ශන දෙනිපිටිය මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.12.1 ජල පෝෂිත ප්‍රදේශ රැකගැනීම

තේ වතු ආශ්‍රිත බදුල්ල දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජල පෝෂිත ප්‍රදේශ රැකගැනීම සඳහා ක්‍රමවේදයක් අත්‍යවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාව හමුවේ ප්‍රකාශ කරන ලදී.

### 4.12.2 මාර්ග සංවර්ධනයේදී වතු සමාගම් වලට අයත් ඉඩම් ලබා ගැනීමේ අපහසුව

මාර්ග කාපට් කිරීමේ දී වතු සමාගම් වලට අයත් ඉඩම් ලබා ගැනීම සඳහා වතු සමාගම් වල අනුමැතිය ලබාගැනීම දීර්ඝකාලීන ක්‍රියාවලියක් වන බැවින් ඒ සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරන ලදී.

අනුමැතිය අවශ්‍ය වතු සමාගම් ලැයිස්තුවක් සහ මාර්ගයන්හි ලැයිස්තුවක් ලබා දීමට හැකිනම් අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කර විසඳා දීමට හැකි බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 4.12.3 වතු සමාගම් වලට අයිති වගා නොකළ ඉඩම් කුඩා තේ වතු සමිති වලට ලබා දීම

වතු සමාගම් වලට අයිති වගා නොකළ ඉඩම් කුඩා තේ වතු සමිති වලට ලබා දී එම ඉඩම්වල වගා කටයුතු කිරීමට අවසර ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වතු සමාගම්වල ඌණ උපයෝජිත ඉඩම් නැවත රජයට පවරා ගැනීම සඳහා නව පනතක් සකස් කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.12.4 බදුල්ල දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාපෘති

බදුල්ල දිස්ත්‍රික්කයේ නිවාස ව්‍යාපෘති සෑදීමේදී මහල් නිවාස සඳහා අනුමැතිය ලැබී ඇති බවත් මෙම ක්‍රමය මගින් විශාල ඉඩම් ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 4.13 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.13.1 කෑගල්ල ප්‍රදේශයේ කටුපොල් වගාව

කෑගල්ල රුවන්වැල්ල ප්‍රදේශවල මල්වත්ත සහ කැලණිවැලි වැවිලි සමාගම් මගින් කටුපොල් වගාව ආරම්භ කල ද රජය ප්‍රතිපත්තියක් ලෙස කටුපොල් වගාව නවත්වා ඇත්ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අධිකරණ තීන්දුවට අනුව අලුතින් ගස් සිටුවීමත් තිබෙන ගස් කැපීමත් නැවැත්වීමට උපදෙස් ලබාදී තිබෙන බවත් අලුතින් කටුපොල් වගාව සිදු කිරීම නැවැත්වීමට රජය

ඉතාමත් පැහැදිලි ප්‍රතිපත්තිමය තීරණයක සිටින බවත් ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 4.13.2 මොරලිය වතු සමාගමට අයත් ඉඩම් කොටසක් ලබා ගැනීම

නගර සංවර්ධන වැඩසටහන, ගම් පුළුල් කිරීමේ වැඩසටහන සහ රුවන්වැල්ල කාර්මික විද්‍යාලය පුළුල් කිරීම සඳහා රුවන්වැල්ල සම්බන්ධීකරණ කමිටුව විසින් මොරලිය වතු සමාගමට අයත් ඉඩම් වලින් හෙක්ටයාර 40ක පමණ ඉඩම් ප්‍රමාණයක් ඉල්ලා තිබෙන බැවින් ඒ සඳහා අවශ්‍ය සහාය ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නගර සංවර්ධනයට සහ ගම් පුළුල් කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය හරහා වතු සමාගම්වල කැමැත්තක් නොමැති ව ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරගත හැකි බැවින් එසේ අවශ්‍ය ඉඩම් ප්‍රමාණය අත්පත් කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

## 4.14 ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.14.1 වතු සමාගම්වලට ලබා දුන් ඉඩම්වල ගුණාත්මකභාවය අඩුවීම

මාතලේ දිස්ත්‍රික්කයේ වතු සමාගම්වලට ලබාදුන් ඉඩම්වල වර්තමාන තත්ත්වය, වතු සමාගම්වලට ලබාදීමට පෙර තත්ත්වය සමඟ සැසඳීමේ දී එම ඉඩම්වල ගුණාත්මකභාවය අඩු වී ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ජල පෝෂක ප්‍රදේශ ලෙස සංරක්ෂණය කළ යුතු ස්ථාන අතහැර දමා ඇති බැවින් එම ස්ථාන විනාශයට පත්වෙමින් පවතින බවත් ගරු මන්ත්‍රීතුමා තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.14.2 කඳු ප්‍රදේශවල ගස් කැපීම

කඳු මුදුන්වල සංරක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව තිබෙන ගස් කපා දැමීම හේතුවෙන් ආරක්ෂා කළ යුතු වනාන්තර භූමි ප්‍රදේශ අද වන විට මුඩුබිම් බවට පත්ව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

සෑම කපා දමන ගසක් වෙනුවෙන්ම තව ගස් දහයක් සිටුවා මෙම කඳු ආශ්‍රිත වනාන්තර භූමි ප්‍රදේශ ආරක්ෂා කරගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

### 4.14.3 කිතුල් ආශ්‍රිත නිෂ්පාදන හා ගම්මිරිස් වගාව ප්‍රවර්ධනය

කිතුල් ගස සහ ඒ ආශ්‍රිතව නොයෙකුත් ආකාරයේ නිෂ්පාදන සිදු කළ හැකි බැවින් එය සුළු අපනයන බෝගයක් ලෙස ප්‍රවර්ධනය කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

### 4.14.4 වතු සමාගම්වලට අයත් සංචාරක ආකර්ශණයන් වලින් උපයාගන්නා ආදායම

මධ්‍යම පළාතේ සමාගම්වල සංචාරක ආකර්ෂණ ස්ථාන සහිත වැවිලි සමාගම් විසින් එම කටයුතුවලින් උපයා ගන්නා ආදායමෙන් යම් ප්‍රතිශතයක් පළාත් පාලන ආයතන වෙත ලබා දෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

### 4.14.5 අලුතින් ඇති කරන පොලිස් ස්ථාන 3 සඳහා ඉඩම් ලබා ගැනීම

අලුතින් පොලිස් ස්ථාන තුනක් ඇති කිරීම සඳහා අනුමැතිය ලැබී තිබෙන බැවින් වතු සමාගම්වලට අයත් වගා නොකළ මුඩු ඉඩම්වලින් පොලිස් ස්ථාන සඳහා ඉඩම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.15 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.15.1 මන්නාරම ප්‍රදේශයේ රා එකතුකිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම

වවුනියාව, මන්නාරම හා මුලතිව් ප්‍රදේශයේ නිෂ්පාදනය කරනු ලබන රා සඳහා වෙළඳපොලක් නොමැති නිසා නිෂ්පාදනයෙහි අතිරික්තය ඉවතදැමීමට සිදුව ඇති බැවින් මන්නාරම ප්‍රදේශයේ රා එකතුකිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

වන්නි දිස්ත්‍රික්කය සහ මන්නාරම දිස්ත්‍රික්කය සඳහා ස්කාගාරයක් සහ රා එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පිළිබඳව දීර්ඝ කාලීන ඉල්ලීමක් පවතින බවත් එම ඉල්ලීම තල් සංවර්ධන අධිකාරිය වෙත මේ වන විට යොමු කර ඇති අතර මෙය ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බවත් ගරු රාජ්‍ය අමාත්‍ය අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දන්වා සිටින ලදී.

## 4.16 ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.16.1 සෙස් බදු ආදායමෙන් ප්‍රතිශතයක් පොල් වගාවේ සංවර්ධනයට යොදා ගන්නා ලෙස කරන යෝජනාව

පොල් කර්මාන්තයේ සෙස් බදු ආදායමෙන් යම් ප්‍රතිශතයක් පොල් වගාවේ සංවර්ධනයට යොදා ගැනීමට කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් යෝජනාවක් කරන ලදී.

මෙම යෝජනාව මුදල් අමාත්‍යාංශයට යොමු කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම් හට උපදෙස් ලබා දෙන ලදී.

## 4.17 ගරු වසන්ත යාපා බණ්ඩාර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.17.1 ගුඩ්සයිඩ් වත්ත, ජාතික වැවිලි සංස්ථාව මගින් පුද්ගලික පාර්ශවයකට බදු දීම

මහනුවර දිස්ත්‍රික්කයේ මැදමහනුවර ප්‍රදේශයේ පිහිටි ගුඩ්සයිඩ් වත්ත, ජාතික වැවිලි සංස්ථාව මගින් පුද්ගලික පාර්ශවයකට නැවත බදු දීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් මෙම වත්ත නැවත පුද්ගලික පාර්ශවයකට බදු දීමට අදහස් නොකරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දන්වා සිටින ලදී.

### 4.17.2 ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් ගෙවිය යුතු පාරිතෝෂික මුදල් හා අර්ථ සාධක / සේවක භාරකාර අරමුදල් ගෙවීම්

ගුඩ්සයිඩ් වත්ත තුළ පවුල් 400ක් පමණ සිටින බවත් මෙම වත්තේ සේවය කරන ලද ජනතාවගේ පාරිතෝෂික මුදල් හා අර්ථ සාධක / සේවක භාරකාර අරමුදල් අවුරුදු ගණනාවකින් ගෙවා නොමැති බැවින් එම හිඟ මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් සිදු කරන ලදී.

ඉදිරියේදී හිඟ මුදල් ක්‍රමානුකූලව ගෙවා දැමීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

### 4.17.3 ගුඩ්සයිඩ් වත්තේ ජීවත්වන ජනතාවගේ නිවාස ගැටලුව

මෙම වත්තේ ජීවත්වන ජනතාවගේ නිවාස පහසුකම් ගැටලුව පිළිබඳ ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදි.

ඉන්දියානු ණය ආධාර ක්‍රමය යටතේ මෙම වත්තේ ද නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම පිළිබඳව වතු යටිතල පහසුකම් අමාත්‍යාංයට වැවිලි අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

### 4.17.4 වැනිලා අස්වැන්න මිලදී ගැනීම

මහනුවර දිස්ත්‍රික්කයේ වැනිලා අස්වැන්න සම්පූර්ණයෙන් මිලදී ගන්නේ වැනිලා වගාකරුවන්ගේ සංගමය (Vanilla Growers' Association) විසින් වන අතර ඔවුන් එය එලිෆන්ට් හවුස් (Elephant House) ආයතනයට විකිණීම සිදු කරයි. නමුත් මෙම වර්ෂයේ දී එලිෆන්ට් හවුස් ආයතනය මිලදී ගත් වැනිලා ප්‍රමාණය ඉතා අඩු බැවින් වැනිලා වගාකරුවන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

### 4.17.5 කාරක සභාව සඳහා වූ යෝජනා

මෙම කාරක සභාවේ කරුණු ඉදිරිපත් කිරීම සඳහා මන්ත්‍රීවරුන්ට අවස්ථාව ලබා දීමේදී ක්ෂේත්‍ර අනුව හෝ ආයතන අනුව ප්‍රශ්න හා යෝජනා ඉදිරිපත් කිරීමට

අවස්ථාව ලබා දීමෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ කාලය ඉතිරි කර ගත හැකි බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

**5.** කාරක සභාව ප.ව. 1. 30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ප්‍රවාහන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 23**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ගාමිණී ලොකුගේ මහතා (සභාපති)
ගරු දිලුම් අමුණුගම මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු අශෝක් අබේසිංහ මහතා
ගරු මධුර විතානගේ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අසංක නවරත්න මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු තවරාජා කලෛයි අරසන් මහතා

**1. නියෝග හා වාර්ෂික වාර්තා සලකා බැලීම**

**1.1** (203 වන අධිකාරය වූ) මෝටර් රථ වාහන පනතේ 135 (4) වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ඔක්තෝබර් 09 දිනැති අංක 2144/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය

**1.2** (203 වන අධිකාරිය වූ) මෝටර් වාහන පනතේ 143 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ජනවාරි 30 දිනැති අංක 2160/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය

මෙම නියෝග ඉදිරිපත් කිරීමේ අරමුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් විසින් දීර්ඝ පැහැදිලි කිරීමක් කරන ලදී.

**1.3 වාර්ෂික වාර්තා**

**1.3.1** 2017 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
**1.3.2** 2018 වර්ෂය සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
**1.3.3** 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**1.3.4** 2017 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව

ඉහත කී නියෝග හා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත්කිරීම කාරක සභාව විසින් අනුමත කරන ලදී.

**2. වෙනත් කරුණු**

**2.1 විද්‍යුත් රියදුරු බලපත්‍රවලට අදාල ක්‍රියාකාරකම්/වරද හඳුනා ගැනීම සඳහා පොලිස් නිලධාරින්ට අවශ්‍ය තාක්ෂණික උපකරණ ලබාදීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

විද්‍යුත් රියදුරු බලපත්‍ර නිකුත් කර ඇතත් ඒවා භාවිතයේදී සිදුවන වරද හඳුනාගැනීමට උපයෝගි කරගනු ලබන තාක්ෂණික උපකරණ මේ දක්වා පොලිස් ස්ථානවලට හෝ ලබා නොදීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.
ඒ සඳහා විශේෂ උපකරණයක් ලබාදීම වෙනුවට කිව් ආර් කේතයන් (QR Codes) හා ජංගම දුරකථන භාවිතයෙන් ඉහත කටයුතු සිදුකිරීමට හැකි ක්‍රමවේදයක් හඳුන්වා දීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.2 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**2.2.1 පළාත් පාලන ආයතනවල රථවාහන කමිටු සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීයෙකු පත් කිරීම**

ගරු මන්ත්‍රීතුමා විසින් මෙම කරුණ පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු කරන ලදී.

**2.2.2 රජයේ ආයතනවල රියදුරන්ගේ සේවයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා විශේෂ පුහුණුවක් ලබාදී විශේෂ බලපත්‍රයක් ලබාදීම**

රියදුරන්ගේ නොසැලකිලිමත්භාවය සහ නොදැනුවත්කම නිසා රජයේ වාහනවලට සිදුවන හානි අවම කර ගැනීම සඳහා රජයේ රියදුරන්ට විශේෂ පුහුණුවක් ලබාදීම කෙරෙහි අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා ප්‍රමාණවත් අයුරින් රියදුරු උපදේශකයක් බඳවා ගන්නා ලෙස ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු චන්දිම වීරක්කොඩි මහතාද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

**2.3 වෘත්තීය පුහුණු අධිකාරියට රියදුරු උපදේශකවරුන් බඳවා ගැනීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

අධිකාරියට රියදුරු උපදේශකවරුන් බඳවා ගැනීමට ඉඩ නොදෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ පරීක්ෂණ පවත්වා රියදුරු උපදේශකයන් බඳවා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.4 රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ඩිපෝවේ රියදුරු සහ කොන්දොස්තර අඩුපාඩු - ගරු අකිල එල්ලාවල මහතා**

බලංගොඩ ඩිපෝවේ පවතින රියදුරු සහ කොන්දොස්තර පුරප්පාඩු පිරවීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රත්නපුර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලං.ග.ම. සහ පෞද්ගලික බස් සේවාවන් ඒකාබද්ධ කාලසටහනකට අනුව ක්‍රියාත්මක කරන මෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

පුරප්පාඩු පිරවීමේදී අනුගමනය කරනු ලබන ඉදිරි පියවර සහ බඳවා ගැනීමෙන් පසුව අනුගමනය කරනු ලබන පිළිවෙල සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දීර්ඝ විස්තරයක් කරන ලදී.
ගරු ෂානික්කියන් රජපුත්තිරන් රාසමාණික්කම් මහතාද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

**2.5 මඩකලපුව පුද්ගලික බස් නැවතුම් පොළෙහි පවතින අඩුපාඩු - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරන ලද මෙම බස්නැවතුම්පොළ නිසි සැලැස්මකට අනුව ඉදිනොකිරීමෙන් වර්ෂා ජලය සහ දැඩි අව් රශ්මිය නිසා මගීන්ට අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවී ඇති බැවින් එහි අඩුපාඩු සකස් කරදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගරු ෆයිසාල් කාසිම් මහතාද ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතාද මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලදී.

කාරක සභාවේ නිර්දේශයක් ලෙස මෙම කරුණ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා ලෙස නාගරික සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.6 බෙලිඅත්ත දුම්රිය ස්ථානය දක්වා භාණ්ඩ ප්‍රවාහන පහසුකම් ලබාගැනීම - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**

දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහන කිරීමේ පහසුකම මාතර දුම්රිය ස්ථානය දක්වා පමණක් සිදු කෙරෙන අතර එම පහසුකම බෙලිඅත්ත දුම්රිය ස්ථානය දක්වාම ලබා දෙන ලෙස ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.7 දේශපාලන පළිගැනීම් නතර කිරීම - ගරු අශෝක් අබේසිංහ මහතා**

දේශපාලන පළිගැනීම් තවමත් සිදුවන බව ගරු අශෝක් අබේසිංහ මහතා විසින් පෙන්වා දෙන ලද අතර ඒ සඳහා විසඳුම් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

එකී කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා අදාල දත්ත හා තොරතුරු ලබාදෙන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් ගරු අශෝක් අබේසිංහ මහතාට දැනුම් දෙන ලදී.

**2.8 ගම්පහ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ගවල පවතින ප්‍රවාහන අපහසුතා - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**

ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් පවතින මීරිගම, දොම්පෙ හා අත්තනගල්ල යන මැතිවරණ කොට්ඨාශවලට ඇත්තේ එක් ඩිපෝවක් පමණක් බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

පාසැල් ආරම්භ වන හා අවසාන වන වෙලාවන්හිදී ග්‍රාමීය මාර්ගවල බස්රථ ධාවනය දුර්වල මට්ටමක පවතින බවද ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන කමිටුව රැස්කොට ධාවන සැලැස්ම සංශෝධනය කිරීමට පියවර ගන්නා බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.9 අබලන් වූ බස් රථ අලුත්වැඩියා කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

ඉතා පැරණි බස් රථ අලුත්වැඩියා කිරීම නිශ්ඵල කටයුත්තක් බවත් ඒ වෙනුවට නව බස් රථ 600 ක් ඇණවුම් කර ඇති බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.10 අහංගම දුම්රිය ස්ථානයට ආසන්නයෙන් අහංගම නගරයට පිවිසීම සඳහා සැලසුම් කර ඇති මාර්ගය - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

අහංගම දුම්රිය ස්ථානයට ආසන්නව නගරයට පිවිසීම සඳහා සැලසුම් කර ඇති මාර්ගය ගොඩනැගීම සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

එකී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවා ඇති බවත් එම වාර්තාව ලැබුණු පසු ආයතනයේ ඉංජිනේරුවන් යොදවා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමට කටයුතු කර ඇති බවත් හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

**2.11 හබරාදූව දුම්රිය පොළෙහි සීඝ්‍රගාමී දුම්රිය නැවැත්වීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

නැවත හබරාදූව දුම්රිය පොළෙහි සීඝ්‍රගාමී දුම්රිය නැවත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ පිළිබඳ අධ්‍යයනය කර තීරණයක් ගනු ලබන බව හිටපු දුම්රිය සමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

**2.12 ග්‍රාමීය මාර්ග සඳහා කුඩා බස්රථ යෙදවීම - ගරු අකිල එල්ලාවල මහතා**

ග්‍රාමීය ප්‍රදේශවල පටු මාර්ග සඳහා කුඩා බස් රථ (තනිදොර බස්) ලබා දීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එකී මාර්ග සඳහා තනිදොර බස් රථ මේ වන විට ඇණවුම් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.13 ලංගම සේවකයින්ගේ යටිතල පහසුකම් හා සුභසාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම - ගරු අකිල එල්ලාවල මහතා**

ලං.ග.ම. සේවකයන්ට අවශ්‍ය වැසිකිලි පහසුකම්, ආහාර ගැනීමේ පහසුකම්, නවාතැන් පහසුකම් ආදිය ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

සියළුම ඩිපෝවල වැසිකිලි හා නවාතැන් කාමර (rest room) නවීකරණය කිරීමට මුදල් වෙන් කිරීමට කටයුතු කර ඇති බවත් සෑම ඩිපෝවකම සුභසාධක වෙළඳසැලක් ආරම්භ කිරීමට කටයුතු කර ඇති බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.14 ඕමන්ත, තලෙයිමන්නාරම පියර්, මාන්කුලම් දුම්රිය හරස් පාරවල්වල මුරපොළ නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ඉහත කාරණය සම්බන්ධයෙන් විමසීමක් කරන ලද අතර එම ස්ථානවලට නිසි පරිදි සේවය කළ හැකි මුරකරුවන් යොදවන ලෙස ඉල්ලීමක් කරන ලදී.

දුම්රිය හරස් පාරවල් සඳහා ස්වයංක්‍රීය ගේට්ටු හෝ විදුලි බුබුළු පද්ධතියක් හඳුන්වාදිය යුතු බවට ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගෙන ඇති බවද දුම්රිය සංඥා පද්ධතිය අලුතින් සකස් කිරීමට භාර දී ඇති බවද ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

දුම්රිය හරස් පාර මුරපොළවල් සඳහා මුරකරුවන් යොදවා ඇත්තේ පොලිස් දෙපාර්තමේන්තුව යටතේ බැවින් පොලිස්පතිටද මේ සම්බන්ධයෙන් දැනුම්දී ඉහත

මුරපොළවල් 4 සම්බන්ධයෙන් පියවරක් ගන්නා බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**2.15 මන්නාරම දුම්රිය ස්ථානය සඳහා අන්තර්ජාලය මගින් දුම්රිය ප්‍රවේශපත් වෙන් කිරීම (On –line Booking) - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

අන්තර්ජාලය මගින් දුම්රිය ප්‍රවේශපත් වෙන් කිරීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස පැමිණ සිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

**2.16 හදිසි අනතුරු අවම කර ගැනීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

හදිසි අනතුරු අවම කරගැනීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කර ඉදිරිපත් කිරීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කිරීමේ යෝජනාව ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලදී.

ජාතික මට්ටමින් ප්‍රවාහන කමිටුවක් පත්කොට මාර්ගවල අනතුරු ඇතිවිය හැකි ස්ථාන පිළිබඳ හඳුනා ගැනීමට කටයුතු කළයුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.17 රජයේ වාහන සඳහා ටයර් ලබාදීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා**

රජයේ වාහන සඳහා අවශ්‍ය ටයර් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.18 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**2.18.1 වාහන අනතුරු සඳහා වන්දි ලබාගැනීම**

මාර්ග සංවර්ධන අධිකාරියේ, විදුලිබල මණ්ඩලයේ හෝ ටෙලිකොම් වැනි ආයතන මගින් මාර්ගවල සවිකර ඇති කණු, පුවරු හේතුවෙන් සිදුවිය හැකි වාහන අනතුරු සඳහා වන්දි ලබා ගැනීමට ක්‍රමවේදයක් සකසන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.18.2 කොළඹ - දෙමටගොඩ දුම්රිය අංගනයේ සිට මරදාන දක්වා දුම්රිය මාර්ගය අපවිත්‍රවීම**

කොළඹ - දෙමටගොඩ දුම්රිය මාර්ගය පවිත්‍ර කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.18.3 රජයේ රියදුරන්ට නවීන වාහනවල ඇති නව අංගෝපාංග සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම ලබාදී ගුණාත්මක සේවයක් ලබා ගැනීම**

රජයේ වාහන නියෝජිත ආයතන සමග සම්බන්ධ වී රජයේ රියදුරන්ට විශේෂඥ දැනුම ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මගී ප්‍රවාහනයේ යෙදෙන රියැදුරන්ට වෙනම විශේෂ බලපත්‍රයක් දීමට අදහස් කරන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.18.4 මගී බස්රථවල ප්‍රමිතිය ඉහළ නැංවීමට කටයුතු කිරීම

මගී බස්රථවල වීදුරු අඳුරු පැහැ කිරීම, ස්ටිකර් ඇලවීම, රූපවාහිනී යන්ත්‍ර සවිකිරීම හා සංගීතය වාදනය කිරීම ආදිය සිදු කිරීමෙන් රියදුරන්ගේ අවධානය ගිලිහී යන බව ගරු මන්ත්‍රීතුමා විසින් පෙන්වා දෙන ලදී.

එකී කාර්යයන් සඳහා මොටර් ප්‍රවාහන දෙපර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට සැලැස්විය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.18.5 රථවාහන ධාවනය සඳහා මාර්ග සුදුසුද යන්න පිළිබඳව විගණනයක් කිරීම

රථවාහන ධාවනය සඳහා මහාමාර්ග ආරක්ෂිතව සැකසී ඇත්ද යන්න හඳුනා ගැනීම සඳහා විගණනයක් සිදු කරන ලෙස ද ඒ පිළිබඳ විස්තර මීලඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසද ගරු මධුර විතානගේ මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.19 අම්පාර දිගාමඩුල්ල සමන්තුරේ උප ඩිපෝව වසා දැමීම - ගරු රිසාඩ් බදියුදීන් මහතා, ගරු එච්.එම්.එම් හරීස් මහතා

අම්පාර දිස්ත්‍රික්කයේ දිගාමඩුල්ල කොට්ඨාශයේ සමන්තුරේ උප ඩිපෝව වැසීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මුදල් අමාත්‍යාංශයෙන් ලැබී ඇති උපදෙස් මත එම උප ඩිපෝව වසා දැමීමට සිදුවී ඇති බවත් බස් රථ ඩිපෝවෙහි නවතා ඇති අතර කාර්යාල කටයුතු ප්‍රධාන ඩිපෝව මගින් සිදු කෙරෙන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

## 2.20 ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.20.1 උතුරු පළාත් ලංකා ගමනාගමන මණ්ඩල ඩිපෝවේ පවතින අඩුපාඩු

උතුරු පළාත් ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවට ස්ථිර ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාරවරයකු (Chief Regional Manager) පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උතුරු පළාත් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ කාර්යාලය හා කොණ්ඩවේලි ඩිපෝව එකම ස්ථානයක පවතින අතර නිලධාරීන් දේශපාලන පළිගැනීම්වලට ලක්ව සිටින බැවින් ඔවුන්ට සහන ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් ඉල්ලා සිටින ලදී.

උතුරු ප්‍රදේශයේ කොන්ඩවේලි ඩිපෝවේ කටයුතු මාන්කුලම් ඩිපෝව මගින් සිදු කිරීම සම්බන්ධයෙන්ද ගරු මන්ත්‍රිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.20.2 කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයන් ස්ථිර කිරීම**

වසර 10 ක් පමණ කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයන් ස්ථිර කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

**2.20.3 කොණ්ඩවෙලි දුම් පරීක්ෂණ ස්ථානය නැවත විවෘත කිරීම**

දැනට අක්‍රීය තත්ත්වයේ පවතින වසර 2 කට පෙර ආරම්භ කරන ලද කොණ්ඩවෙලි දුම් පරීක්ෂණ ස්ථානය නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.20.4 පේදුරුතුඩුව ඩිපෝවේ සේවකයන්ට අවශ්‍ය පහසුකම් ලබාදීම**

පේදුරුතුඩුව ඩිපෝවේ ඉංජිනේරු අංශයේ සේවකයන්ට අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කොන්ත්‍රාත් පදනම මත සිටින වසර 5 කට වැඩි සේවා කාලයක් ඇති සේවකයින් ස්ථිර කිරීම, ඩිපෝ පහසුකම් වැඩි දියුණු කිරීම සහ සේවකයන්ගේ නවාතැන් කාමර හා වැසිකිලි පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

තවද දේශපාලන පලිගැනීම් සිදුවේ නම් ඒ පිළිබඳ සොයා බලා කටයුතු කරන බවද රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මාන්කුලම් කාර්යාලය සම්බන්ධයෙන් ද අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගන්නා බවත් මැදවච්චිය වැඩපොළෙහි බස් එකලස් කිරීමේ කටයුතු පෞද්ගලික අංශය මගින් සිදු කිරීමට පියවර ගන්නා බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.21 වාහන සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ දී සිදුවන අක්‍රමිකතා - ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

ඉහත කාරණය සම්බන්ධයෙන් ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් විමසීමක් කරන ලදී. තවද දුරගමන් බස් රථවලට අමතර ටයර් පහසුකම් (spare wheel) ලබාදී නොමැති බව ද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

බස් රථ සඳහා අමතර කොටස් මිලදී ගැනීමේදී සිදුවන අක්‍රමිකතා පැරණි ක්‍රමවේදයන් භාවිතා කිරීම නිසා සිදුවන බවත් පරිඝණක මෘදුකාංග මාර්ගයෙන් මිලදී ගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සම්පාදනය කරමින් පවතින බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

## 2.22 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.22.1 ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන ගැටළු

ගම්පහ දිස්ත්‍රික්කයේ ලං.ග.ම. බස් රථවල ගමන් කරන ජනතාව මුහුණ දෙන ප්‍රවාහන ගැටළු සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන කමිටුවට ප්‍රවාහන අවශ්‍යතා පිළිබඳ දත්ත ලබාදෙන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලද අතර ඇණවුම් කරන ලද බස් රථ ලැබුණ පසු එම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී.

### 2.22.2 අත්තනගල්ලේ දාරළුව දුම්රිය ස්ථානයේ අපහසුතා

දාරළුව දුම්රිය ස්ථානයේ දුම්රිය නැවැත්වීමේදී දුම්රිය ඇලවීම නිසා මගීන් මාර්ගය තුළට ඇද වැටෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.
මෙම අපහසුතාවය මඟ හරවා දීමට කටයුතු යොදන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.22.3 හීන්දෙනිය පට්ටිගොඩ දුම්රිය පොල අසල රිය නැවතීම

හීන්දෙනිය පට්ටිගොඩ දුම්රිය පොළ (පාළුවරිගෙ) අසලින් බයිසිකල් නැවැත්වීම සඳහා ස්ථානයක් සකස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

ඒ සම්බන්ධයෙන් කාරක සභාවට යෝජනාවක් ලබා දෙන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.23 ගල්ගමුව දුම්රිය රක්ෂිතය තුල ගල්ගමුව මහජන පොළ පවත්වාගෙන යෑම - ගරු අසංක නවරත්න මහතා

ඉහත ස්ථානයේ මහජන පොළ පවත්වාගෙන යෑමට කටයුතු සම්පාදනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 2.24 ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.24.1 පොතුවිල් බස්නැවතුම්පොළ ප්‍රධාන බස් නැවතුම්පලක් බවට පත්කිරීම

මේ සම්බන්ධයෙන් ලිඛිත ඉල්ලීමක් කරන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 2.24.2 පොතුවිල් කොළඹ බස් මාර්ගය

පොතුවිල් සිට කොළඹ දක්වා දිවෙන බස් රථ පොතුවිල් මාර්ගයේ ගමන් නොකොට අක්කරෙයිපත්තු මාර්ගයේ පැමිණීම සම්බන්ධයෙන් ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා විසින් විමසීමක් කරන ලදි.

ඒ පිළිබඳ පරීක්ෂාකර අවශ්‍ය කටයුතු කරන ලෙස රාජ්‍ය අමාත්‍යතුමා විසින් නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.25 ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.25.1 බස් කොන්දොස්තරවරු බඳවා ගැනීම

බස් කොන්දොස්තරවරු බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා පුහුණු වැඩසටහන් පැවැත්වූ නමුත් මෙතෙක් රැකියා ලබා දී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඔවුන් පිළිබඳ විස්තර ලබා දෙන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 2.25.2 බස් රථ සඳහා මැද දොරක් දැමීම

වායු සමනය කරන ලද දිග බස් රථ සඳහා මැද දොරක් දැමීමට කටයුතු කරන ලෙස ද ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.26 ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.26.1 දඹුල්ල - කුරුණෑගල දුම්රිය මාර්ගයේ අවතැන්ව සිටින පවුල් 400 ක් සඳහා වන්දි ගෙවීමේ කටයුතු

ඉහත කාරණය සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම පුද්ගලයන් සඳහා වන්දි ගෙවීමට මේ වන විටද මුදල් අනුමත කරගෙන ඇති බව හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් දැනුම් දෙන ලදී.

### 2.26.2 මාතලේ ඩිපෝ භූමියේ වලවල් සහිත ප්‍රදේශය අලුත්වැඩියා කිරීම

මාතලේ ඩිපෝ භූමියේ වලවල් සහිත ප්‍රදේශය අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

මාර්ග සංවර්ධන අධිකාරිය සමග සම්බන්ධීකරණය කර ඩිපෝ 107 හි පොළොව සකස් කිරීමේ කටයුතු සිදුකිරීමට අදාළ නිලධාරීන් විසින් එකඟතාව පළ කර ඇති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.26.3 බස්රථ අලුත්වැඩියා කිරීමේ උපකරණ ලබාදීම

කළුදැව ඩිපෝ වැඩපළෙහි මාසයකට බස් 11 පමණ අලුත්වැඩියා කරනු ලබන බවත් එම ස්ථානය සඳහා බස්වලට අවශ්‍ය අමතර කොටස් අලුත්වැඩියා කිරීමේ උපකරණ ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරන ලදි.

අලුත්වැඩියා කිරීමේ උපකරණ ලබා දීම සඳහා කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

### 2.26.4 කළුදැවල ලංගම ප්‍රාදේශීය වැඩපලට ටයර් නැවත පිරවීමේ යන්ත්‍රෝපකරණ ලබාදීම

කළුදැවල වැඩපලට ටයර් නැවත පිරවීමේ යන්ත්‍රෝපකරණ (Tire Re-build Plant) ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලීමක් කරන ලදී.

අම්පාරට හා කළුදැවලට නව නිෂ්පාදන යන්ත්‍රෝපකරණ ලබා දීමට කටයුතු කරමින් සිටින බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 2.26.5 මාතලේ, උකුවෙල ප්‍රවාහන ගැටළු

උකුවෙල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී දුම්රිය දෙපාර්තමේන්තුව නියෝජනය කිරීමට නියෝජනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.26.6 දේශපාලන පළිගැනීම් නතර කිරීම

දේශපාලන පළිගැනීම් නතර කිරීමට කටයුතු කරන ලෙසත් කාර්යාලවල සිටින අමතර සේවකයන් ඉවත් කිරිමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කාර්යාලවල සිටින අමතර සේවකයන් ඉවත් කිරීමට කටයුතු කරමින් සිටින බව රාජ්‍ය අමාත්‍ය, ගරු දිලුම් අමුණුගම මහතා විසින් දැනුම් දෙන ලදී.

### 2.26.7 සේවකයන් සඳහා දිරි දීමනා

දැඩි කැපවීමකින් සේවය කරන සේවකයන් දිරිගැන්වීම සඳහා දිරි දීමනා, උසස්වීම් ලබා දෙමින් ආදායම හා සේවා තත්ත්වය ඉහල නංවා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.27 ග්‍රාමීය මාර්ගවල බස් ධාවනය නිසි පරිදි සිදු කිරීම - ගරු සුදත් මංජුල මහතා

රුවන්වැල්ල, දෙහිඕවිට, යටියන්තොට, බුලත්කොහුපිටිය ග්‍රාමීය මාර්ගවල බස් ධාවනය නිසි පරිදි සිදු කිරීමට කටයුතු කරන ලෙස ගරු සුදත් මංජුල මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම ප්‍රදේශවලට අවශ්‍ය ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමට කඩිනමින් කටයුතු කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.28 පොළොන්නරුව ඩිපෝව - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**

පොළොන්නරුව ඩිපෝව එම ස්ථානයෙන් ඉවත් කරන්නේද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

ඒ සඳහා විශාල වියදමක් දැරීමට සිදුවන බැවින් දැනට එම ස්ථානයම පවත්වාගෙන යමින් අදාළ සංවර්ධන කටයුතු සිදු කළ හැකි බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.29 ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**2.29.1 නින්දවූර් අට්ටම්පලම් පාසැල් ළමුන් සඳහා යෙදවූ බස්රථය නැවැත්වීම**

කල්මුණේ ඩිපෝව මගින් නින්දවූර් අට්ටම්පලම් පාසැල් ලමුන් සඳහා යෙදවූ බස් රථය නවතා ඇති බවත් ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් දැනුම් දෙන ලදී.

එම ස්ථානය සඳහා බස් රථයක් යොදවන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.29.2 කල්මුණේ සිට කූලාවඩි පාරේ ගමන් කරන පාසල් බස් රථය නැවැත්වීම**

කල්මුණේ සිට කූලාවඩි පාරේ ගමන් කරන පාසල් බස් රථයද නවතා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව පස්වරු 12.45 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**නාගරික සංවර්ධන හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 24**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු මුජිබුර් රහුමාන් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ජයන්ත සමරවීර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු නසීර් අහමඩ් මහතා
ගරු ජගත් කුමාර මහතා
ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු නිමල් පියතිස්ස මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය

## 1. වාර්ෂික වාර්තා සලකා බැලීම

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තාවලට කාරක සභාව එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, අග්‍රාමාත්‍ය සහ කාරක සභාවේ සභාපති ගරු මහින්ද රාජපක්ෂ මහතා විසින් 2021 අප්‍රේල් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදි.

**1.1** 2016 වර්ෂය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව
**1.2** 2016 වර්ෂය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

## 2. 2020.11.24 දින පැවති රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු

### 2.1 නාගරික ජනාවාසවල පදිංචි ජනතාවගේ යහපැවැත්ම හා ජීවන තත්ත්වය දියුණු කිරීම - ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

2020 වසරේ සිට 2025 වසර දක්වා මේ සම්බන්ධයෙන් සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඇති බව නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, වී.යූ.බී. උදය නානායක්කාර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 2.2 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 2.2.1 පළාත් පාලන ආයතන සඳහා මාර්ගස්ථ ක්‍රමය හඳුන්වා දීම

පළාත් පාලන ආයතන සඳහා මාර්ගස්ථ ක්‍රමය හඳුන්වා දෙන ලෙස ලැබී ඇති උපදෙස් අනුව කෝට්ටේ මහ නගර සභාවට මෙය හඳුන්වා දීමේ කටයුතු සිදු කරමින්

පවතින බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

තවද නියමු ව්‍යාපෘතියක් ලෙස ගම්පහ සහ කළුතර ප්‍රාදේශීය සභාවන්ට මෙය හඳුන්වා දීමේ කටයුතු සිදු කරන බවත් දැනුම් දෙන ලදී.

ඉදිරියේදී සියලුම පළාත් පාලන ආයතනවල කටයුතු මාර්ගස්ථ ක්‍රමයට සිදු කිරීමට බලාපොරොත්තු වන බවත් දැනුම් දෙන ලදී.

### 2.2.2 සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලියේ ඇති දුර්වලතා

පළාත් පාලන ආයතන මගින් සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ක්‍රියාවලීන්හිදී ජනතාවගේ සම්බන්ධවීම අවම වන පරිදි නව තාක්ෂණය යොදා ගෙන මෙම කටයුතු විධිමත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වනවිට නාගරික සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කරන සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය දින 14 – 21 ක කාලයක් තුළ අවසන් කිරීමට කටයුතු කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 2.2.3 අයදුම්පත් සම්මත ආකෘතියකට අනුව සකස් කිරීම

සෑම පළාත් පාලන ආයතනයක් විසින් හඳුන්වා දෙනු ලබන සැලසුම් අනුමත කර ගැනීමේ ක්‍රියාවලියට අදාළ අයදුම්පත් සරල ලෙස සම්මත ආකෘතියකට සකස් කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.2.4 සැලසුමක් අනුමත කිරීමට විවිධ රාජ්‍ය ආයතන වෙත යොමු වීමට සිදුවීම

යම් සැලසුමක් අනුමත කර ගැනීමේදී ඒ සඳහා රාජ්‍ය ආයතන කිහිපයක් වෙත යොමු වීමට සිදුවීම හේතුවෙන් ආයෝජකයින් මහත් අපහසුතාවට පත්වන බව ගරු මධුර විතානගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත ක්‍රමවේදය අනුව ආයෝජකයන්ට විවිධ කාර්යාලවලට යොමු වීමට අනවශ්‍ය බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී නාගරික සංවර්ධන අධිකාරියට අයදුම්පතක් භාර දීමෙන් පසු මාර්ගස්ථ ක්‍රමයට නාගරික සංවර්ධන අධිකාරිය විසින්ම එය අවශ්‍ය ආයතන වෙත යොමු කර අදාළ පියවර ගැනීම සිදු කරන බව ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 2.2.5 ශ්‍රී ලංකාව විසින් ව්‍යාපාර දර්ශකයෙහි (Doing Business Index) ලබා ගෙන ඇති ස්ථානය

ශ්‍රී ලංකාව, ව්‍යාපාර දර්ශකයෙහි (Doing Business Index) ලබාගෙන ඇති ස්ථානය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බවත් මෙම තත්ත්වය ආයෝජකයින් ආකර්ශනය කර ගැනීමේදී බලපාන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ව්‍යාපාර දර්ශකය (Doing Business Index) ගණනය කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් වර්ග අඩි 9000 ට වඩා වැඩි ගොඩනැගිලි පමණක් සලකා බලන බැවින් වර්ග ප්‍රමාණය ඊට වඩා අඩු ගොඩනැගිලි සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන විසින් කටයුතු කිරීමට තීරණය කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 2.2.6 ජනතාවට තොරතුරු දැන ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම

පළාත් පාලන ආයතන තුළ සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජනතාවට අවශ්‍යවිටකදී තොරතුරු දැන ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.2.7 නාගරික සංවර්ධන අධිකාරිය සතු බලතල පළාත් පාලන ආයතන වෙත පවරා දීම

වර්තමානයේදී නාගරික සංවර්ධන අධිකාරිය සතු බලතල පළාත් පාලන ආයතන වෙත පවරා නොදීම නාගරික නොවන ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇති බව ගරු මිලාන් ජයතිලක මහතා සහ ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් දැනුම් දෙන ලදී.

### 2.2.8 නාගරික ප්‍රදේශවල සිදු කරන අනවසර ඉදිකිරීම්

නාගරික ප්‍රදේශවල විශාල වශයෙන් සිදු වන අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කිසිදු නියාමනයක් නොමැති බව ගරු මධුර විතානගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි අවස්ථා පැමිණිලි කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පොලිස් දෙපාර්තමේන්තුවද සම්බන්ධ කර නිරන්තරයෙන් ක්‍රියාත්මක වන ඒකකයක් ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.2.9 සැලසුම් අනුමත කිරීමේදී ඇති වන ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තියක් හඳුන්වා දීම

සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් කාලයෙන් කාලයට වෙනස් වන බැවින් එහිදී එකම කාරණයක් සම්බන්ධයෙන් පරස්පර නිර්දේශ ලබා දෙන බව ගරු මධුර විතානගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් යම් කාරණයක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම අවශ්‍ය බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.2.10 ඉංජිනේරුවරුන් සහ ගෘහ නිර්මාණ ශිල්පීන් ගොඩනැගිලි සැලසුම් කිරීමේදී ප්‍රායෝගිකව කටයුතු නොකිරීම

ගොඩනැගිලි සැලසුම් කිරීමට අදාළ නව මාර්ගෝපදේශ ඉදිරියේදී ගැසට් කිරීමට නියමිත බැවින් මෙම ගැටළුව නිරාකරණය වන බව රාජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් දැනුම් දෙන ලදී.

ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවරුන් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කර ගැනීම අවශ්‍ය බව ගරු මධුර විතානගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.3 මීරිගම නගර සැලසුම - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය**

මෙය ඉදිරියේදී ක්‍රියාත්මත කිරීමට නියමිත බව රාජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් දැනුම් දෙන ලදී.

නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමන්ලා වෙත උපදෙස් ලබා දෙන ලදී.

**2.4 යාපනය දිස්ත්‍රික්කය සඳහා වන උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතිය - ගරු අංගජන් රාමනාදන් මහතා**

මෙම ව්‍යාපෘතිය මේ වනවිට කඩිනමින් ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.5 පළාත් පාලන ආයතනය නොසලකා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය මත නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීම - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

2012 - 2013 කාලයේදී අනුමත කර ඇති මෙම නිවාස ව්‍යාපෘතියේ ජනතාව පදිංචි වී ඇති නමුත් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර නොමැති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම නිවාස විකුණා අවසන් බැවින් නැවත මෙය නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමේ හැකියාවක් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මූලිකවම නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමැතිය දී ඇති බැවින් මෙහි වගකීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් භාරගත යුතු බවත් අදාළ පළාත් පාලන ආයතන සමඟ සම්බන්ධ වී ඉදිරි පියවර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**2.6 කුලියාපිටිය මීගහකොටුවේ උද්‍යානයක් ඉදි කිරීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

මෙහි සඳහන් පරිදි උද්‍යානයක් ඉදි කිරීම සඳහා සැලැස්මක් නොමැති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**2.7 ගල්ගමුව ආසනයේ ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘති වෙනුවෙන් යටිතල පහසුකම් ලබා දීම - ගරු අසංක නවරත්න මහතා**

පසුගිය කාලයේදී ආරම්භ කරන ලද නිවාස සඳහා යටිතල පහසුකම් ලබා දීම සිදු නොවූ බැවින් මේ වනවිට ක්‍රියාත්මක වන ග්‍රාමීය යෝජනාවලින් අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන මෙම පහසුකම් ලබා දිය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**3.1 ඉඩම සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා උණවටුන, බොනවිස්ටාව, රෝස්වුඩ් හි පදිංචි එම්.එස්. නානායක්කාර මහතාගේ ඉල්ලීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 5)**

මෙම යෝජනාව සඳහා පිලිතුරු ගරු මන්ත්‍රීතුමා වෙත යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

ඉහත ඉල්ලීම ඉදිරිපත් කරන පුද්ගලයා මෙම ප්‍රදේශයේ පාරම්පරික පදිංචිකරුවෙක් බවත් ඔහු විසින් ඉඩම සංවර්ධනය කිරීම සඳහා ඉල්ලීම් කිරීමේදී මෙම කලාපය සංවේදී කලාපයක් ලෙස දක්වා ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශයේ සිදු කිරීම සඳහා අවසර ලබා දෙන කාර්යයන් හා කටයුතු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පැහැදිලි කරන ලදී.

රුමස්සල ප්‍රදේශය තුළ පරිසර විනාශයක් සිදුවන කාර්යයන් සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවත් යෝජිත ව්‍යාපෘති අධ්‍යයනය කර ඒ සඳහා අනුමැතිය ලබා දීම සිදු කරන බවත් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම ව්‍යාපෘතියට අදාළ යෝජනාව නිවැරදි ලෙස සකස් කර යොමු කරන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

තවද මෙම ප්‍රදේශය සංවේදී කලාපයක් ලෙස ගැසට් කර ඇති නමුත් එම සංවේදී කලාපය සඳහා මෙම ප්‍රදේශයේ ඇති රජයේ ඉඩම් ඇතුළත් කර නොමැති බව ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් දැනුම් දෙන ලදී. එම කාර්යය සිදු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

**3.2 පිළිතුරු වාර්තා අදාළ ගරු මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් කර ඇති අනෙකුත් යෝජනා**

**3.2.1** අකුරැස්ස, හුලංදාව වත්ත ලිපිනයෙහි පදිංචි පාලිත ලියනගේ මහතා විසින් තම නිවසට සෙවිලි තහඩු ලබා දෙන ලෙස කළ ඉල්ලීම
**ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 27)**

**3.2.2** කොළඹ 12, ශාන්ත සෙබස්තියන් වීදියේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය සතු අංක කො. 7388 හා 7015 දරන ඉඩමෙන් ප. 52.18 ඉඩම් කොටසක් බප/කො/අල් හික්මා විදුහලට ලබා දීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම **ගරු රවුෆ් හකීම් මහතා (යෝජනා අංක 33)**

**3.2.3** ගාල්ල, කඩවත් සතර ප්‍රා.ලේ. කොට්ඨාශයේ පිහිටි මොහිදීන් වත්ත නිවාස යෝජනා ක්‍රමයේ වසර 30 ට අධික කාලයක් පදිංචි නිවාස හිමියන්ට ඔප්පු ප්‍රදානය කරන ලෙස ඉල්ලමින් ගරු මන්ත්‍රීතුමා විසින් කළ ඉල්ලීම
**ගරු රවුෆ් හකීම් මහතා (යෝජනා අංක 34)**

## 4. වෙනත් කටයුතු

### 4.1 ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.1.1 නොච්චියාගම නගර සංවර්ධන සැලසුම

නොච්චියාගම නගරය සඳහා නගර සැලසුම සකස් කිරීම ආරම්භ කර ඇති බැවින් එහිදී බස් නැවතුම්පළ, පොදු වැසිකිළිය, ඇවිදින මංතීරුව යන පහසුකම් ලබා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 4.1.2 නිවාස ණය සඳහා ඉල්ලීම් කිරීම

නිවාස ණය සඳහා ඉල්ලීම් කර ඇති තම දිස්ත්‍රික්කයේ ජනතාවට ණය ලබා දීමේ ප්‍රමාදයක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 4.1.3 අනුරාධපුර සමාධි පිළිම වහන්සේ ආසන්න කලාපයේ වෙළෙඳාම් කිරීමට අවස්ථාව අහිමි කිරීම

ආදළ සියලු පාර්ශව වෙතින් අනුමැතිය ලැබී ඇති නමුත් අනුරාධපුර සමාධි පිළිම වහන්සේ ආසන්න කලාපයේ වෙළෙඳාම් කිරීමට ජනතාවට ලබා දී ඇති අවස්ථාව සම්බන්ධයෙන් විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් විරෝධය දක්වා ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිද සමඟ විහාරාධිපති ස්වාමීන් වහන්සේ හමුවී සාකච්ඡා කරන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 4.2 ගරු මිලාන් ජයතිලක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.2.1 කිරිඳිවැල නගර සංවර්ධන සැලසුම

කිරිඳිවැල බස් නැවතුම්පළ ඉදිරිපස ඇති ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිටුපස ස්වයං රැකියාලාභීන්ට වෙළෙඳාම් කිරීම සඳහා ස්ථානයක් ඉදි කිරීම සම්බන්ධයෙන්ද එම ස්ථානයේම ඇති ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී. එමෙන්ම කිඹුල්විලවත්ත වැව ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳවද ගරු මිලාන් ජයතිලක මහතා විසින් විමසීමක් කරන ලදී.

#### 4.2.2 කිරිඳිවැල බස් නැවතුම්පළ පවරා දීම

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති කිරිඳිවැල බස් නැවතුම්පළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පවරා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.3 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.3.1 අභංගම නගර සංවර්ධන සැලැස්ම

අභංගම නගරයේ පවතින වාහන තදබදය සහ සෙසු ගැටළු වෙනුවෙන් නගර කේන්ද්‍රය වටා විකල්ප මාර්ගයක් (Bypass) අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.3.2 ඉමදූව නගර සංවර්ධන සැලැස්ම

ඉමදූව නගරයට යෝජිත නගර සංවර්ධන සැලසුම අවසන් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉමදූව නගර සංවර්ධන සැලසුමට අදාළව යටිතල පහසුකම් ලබා දීමේ කටයුතු සඳහා මෙම වසර තුළදී ප්‍රතිපාදන වෙන් කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 4.3.3 බෝගහගොඩ නගර සංවර්ධන සැලැස්ම

බෝගහගොඩ නගර සංවර්ධන සැලසුම ක්‍රියාත්මක කිරීමේදී වෙනත් පාර්ශවයන් මැදිහත් වීම වැලැක්වීමට කටයුතු කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.3.4 ඇල්පිටිය නගර සංවර්ධන සැලැස්ම

ඇල්පිටිය නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී සම්පූර්ණ විස්තරයක් පරිගණක වැඩසටහනක් (Power Point Presentation) මගින් ඉදිරිපත් කරන ලෙස ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

පසුගිය කාලයේදී නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම විධිමත් ලෙස සිදු වී නොමැති බවත් වර්තමානයේදී ප්‍රමුඛතා පිළිවෙළකට මෙම සැලසුම් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් දැනුම් දෙන ලදී.

## 4.4 ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.4.1 කඩුවෙල සහ බත්තරමුල්ල නගර ආශ්‍රිතව පවතින වාහන තදබදය අවම කිරීම

කඩුවෙල සහ බත්තරමුල්ල නගර ආශ්‍රිතව පවතින වාහන තදබදය අවම කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණට විසඳුමක් ලෙස බිමට ඉහලින් මාර්ග (Elevator Roads) ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු ආරම්භ කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එමෙන්ම මාලබේ, කඩුවෙල, අතුරුගිරිය සහ බත්තරමුල්ල නගර සඳහා නගර සංවර්ධන සැලසුම් සකස් කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 4.4.2 පාදුක්ක නගරයේ ඉදිකර ඇති ක්‍රීඩාංගනයේ වතුර බැස්ම සිදු නොවීම

පාදුක්ක නගරයේ ඉදි කර ඇති නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ඇති ක්‍රීඩාංගනයේ වතුර බැස්ම සිදු නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ක්‍රීඩාංගනය ප්‍රාදේශීය සභාවට පවරා දීමට කටයුතු කර නොමැති බැවින් අවශ්‍ය සංවර්ධනය කිරීම් සිදු කර එය පවරා දීමට කටයුතු කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.4.3 නිවාස ආධාර මුදල් ලබා දීම

අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ආධාර මුදල් ලබා දීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරගෙන නාගරික මට්ටමේ ඇති අඩක් නිම කර ඇති නිවාස වෙනුවෙන් ආධාර ලබා දීමට හැකියාවක් ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 4.4.4 මාලබේ ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලය සඳහා ක්‍රීඩාංගනයක් ලබා දීම

මාලබේ ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලය විසින් භාවිතා කරන හල්බරාවේ ක්‍රීඩාංගනය මෙම විද්‍යාලයට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.
මෙම ක්‍රීඩාංගනය පිහිටි ඉඩම පොද්ගලික ඉඩමක් බැවින් ඔවුන්ට වෙනත් ඉඩමක් ලබා දීමෙන් එම ක්‍රීඩාංගනය මෙම විද්‍යාලය සඳහා ලබා ගත හැකි බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 4.4.5 කොතලාවල බෞද්ධ සමාධි මධ්‍යස්ථානයේ ගොඩනැගිලි ඉවත් කරන ලෙස දැනුම් දීම

කොතලාවල බෞද්ධ සමාධි මධ්‍යස්ථානයේ ඇතැම් ගොඩනැගිලි අනුමත කර නොමැති බව දක්වමින් ඒවා ඉවත් කර ගන්නා ලෙස දැනුම් දී ඇති බැවින් ඒ සඳහා යම් විසඳුමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම බෞද්ධ මධ්‍යස්ථානයේ සැලසුම කඩුවෙල නගර සභාව මගින් අනුමත කර ගැනීමෙන් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැකි බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

කඩුවෙල නගර සභාව මේ සඳහා මැදිහත් නොවන බැවින් නාගරික සංවර්ධන අධිකාරියට මැදිහත් වී අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ගරු ජගත් කුමාර මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම බෞද්ධ මධ්‍යස්ථානයෙන් ඉවත් කරන ලෙස නඩු තීන්දුව ලැබී ඇති කොටස ඉවත් කිරීමෙන් පසු ඉතිරි ගොඩනැගිලි සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා දිය හැකි බව ඔහු විසින් දැනුම් දෙන ලදී.

**4.5 කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ ජනතාවට ඵලදායී සේවාවක් ලබා දීම - ගරු යදාමිණී ගුණවර්ධන මහතා**

කොළඹ මහ නගර සභාව විසින් ලබා දෙන සේවාවන්වල කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බවත් සීමිත පිරිසක් සහ ප්‍රදේශයක් සඳහා පමණක් සේවාවන් සැපයීම සිදු කරන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නාගරික සංවර්ධන අධිකාරිය සහ නිවාස සංවර්ධන අධිකාරිය හා සම්බන්ධ වූ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, නාගරික ජනාවාස සංවර්ධන ව්‍යාපෘතිය සහ ජනතාව වෙනුවෙන් යටිතල පහසුකම් ලබා දීමට පැවති කාර්යාංශය වැනි ආයතන නැවත ක්‍රියාත්මක කරන ලෙස ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ පොදු මහජන අවශ්‍යතා සම්බන්ධයෙන් සංඛ්‍යාලේඛන හා දත්ත ලබා දිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පාසැල් සහ නගර සභා ක්‍රීඩාංගණ, නිවාස ව්‍යාපෘතිවල නිවාස ආශ්‍රිතව ඇති විවේකී ස්ථාන සංවර්ධනය කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ සංඛ්‍යාලේඛන හා දත්ත ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලීමක් කරන ලදී.

කොළඹ නගරය සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය මගින් මෑත කාලයේදී සිදු කළ සමීක්ෂණවල ප්‍රතිඵල හා මෙතෙක් සිදු කළ සංවර්ධන කටයුතු පිළිබඳව දීර්ඝ විස්තරයක් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කරන ලදී.

නැවත පදිංචි කිරීම මේ වනවිට විධිමත් ලෙස සිදු කරන බවද නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**4.6 ගරු අලි සබ්රි රහීම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**4.6.1 පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් නිවාස ලබා ගැනීම**

පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් මේ වනතෙක් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නිවාස ලබා දීමේ ක්‍රියාවලිය සම්පූර්ණ විනිවිදභාවයකින් ක්‍රියාත්මක වන බවත් ග්‍රාම නිලධාරී වසම් තෝරා ගැනීමේදී ජීවත්වීමට නුසුදුසු නිවාස සඳහා අනිවාර්යයෙන්ම නිවාස ලබා දෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.6.2 නොරොච්චෝලේ ආර්ථික මධ්‍යස්ථානය

නොරොච්චෝලේ ආර්ථික මධ්‍යස්ථානයේ ඇති පහසුකම් ඉතා පහළ මට්ටමක පවතින බැවින් එම කටයුතු කඩිනම් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.7 මොරොන්තුඩුව නගර සංවර්ධන සැලසුම - ගරු ජයන්ත සමරවීර මහතා

මෙරොන්තුඩුව නගර සංවර්ධන සැලසුම ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී. මෙහි බස් නැවතුම්පළ ඉදි කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙය ක්‍රියාත්මක වෙමින් පවතින බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

දැනට ආරම්භ කර ඇති නගර සංවර්ධන සැලසුම් සහ යෝජිත නගර සංවර්ධන සැලසුම් සම්බන්ධ ප්‍රගතිය පිළිබඳ ඉදිරිපත් කිරීමක් මීළඟ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 4.8 කොම්පඤ්ඤවීදිය - වැකන්ද ප්‍රදේශයේ පිහිටි අබලන් මහල් නිවාස සංකීර්ණය - ගරු මුජිබුර් රහුමාන් මහතා

කොම්පඤ්ඤවීදිය - වැකන්ද ප්‍රදේශයේ පිහිටා ඇති නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට අයත් නිවාස 21කින් යුත් ඉතා පැරණි මහල් නිවාස සංකීර්ණය අබලන් තත්ත්වයේ පවතින බැවින් ඒවායේ පදිංචිකරුවන් එම ස්ථානයෙන් ඉවත් කර වෙනත් ස්ථානයක් ලබා දිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා හේනේමුල්ල ප්‍රදේශයෙන් නිවාස ලබා දීමට 2017 වර්ෂයේදී ලබා ගත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව එම නිවාස මෙම ජනතාව සඳහා වෙන් කර ඇති බව නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.
මෙම නිවාසවල පදිංචිව සිටින ජනතාවට ස්ථිර ඔප්පුද හිමි බැවින් ඔවුන් අඩු කුලී ආදායම් නිවාසවල පදිංචි වීමට අකමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

කොම්පඤ්ඤවීදියේ මෙම නිවාස සංකීර්ණය පිහිටා ඇති ඉඩමෙහි යෝජිත නව නිවාස ඉදිකරන තෙක් මෙම ජනතාවට තාවකාලිකව හේනේමුල්ල ප්‍රදේශයේ පදිංචිවන ලෙස දැනුම් දෙන ලෙස රාජ්‍ය අමාත්‍ය, ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා විසින් දැනුම් දෙන ලදී.

### 4.9 එරාවූර්හි ආරම්භ කරන ලද ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම - ගරු නසීර් අහමඩ් මහතා

මීට වසර හතරකට පමණ පෙර ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව විසින් එරාවූර්හි ඉදි කිරීම් ආරම්භ කරන ලද පොදු වෙළඳපොළ, සංස්කෘතික මධ්‍යස්ථානය සහ

පුස්තකාලයට අදාළ ඉදි කිරීම් කටයුතු මේ වනතෙක් අවසන් කර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.10 ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.10.1 ව්‍යායාම මංතීරු සකස් කිරීම

ව්‍යායාම මංතීරු සකස් කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගෙන් ලබා ගත් යෝජනා අනුව ගිරිතලේ සඳහා ව්‍යයාම මංතීරුවක් ලබා දෙන ලෙස තමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 4.10.2 හිඟුරක්ගොඩ සහ බකමූණ නගර සංවර්ධන සැලැසුම්

හිඟුරක්ගොඩ සහ බකමූණ නගර සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක නොවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමන්ලා විසින් ඉදිරිපත් කර ඇති නගර සංවර්ධන සැලසුම් සම්බන්ධ යෝජනා ඉදිරියේදී ක්‍රියාත්මක වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.10.3 හෝටල් පාසලක් සඳහා පොළොන්නරුව සංචාරක මධ්‍යස්ථානය ලබා ගැනීම

හෝටල් පාසලක් සඳහා ඉල්ලා ඇති නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකර ඇති පොළොන්නරුව සංචාරක මධ්‍යස්ථානය පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.10.4 කදුරුවෙල නගර සංවර්ධන සැලැසුම ක්‍රියාත්මක කිරීමේදී එහි ජනතාවට වන්දි නොලැබීම

කදුරුවෙල නගර සංවර්ධන සැලැසුම ක්‍රියාත්මක කිරීමේදී එහි ජනතාවට වන්දි ලබා දීමේ කටයුතු සිදු වී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.10.5 පොළොන්නරුව පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල

පොළොන්නරුව පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ල සඳහා ඉදිරිපත් කර ඇති කුලී මුදල ඉහළ අගයක් ගන්නා බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.10.6 හිඟුරක්ගොඩ ඉදි කිරීමට යෝජිත මහල් නිවාස සංකීර්ණය

හිඟුරක්ගොඩ ඉදි කිරීමට යෝජිත මහල් නිවාස සංකීර්ණය සඳහා වෙන් කර ඇති ඉඩමෙහි පොලිස් අධිකාරි කාර්යාලයක් පවත්වාගෙන යන බවත් එම ඉඩම මෙම කාර්යය සඳහා පවරා දීමේ කටයුතු සිදුවී නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.11 ගරු ඉෂාක් රහුමාන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.11.1 කැකිරාව දෙමළ ගම්මානයේ ජනතාව වෙනුවෙන් වැසිකිළි පහසුකම් ලබා දීම

කැකිරාව පිහිටි දෙමළ ගම්මානයේ ජනතාව වෙනුවෙන් වැසිකිළි පහසුකම් නොමැති බව දැනුවත් කිරීමෙන් පසු අදාළ නිලධාරීන් විසින් පියවර ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්තූතිය පළ කරන ලදී.

### 4.11.2 අනුරාධපුර දිස්ත්‍රික්කයේ නීලාවී ගම්මානයේ නිවාසවල ඇති අඩුපාඩු

අනුරාධපුර දිස්ත්‍රික්කයේ නීලාවී ගම්මානයේ ජනතාව සඳහා වැසිකිළි පහසුකම් නොමැති බවත් මෙම ජනතාවගේ නිවාසවල අඩුපාඩු බොහෝමයක් ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට අදාළ තොරතුරු නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී. ඒ අනුව, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලබන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.12 ගරු මංජුලා දිසානායක මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.12.1 දැයට කිරුළ වැඩසටහන යටතේ සිදුකළ ඉදිකිරීම් සඳහා ගෙවීම් නොකිරීම

2013 වසරේ දැයට කිරුළ වැඩසටහන යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිදු කරන ලද ඉදිකිරීම් සඳහා පසුගිය කාලයේදී මුදල් ගෙවීම අත්හිටුවා තිබූ බැවින් එම ගෙවීම් කඩිනම් කිරීමට පියවර ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.12.2 දොඩම්ගස්ලන්ද ආසනයේ විහාරස්ථාන කිහිපයක ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු

දොඩම්ගස්ලන්ද ආසනයේ විහාරස්ථාන කිහිපයක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති නමුත් එය සිදු නොවන බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී.

මෙම කටයුතු සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමා විසින් තීන්දුවක් ගන්නා බව දැනුම් දී ඇති බැවින් මෙම කරුණු ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.13 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.13.1 "කැළණිවැලි සංචාරක කොරිඩෝව" ව්‍යාපෘතිය (Kelaniweli Tourism Corridor)

"කැළණිවැලි සංචාරක කොරිඩෝව" ව්‍යාපෘතිය (Kelaniweli Tourism Corridor) ක්‍රියාත්මක කිරීමේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සහයෝගය බලාපොරොත්තු වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.13.2 රුවන්වැල්ල නගරයේ ඇති පොලිස් ස්ථානය වෙනත් ස්ථානයක ස්ථාපනය කිරීම

පැරණි සංචාරක තානායමක ස්ථාපිත රුවන්වැල්ල පොලිස් ස්ථානය වෙනත් ස්ථානයක ස්ථාපනය කර එම තානායම සංචාරක ආකර්ශනය ඇති කළ හැකි ස්ථානයක් බවට සංවර්ධනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.13.3 රුවන්වැල්ල තල්දූවේ පිහිටි කැළණිවැලි ක්‍රීඩාංගනය

රුවන්වැල්ල තල්දූවේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය සතු කැළණිවැලි ක්‍රීඩාංගනය මේ වනවිට අවිධිමත් තත්ත්වයේ ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තවද මෙම ස්ථානයේ භූගත මැණික් ඇති බැවින් මැණික් සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය සහ පළාත් පාලන ආයතන එකතු වී මෙම ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.13.4 දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණය

දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මධ්‍යම පාන්තික නිවාස සංකීර්ණය ඉදි කිරීම සඳහා භූමි ප්‍රමාණයක් වෙන් කර ගෙන ඇති බැවින් මෙම නිවාස ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ඉදිරියේදී ගරු මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

රුවන්වැල්ල නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති බවත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කෙරෙන බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**5** කාරක සභාව ප.ව.12.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 මාර්තු 24**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (සභාපති)
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු මහින්ද අමරවීර මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ජගත් පුෂ්පකුමාර මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු වරුණ ප්‍රියන්ත ලියනගේ මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු මුදිතා ප්‍රශාන්ති මහත්මිය
ගරු සුදත් මංජුල මහතා
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු තවරාජා කලෙයි අරසන් මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය

**1. කාර්ය සටහන්වලින් පැන නගින කරුණු**

**1.1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල පදිංචි ජනතාවට එම ඉඩම් කට්ටි කර බෙදා දීම - ගරු මිලාන් ජයතිලක මහතා**

මේ වනවිට චක්‍රලේඛය නිකුත් කර ඇති බව අතිරේක ලේකම් (ඉඩම්) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.2 ගම් මට්ටමින් සිටින ව්‍යවසායකයින් දිරිගැන්වීම සම්බන්ධයෙන් ඇති වැඩසටහන - ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**

අයදුම්පත් භාර ගැනීමේ දිනය දීර්ඝ කර ඇති බව ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ව්‍යවසායකයන්ට ඉඩම් ලබාදීමේදී දිස්ත්‍රික් සංවර්ධන කමිටුව සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

**1.3 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉඩම් මැනුම් කටයුතු සඳහා ඉහළ ගාස්තු අයකිරීම - ගරු මායාදුන්න චින්තක අමල් මහතා**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව ගෙවීම් කටයුතු සිදුකරන බවත්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි මිනින්දෝරුවරුන් විසින් මැනුම් කටයුතු කරන බවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

දිස්ත්‍රික් කාර්යාලවල අධ්‍යක්ෂවරයකුගේ හෝ ක්ෂේත්‍ර නිලධාරියකුගේ මැදිහත් වීමෙන් මුදල් අයකරගැනීමේ ක්‍රමවේදයක් සැකසීමට අපේක්ෂා කරන බවත්, මැනුම් කටයුතුවලට අය කරන ගාස්තු සම්බන්ධ චක්‍රලේඛය සංශෝධනය කිරීමේ හැකියාව පිළිබඳව මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා සාකච්ඡා කරන බවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් තවදුරටත් කාරක සභාවට දැනුම් දෙන ලදී.

**1.4 හිනිදුම ප්‍රදේශය තුළ ඇති ඉඩම් ගැටළු - ගරු සම්පත් අතුකෝරල මහතා**

කාර්ය මණ්ඩල හිඟය හේතුවෙන් නව කාර්යාල ආරම්භ කිරීම ගැටළුවක් වී ඇති බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.
මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට දැනුම් දෙන ලදී.

**1.5 මන්නාරම අලකට්ටුකර ප්‍රදේශයේ අටසිය දෙනෙකුට ඉඩම් ඔප්පු ලබාදීම - ගරු කේ. කාදර් මස්තාන් මහතා**

මන්නාරමේ කාර්යාලයක් විවෘත කිරීමට කටයුතු කරන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

කඩිනමින් එම කාර්යාලය විවෘත කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

**2. වෙනත් කරුණු**

**2.1 ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**2.1.1 ඉඩම් ඔප්පු ලබාදීම කඩිනම් කිරීම**

ඉඩම් ඔප්පු ලබා නොදුන් විශාල පිරිසක් තම ප්‍රදේශයේ සිටින බව ගරු රෝහණ දිසානායක මහතා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

“ඉඩම් කොමිසම ගමට” ජංගම වැඩසටහන යටතේ එම කටයුතු කඩිනම් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිට උපදෙස් ලබා දෙන ලදී.

#### 2.1.2 රත්වත්ත වත්ත ඉඩම සංවර්ධනය කිරීම

අක්කර 150ක පමණ විශාල මෙම ඉඩම ඵලදායී කටයුත්තකට යොදවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවෙන් ඉල්ලීමක් කරන ලදී.

මෙම ඉඩම ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩමක් බැවින් එම ආයතනය හා සාකච්ඡා කර සුදුසු පියවර ගන්නා බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලිඛිතව දැනුම් දී එම ඉඩම ලබාගෙන ගම් පුළුල් කිරීමේ වැඩසටහනට යොදාගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

#### 2.1.3 මාතලේ උකුවෙල හා කන්දෙනුවර ප්‍රදේශවල පොලිස් ස්ථාන ස්ථාපිත කිරීම සඳහා ඉඩම් දෙකක් ලබාගැනීම

අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 2.2 ගරු වරුණ ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 2.2.1 පැල්මඩුල්ල පොලීසියට අයත් ඉඩම සම්බන්ධ ගැටළු

පොලීසිය සඳහා වෙන් කළ ඉඩම අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති බැවින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ පුද්ගලයාට විරුද්ධව පොලීසියේ පැමිණිල්ලක් සටහන් කර ඇති බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම පුද්ගලයාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

#### 2.2.2 ගම් පුළුල් කිරීම යටතේ අත්පත් කරගත් ඉඩම් අයථා පරිහරණය

මෙම ඉඩම් නීති විරෝධීව අත්පත් කරගෙන ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ව්‍යාජ ලේඛන සැකසීම හා නීති විරෝධී ක්‍රියාවල යෙදීම හේතුවෙන් එම පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.2.3 දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට හා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නිලධාරියකු සහභාගී කරවීම

මෙම කමිටු රැස්වීම්වලට නිලධාරියකු සම්බන්ධ කරගැනීමේ අවශ්‍යතාවය ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම කමිටු රැස්වීම්වලට දිස්ත්‍රික් අධ්‍යක්ෂවරයා හෝ වෙනත් නිලධාරියකු යැවීමට කටයුතු කරන ලෙස දැනුම් දෙමින් ලිපියක් යවා ඇති බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.3 ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.3.1 මන්නාරම දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයට ගණකාධිකාරීවරයකුගේ සේවය ලබා ගැනීම

මන්නාරම කාර්යාලයට ගණකාධිකාරීවරයකු ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ගණකාධිකාරීවරයකුගේ සේවය මේ වනවිට ලබා දී ඇති බව අතිරේක මැනුම්පති (මධ්‍යම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.3.2 කැලෑ ඉඩම් නිදහස් කරගැනීම

කැලෑ ඉඩම් නිදහස් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

වන සංරක්ෂණ හා වනජීවී දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් මෙම ගැටළුව විසඳීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.4 කිලිනොච්චි දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණය සිතියම්ගත කිරීම - ගරු එස්. ශ්‍රීතරන් මහතා

ඉඩම් සිතියම් ගතකිරීමේදී සාන්දපුරම් ග්‍රාමය මුලතිව් පරිපාලන ප්‍රදේශයට අයිති වී ඇති බැවින් සාන්දපුරම් ග්‍රාමයේ ජනතාවට පරිපාලන කටයුතු ඉටුකරගැනීම සඳහා කි.මී 04 ක දුරින් ඇති කිලිනොච්චිය නගරය වෙනුවට කි.මී 40 ක දුරින් ඇති මුලතිව් වෙත යෑමට සිදුවන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව පරිපාලන කටයුතු සම්බන්ධයෙන් සාන්දපුරම් ග්‍රාමය කිලිනොච්චිය සමග සම්බන්ධ කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කිලිනොච්චිය නගරයේ මුරුගන්ඩි දුම්රිය දෙපාර්තමේන්තුවටත් ඒ9 පාරටත් අතර ඇති කුඩා ප්‍රදේශයත් යාපනය සහ මුලතිව් දිස්ත්‍රික්ක සම්බන්ධ කරන කි.මී. 6ක් දිග මුහුදු වෙරළ ප්‍රදේශයත් කිලිනොච්චිය පරිපාලන ප්‍රදේශයට යටත්කරන ලෙසද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණු ඉඩම් අමාත්‍යාංශයට අයත් නොවන බැවින් සීමානිර්ණය කොමිෂන් සභාවට ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.5 ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.5.1 ඔළුවිල් ප්‍රදේශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් නිදහස් කර ගැනීම

ක්‍රීඩාංගණයක් සඳහා ඉඩම් නිදහස් කර බලපත්‍ර ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම ඉඩම් නිදහස් කරදීමට කඩිනම් පියවර ගන්නා බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.5.2 පොතුවිල් ප්‍රදේශයේ ඉඩම් ගැටළු විසඳීම සඳහා කටයුතු කිරීම

මෙම ප්‍රදේශයේ ඉඩම් ගැටළු විසඳීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉඩම් කච්චේරි රැස්වීමක් පවත්වා ගැටළු විසඳීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.6 ගරු අලි සබ්රි රහීම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.6.1 පුත්තලම ප්‍රදේශයේ සහ කල්පිටිය ප්‍රදේශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි ඉඩම්වල පදිංචි ජනතාවට ඉඩම් අයිතිය ලබාදීම

මෙම ඉඩම්වල අයිතිය පදිංචි ජනතාවට ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම ජනතාවට මන්නාරම ප්‍රදේශයේද ඉඩම් අයිතිය ඇත්නම් තවත් ඉඩම් අයිතියක් ලබාදීම නුසුදුසු බව ගරු චාල්ස් නිර්මලනාදන් මහතා විසින්ද දැනුම් දෙන ලදී.

ඉඩම් මැනුම් කටයුතු සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් බඳවා ගැනීමට කටයුතු කරන බැවින් මෙම කටයුතු කඩිනමින් ඉටු කරන බව ගරු සභාපතිතුමා සහ අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

මෙම කරුණ සඳහා ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.6.2 පන්සල් පල්ලිවල ඉඩම් සඳහා ඔප්පු ලබාදීම

එම ඉඩම් සඳහා ඔප්පු නොමැති බැවින් ඔප්පු ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

එම ඔප්පු ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා බවත්, විහාරස්ථ කාරක සභාව සහ විහාරාධිපති නමින් ඔප්පු ලබාදීමට කටයුතු කරන බවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

"විහාරාධිපති" නමින් තනතුරට ඔප්පු ලබාදීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.7 ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.7.1 ඉඩම් අහිමි ජනතාවට රජයේ ඉඩම් ලබාදීමට කටයුතු කිරීම

රජයේ ඉඩම් විශාල ප්‍රමාණයක් ඇති බැවින් ඉඩම් අහිමි ජනතාවට ඉඩම් බෙදා දීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉඩම් කච්චේරි රැස්වීමක් පවත්වා එම ගැටළු විසඳීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

### 2.7.2 "බිම්සවිය" හිමිකම් සහතිකය සඳහා පිළිගැනීමක් ලබා දීම

නිවාස සෑදීමට බලපත්‍ර ලබාදීමේදී බිම්සවිය ඔප්පුව නාගරික සංවර්ධන අධිකාරියේ කමිටුව පිළිනොගන්නා බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී. බිම්සවිය හිමිකම් සහතිකයට පිළිගැනීමක් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුම් දෙමින් නාගරික සංවර්ධන අධිකාරියට චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.7.3 අලවල ප්‍රදේශයේ රජයේ ඉඩමෙන් ජනතාවට ගමන් කිරීමට මාර්ගයක් ලබාදීම

ප්‍රාදේශීය ලේකම් සතු මෙම ඉඩම හරහා මාර්ගයක් ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණු සම්බන්ධව විමර්ශනයක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.8 ගරු මංජුලා දිසානායක මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.8.1 බිම් සවිය මැනුම් කටයුතුවලදී මාර්ගය සටහන් නොකිරීම

දොඩම්ගස්ලන්ද, රිදීගම ප්‍රදේශයේ බිම්සවිය මැනුම් කටයුතුවලදී මාර්ග නිවැරදි ලෙස සටහන් කර නොමැතිවීම හේතුවෙන් ඉඩම්ලාභීන් ගැටළු රාශියකට මුහුණදී ඇති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා සහ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ සභාපතිගේ මැදිහත්වීමෙන් බිම්සවිය මැනුම් කටයුතුවලදී ගැටළු නිරාකරණය කර දීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.8.2 ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි ඉඩම් සඳහා ඔප්පු ලබාදීමේ ප්‍රමාදය

ජනතාවට බෙදා දුන් වරාවල කොලනිය යනුවෙන් හඳුන්වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි ඉඩම් සඳහා මෙතෙක් ඔප්පු ලබාදී නොමැති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ජනතාවට ඔප්පු ලබාදීමට කටයුතු කරන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.9 ගරු මුදිතා ප්‍රශාන්ති මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.9.1 බිම්සවිය හිමිකම් සහතික පත්‍ර ලබාදීමේ ප්‍රමාදය

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බිම් සවිය මැනුම් කටයුතු අවසන් වුවද ඔප්පු ලබා දී නොමැති බව ගරු මන්ත්‍රීතුමිය විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අවශ්‍ය තොරතුරු ලබා දෙන්නේ නම් පරීක්ෂා කර බලා අවශ්‍ය පියවර ගන්නා බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.9.2 ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි ඉඩම ජනතාවට බෙදාදීම

එම ඉඩම ජනතාවට බෙදාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

ගම් පුළුල් කිරීම යටතේ බෙදා දීමට හැකි බැවින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.10 ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.10.1 මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දිස්ත්‍රික් කාර්යාලයට වාහනයක් ලබා ගැනීම

දිස්ත්‍රික් කාර්යාලවලට වාහන ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන අනුව යම් ක්‍රමවේදයකට වාහන ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් ද ඉල්ලීමක් කරන ලදී.

### 2.10.2 ඉඩම් මැනුම් කටයුතු කඩිනම් කිරීම

ජංගම සේවයක් යොදා ගෙන හෝ ඉඩම් මැනුම් කටයුතු කඩිනම් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බලයලත් මිනින්දෝරුවන් යොදාගෙන නව තාක්ෂණය ඔස්සේ ඉඩම් මැනුම් කටයුතු කඩිනම් කිරීම සඳහා නියාමක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇති බව අතිරේක මැනුම්පති (මධ්‍යම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.11 නාත්තන්ඩිය නගරයේ පිහිටි වීදුරු කර්මාන්තයට වෙන් කළ භූමිය සංවර්ධන කටයුත්තකට යොදා ගැනීම - ගරු අශෝක ප්‍රියන්ත මහතා

මෙම ඉඩම බෙදා වෙන් නොකර මුළු ඉඩමම සංවර්ධන සැලසුමකට ඇතුළත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ට උපදෙස් දෙන ලදී.

## 2.12 ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.12.1 ජයභූමි සහ ස්වර්ණභූමි ඔප්පුවල අවම බෙදුම් සීමාවට අනුව නව ඔප්පු ලබාදීම

එම ඉඩම් වල අවම බෙදුම් සීමාව වෙනස් වී ඇති බැවින් පැරණි ඔප්පු අවලංගු කර නව ඔප්පු ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. අළුතින් ඔප්පු ලබාදීමේදී ගැටළුකාරී තත්ත්වයක් පැන නැඟී ඇති බැවින් ඒ පිළිබඳව මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඔප්පු ලබාදීමට කටයුතු කරන බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.12.2 බලයලත් මිනින්දෝරුවන් විසින් කරන මැනුම් සඳහා පිළිගැනීමක් ලබාදීම

බලයලත් මිනින්දෝරුවන් විසින් කරන මැනුම් කටයුතු ප්‍රාදේශීය ලේකම් විසින් පිළිනොගන්නා බැවින් ඒවාට පිළිගැනීමක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රාජ්‍ය ඉඩම් මැනීමේදී දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ යටතේ සිදුකරන බවත්, පෞද්ගලික ඉඩම් මැනීමේදී අධීක්ෂණයක් සිදු නොවන බවත් අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

බලයලත් මිනින්දෝරුවන් විසින් කරන මැනුම්වල ගැටළුකාරී තත්ත්වයක් නොමැති නම් එය පිළිගන්නා බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.12.3 මොණරකැලේවත්ත රබර් වගා කළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි ඉඩම අනවසරයෙන් අත්පත් කරගැනීම

මෙම ඉඩමට අනවසරයෙන් ඇතුල්වීම් සහ අත්පත් කරගැනීම් සිදුවන බැවින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.13 ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.13.1 ඉඩම් ලබාදී ඇතත් ඔප්පු ලබා නොදීම

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ වට්ටකච්චි, රාමනාදපුරම්, උරුත්තිරපුරම්, අක්කරාජන්, ස්කන්දපුරම් සහ කිලිනොච්චිය අවට ප්‍රදේශවල ජනතාවට ඉඩම් ලබාදී ඇති නමුත් එම ඉඩම්වලට මෙතෙක් ඔප්පු ලබාදී නොමැති බැවින් එම ඉඩම් දරුවන්ට පැවරීමට නොහැකි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම ඉඩම් සඳහා ඔප්පු ලබාදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 2.13.2 පලෙයි ප්‍රදේශයේ ඇති ඉඩම් වෙනත් ප්‍රදේශවල ජනතාවට ලබාදීම

පලෙයි ප්‍රදේශයේ ඇති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් වෙනත් දිස්ත්‍රික්කවල ජනතාවට ලබාදෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

රජයේ ඉඩම් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට සතු ඉඩම් දිස්ත්‍රික්කයේ ජනතාවට බෙදා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

### 2.13.3 මුලතිව් දිස්ත්‍රික්කයේ බටහිර ප්‍රදේශයේ ඇති අක්කර 2200 ක් සඳහා ඔප්පු ලබාදීම

මුලතිව් දිස්ත්‍රික්කයේ බටහිර ප්‍රදේශයේ ඇති අක්කර 2200 ක් සඳහා ඔප්පු ලබාදී නොමැති බවත් ඉඩම් ඔප්පු ලබාදීමට කටයුතු කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් ගැටළුවලට විසඳුම් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.14 ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.14.1 කල්පිටිය ප්‍රදේශයේ ජනතාවට සුදුසු ඉඩම් ලබාදීම

ප්‍රදේශයේ හඳුනාගත් සුදුසු ඉඩම් තිබේනම් දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

### 2.14.2 දීමනාපත්‍රලාභීන් සඳහා යම් ක්‍රමවේදයක් අනුගමනය කිරීම

මේ සම්බන්ධයෙන් යම් ක්‍රමවේදයක් අනුගමනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අදාළ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත බැවින් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 2.15 රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පළාත් පාලන මාර්ග සහ ජනපද මාර්ගවල ගැටළු - ගරු සුදත් මංජුල මහතා

මායිම් නිරවුල් නොවීම මෙම ගැටළුවලට හේතු වී ඇති බැවින් බිම්සවිය වැඩසටහන යටතේ මැනුම් සිදුකර මෙම ගැටළු නිරාකරණය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

කාර්ය මණ්ඩල ගැටළුව හේතුවෙන් මෙම කටයුතු ඉටු කිරීම ප්‍රමාද වන බව හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ප්‍රදේශයේ බිම්සවිය කාර්යාලයක් ආරම්භ කිරීමට විමර්ශනයක් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 2.16 තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් සඳහා ඔප්පු ලබා නොදීම - ගරු තවරාජා කලෙයි අරසන් මහතා

මෙම ප්‍රදේශයේ ඉඩම් සඳහා ඔප්පු ලබා දී නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

## 2.17 ගරු කාදර් මස්තාන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 2.17.1 මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෙදා දුන් රජයේ ඉඩම්වලට ඔප්පු ලබා නොදීම

අවශ්‍ය නම් ලැයිස්තු ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දුන් අතර පියවර ගන්නා ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

### 2.17.2 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා ඉඩම්වල පදිංචි ජනතාවට ඔප්පු ලබාදීම

පෙරියකාමම්, සිල්වෙහෙර, තලෙයිමන්නාරම, පේසාලෙ පිහිටි ඉඩම් සඳහා ඔප්පු ලබාදීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ඉඩම් කච්චේරි රැස්වීම් පවත්වා මෙම ගැටළු විසඳීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එම ප්‍රදේශයට ගොස් පරීක්ෂා කර අවශ්‍ය පියවර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිට සහ ඉඩම් කොමසාරිස් ජනරාල්ට උපදෙස් ලබා දෙන ලදී.

**2.18 ඔක්කම්පිටිය ජනපදයේ ජනපද නිලධාරී නිල නිවස එලදායී කටයුත්තකට යොදා ගැනීම - ගරු ජගත් පුෂ්ප කුමාර මහතා**

ගරා වැටී ඇති මෙම නිල නිවාස එලදායී කටයුත්තකට යොදාගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

බිම්සවිය කාර්යාලයක් ඇරඹීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට දැනුම් දෙන ලදී.

**3.** කාරක සභාව ප.ව.3.45 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ**
**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 අප්‍රේල් 7**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා (සභාපති)
ගරු රොෂාන් රණසිංහ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු නසීර් අහමඩ් මහතා
ගරු සුදත් මංජුල මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු ඩී. බී. හේරත් මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු එම්. රාමේෂ්වරන් මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු මධුර විතානගේ මහතා
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

සලකා බැලීමෙන් අනතුරුව, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තාවට එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කළාය.

**1.1** 2017 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව

**2. 2020. 11. 23 දින පැවති රැස්වීමේ කාර්ය සටහන් වලින් පැන නඟින කරුණු**

**2.1 පළාත් පාලන ආයතන වල තනතුරු වල පවතින පුරප්පාඩු - ගරු මධුර විතානගේ මහතා**

පළාත් පාලන ආයතන වල පරිපාලන සේවයේ පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා සිටින ලදී.

පරිපාලන සේවා නිලධාරීන්, ගණකාධිකාරීවරුන් සහ ඉංජිනේරු නිලධාරීන්ගේ පත්වීම් ඉක්මණින් ලබා දීමට හැකි බවත් ලබන වසරට අදාළ පත්වීම් සඳහා ද විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන බවත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දැනුම් දෙන ලදී.

**2.2 පළාත් පාලන ආයතන අලුතින් පිහිටුවීම සහ පවතින පළාත් පාලන ආයතන නගර සභා බවට පත් කිරීම - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා**

කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අවශ්‍ය ප්‍රදේශ තීරණය කර නිර්දේශ ඉදිරිපත් කරන ලෙස පළාත් ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**2.3 උතුරු පළාතේ ප්‍රාදේශීය සභා හතරක් අලුතින් පිහිටුවීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා**

පළාත් පාලන ආයතන වල විරෝධය සහ දේශපාලනික ප්‍රශ්න හේතුකොටගෙන යම් ප්‍රමාදයක් පවතින බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දැනුම් දෙන ලදී.

අලුතින් පළාත් පාලන ආයතන පිහිටුවීම සඳහා අතිරේක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් අවශ්‍ය වන බැවින් පවතින වසංගත තත්වය හේතුවෙන් මෙය තාවකාලිකව නතර කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

කැකණදුර, සිල්වඩේල්වත්ත, ''චතුරි'' යන ලිපිනයෙහි පදිංචි ඩබ්. පී. ටී. අබේගුණවර්ධන මහත්මිය විසින් තම ඉඩමට කාණුවක් සම්බන්ධ කිරීමෙන් ඇති වූ තත්වය සම්බන්ධයෙන් කළ ඉල්ලීම
**(ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 28)**

මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ වාර්තාව ගරු මන්ත්‍රීතුමා වෙත යවා ඇති බව කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4. වෙනත් කටයුතු

### 4.1 ගරු අජිත් රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.1.1 දකුණු පළාත් සභාවේ සේවකයින් ස්ථිර කිරීම

දකුණු පළාත් සභාවේ අනුමත සේවක සංඛ්‍යාව තුළ බඳවාගත් දහසකට ආසන්න සේවක පිරිසකට මුදල් අමාත්‍යාංශයේ විරෝධතාවයක් නිසා ගැටළුවක් ඇතිවූ බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම කරුණ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා සිටින ලදී.

### 4.2 ගරු කුමාරසිරි රත්නායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.2.1 ප්‍රාදේශීය සභා ලේකම්වරු ලෙස සංවර්ධන නිලධාරීන් හට පත්වීම් ලබාදීම

මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා නවයක ලේකම්වරු ලෙස වැඩ බලන සංවර්ධන නිලධාරීන් එම තනතුරු වල ස්ථිර කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 4.2.2 මොණරාගල ප්‍රාදේශීය සභාව සඳහා ගිනි නිවන රථයක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම

මොණරාගල ප්‍රාදේශීය සභාවේ ගිනි නිවීමේ ඒකකය සඳහා ගිනි නිවන රථයක් සහ අනෙකුත් පහසුකම් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 4.2.3 මොණරාගල සහ කතරගම නගර සභාවන් බවට පත් කිරීම

මොණරාගල සහ කතරගම පළාත් පාලන ආයතන නගර සභා බවට පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

පවතින වාතාවරණය සහ මූල්‍ය ගැටළු නිසා මෙය තාවකාලිකව නතර කර ඇති බව අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

## 4.3 ගරු ගුණතිලක රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.3.1 පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ රියදුරු සහ කාර්යාල සහායක තනතුරු සඳහා බඳවාගැනීම් නැවැත්වීම

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව සඳහා රියදුරු සහ කාර්යාල සහායක තනතුරු සඳහා බඳවා ගැනීම් නතර කර රැකියා ලක්ෂයේ වැඩසටහනෙන් බඳවාගන්නා පිරිසගෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුවී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.3.2 අකුරණ නගර සභාවක් බවට පත් කිරීම

අකුරණ ප්‍රාදේශීය සභාව නගර සභාවක් බවට පත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

### 4.3.3 හාරිස්පත්තුව ආසනය නැවත සීමා නිර්ණය කරන ලෙස ඉල්ලීම

ප්‍රාදේශීය සභා තුනකින් සමන්විත හාරිස්පත්තුව ආසනය සතු ප්‍රදේශය නැවත සීමා නිර්ණය කරන ලෙසත් බහු ආසනයක් ලෙස නම් කිරීම හෝ කොට්ඨාශ තුනකට බෙදා වෙන් කරන ලෙසත් ගරු මන්ත්‍රිතුමා විසින් ඉල්ලා සිටින ලදී.

## 4.4 ගරු මධුර විතානගේ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.4.1 පළාත් පාලන ආයතන වල ප්‍රගති සමාලෝචනය

පළාත් පාලන ආයතන වල ප්‍රගතිය මාසිකව සමාලෝචනය කිරීමට සහ එම ආයතන අධීක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශය මූලික කරගෙන ක්‍රමවේදයක් සකස් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පළාත් පාලන ආයතන වල අධීක්ෂණය භාර වී තිබෙන්නේ පළාත් සභාවලට වන අතර එම ආයතන අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට පළාත් සභා සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරන බව රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සඳහන් කරන ලදී.

### 4.4.2 පළාත් පාලන ආයතන සඳහා මාර්ගගත ක්‍රමයක් හඳුන්වා දීම (Online Platform)

පළාත් පාලන ආයතන සඳහා මාර්ගගත ක්‍රමයක් හඳුන්වා දීමට කටයුතු කිරීම තුළින් වරිපනම් අය කර ගැනීම සහ ව්‍යාපාර අනුමත කර ගැනීම වැනි කාර්යයන් පහසුවෙන් කරගත හැකි බවත් මේ සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ (ICTA) සහාය ලබාගත හැකි බවත් දැනුම් දෙන ලදී.

### 4.4.3 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගරයේ භූමි ප්‍රදේශය නිවැරදි ලෙස සීමා නිර්ණය කිරීම

1985 වසරේ දී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රටේ අගනගරය ලෙස නම් කරමින් පළ කරන ලද ගැසට් පත්‍රය සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභාව ලකුණු කරමින්

පළ කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් නගර සීමාවන් අතර පැහැදිලි වෙනසක් තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් කාරක සභාවේ අවධානයට යොමු කරන ලදී. එමෙන්ම පාර්ලිමේන්තු සංකීර්ණයට අයත් ගොඩනැගිලි නගර සභා බල ප්‍රදේශ කිහිපයකට අයත් බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.5 ගරු වීරසුමන වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.5.1 අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගිනි නිවීමේ ඒකකයක් ලබා ගැනීම

මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගිනි නිවීමේ ඒකකයක් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

## 4.6 ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.6.1 කිලිනොච්චිය සහ යාපනය ප්‍රදේශ වල අළුතින් පළාත් පාලන ආයතන ඇති කිරීම

කිලිනොච්චිය සහ යාපනය ඇතුළු නොයෙකුත් ප්‍රදේශවල ප්‍රාදේශිය සභා, නගර සභා සහ මහානගර සභා වෙන්කිරීමේ කටයුතු මෙතෙක් සිදුකර නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

කිලිනොච්චිය සහ මුලතිව් ප්‍රදේශ සඳහා නගර සභා නොමැති අතර කිලිනොච්චිය සඳහා ප්‍රාදේශිය සභාවක්ද නොමැති බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

තවද, කන්ඩාවලෙයි, ඔඩ්ඩුසුඩ්ඩාන් සහ මරුතන්කර්නි සඳහා ද ප්‍රාදේශිය සභාවක් නොමැති බවත් ඉහත සඳහන් ප්‍රදේශ සඳහා පළාත් පාලන ආයතන ලබාදීමේ ප්‍රගතිය පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

## 4.7 ගරු රෝහණ දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.7.1 මාතලේ මහා නගර සභාවේ සේවක ගැටලුව

මාතලේ මහා නගර සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 516 ක් වන අතර මේ වනවිට 406 ක සේවක සංඛ්‍යාවක් සේවය ලබා දෙන බවත් මීට අමතරව 258 ක සේවක සංඛ්‍යාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

### 4.7.2 ප්‍රාදේශීය සභා වලින් මාර්ග නඩත්තු නොවීම

ප්‍රාදේශීය සභා වලින් දුෂ්කර ගම්මාන වල මාර්ග නඩත්තු නොකිරීම නිසා මාර්ග පටු වී ඇති බැවින් එම මාර්ග පිළිසකර කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.7.3 දීප ව්‍යාප්ත ගස් සිටුවීමේ වැඩසටහනක් පිළිබඳව

අමාත්‍යාංශ චක්‍රලේඛයක් මඟින් සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධ කරගෙන රටපුරා පැළ සිටුවීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම තුළින් එක් දිනක් තුළ පැළ ලක්ෂ ගණනක් සිටුවිය හැකි බවට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

#### 4.7.4 පළාත් පාලන ආයතන වල යන්ත්‍රෝපකරණ වල හිඟකම

පළාත් පාලන ආයතන විසින් මාර්ග සෑදීම, අලුත්වැඩියාව සහ නඩත්තුව ප්‍රමාද වීමට හේතුවක් වන්නේ එම ආයතන සතුව ඇති යන්ත්‍රෝපකරණ වල හිඟකම බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

#### 4.7.5 පළාත් පාලන ආයතන වල ගුණාත්මකභාවය

පළාත් පාලන ආයතන වල ගුණාත්මකභාවය අඩුවී ඇති බැවින් ඒ සඳහා බඳවාගන්නා නිලධාරීන් හට විශේෂ පුහුණුවක් ලබාදිය යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.8 ගරු නසීර් අහමඩ් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.8.1 නැගෙනහිර පළාත් සභාව සඳහා වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන

පළාත් සඳහා වූ විශේෂිත සංවර්ධන ප්‍රදාන (PSDG Fund) යටතේ නැගෙනහිර පළාත් සභාව සඳහා මිලියන 230 ක් අනුමත වී ඇති අතර මෙම මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය වැඩිකර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

#### 4.8.2 නැගෙනහිර පළාත් සභාවේ අනියම් පදනමින් බඳවා ගත් සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම

2015 වසරේදී නැගෙනහිර පළාත් සභාව සඳහා අනියම් පදනමින් බඳවා ගන්නා ලද සේවකයින් 900 ක් පමණ මේ දක්වා ස්ථිර කර නොමැති බැවින් ඔවුන් රැකියා ලක්ෂයේ වැඩසටහනට අන්තර්ග්‍රහණය කිරීමේ හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

#### 4.8.3 පළාත් පාලන ආයතන ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම පිළිබඳව

නැගෙනහිර පළාතේ තිබෙන පළාත් පාලන ආයතන 45 අතුරින් ආයතන 30 ක ගොඩනැගිලි අලුත්වැඩියා කර ඇති බැවින් අනෙකුත් ආයතන 15 හි ගොඩනැගිලි අලුත්වැඩියා කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

#### 4.8.4 මෘතදේහ භූමදානය සඳහා අවශ්‍ය JCB යන්ත්‍රයක් ලබා ගැනීම පිළිබඳව

කොවිඩ් 19 වෛරසය හේතුවෙන් මියයන පුද්ගලයන්ගේ මෘතදේහ භූමදානය සඳහා අවසර ලබාදී ඇති ඔට්ටමාවඩි ප්‍රදේශය අයත් වන එම ප්‍රාදේශීය සභාව සඳහා JCB යන්ත්‍රයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

#### 4.8.5 එරාවූර් නගර සභාව සඳහා අවශ්‍ය වාහන ලබාගැනීම පිළිබඳව

එරාවූර් නගර සභාව සඳහා ට්‍රැක්ටර් රථයක් සහ බැකෝ යන්ත්‍රයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.9 2019 වර්ෂයේ බඳවාගත් උපාධිධාරීන් ස්ථානගත කිරීම පිළිබඳව

2019 වසරේදී බඳවාගත් උපාධිධාරීන් වසර ගණනාවක් රැකියා විරහිතව සිටි උපාධිධාරීන් වන බැවින් අවම වශයෙන් ඔවුන්ට පදිංචි ලිපිනයට ආසන්න ස්ථානයක් නොවුනත් ඔවුන් ජීවත්වන දිස්ත්‍රික්කය තුළ පත්වීම් ලබාදෙන ලෙස ගරු වීරසුමන වීරසිංහ මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පවතින උපාධිධාරී පුරප්පාඩු ප්‍රමාණය පිළිබඳව ගරු අමරකීර්ති අතුකෝරළ මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රදේශයේ පදිංචි උපාධිධාරීන් හට මුලතිවු දිස්ත්‍රික්කයේ පත්වීම් ලබා දීම පිළිබඳව ගරු එච්. නන්දසේන මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්ක වල උපාධිධාරීන් විශාල ප්‍රමාණයකට දිස්ත්‍රික්කයෙන් පිටත පත්වීම් ලබාදී ඇති බැවින් ඔවුන්ගේ පදිංචි ලිපිනය සලකා ආසන්න ස්ථානයක් ලබාදෙන ලෙස ගරු ඩී. බී. හේරත් මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අම්පාර දිස්ත්‍රික්කයේ උපාධිධාරීන් සංඛ්‍යාව සහ එම දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු ප්‍රමාණය පිළිබඳව ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මන්ත්‍රීතුමා විසින් විමසන ලදී. එමෙන්ම මෙම උපාධිධාරීන් ස්ථානගත කිරීමේදී යම් අසාධාරණයක් සිදුවුවහොත් එයින් රජය අපහසුතාවයට පත්වන බව ගරු මන්ත්‍රීවරුන් විසින් වැඩිදුරටත් පෙන්වා දෙන ලදී.

2019 වර්ෂයේ බඳවාගත් උපාධිධාරීන් ස්ථානගත කිරීමේ දී පදිංචි දිස්ත්‍රික්කය ඇතුළත එම පත්වීම් ලබාදීමට කටයුතු කිරීමේ අපහසුතාවයක් පවතින බවත් පුරප්පාඩු සහිත ස්ථානවල පමණක් පත්වීම් ලබාදීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

එසේම ලබා දී ඇති මෙම පත්වීම් 14500 න් 10000 ක පමණ පිරිස කාන්තාවන් බව ද පළාත් සභාවල සේවය ඉල්ලුම් කරන පිරිස් සඳහා තමන් සිටින ප්‍රදේශයේ පත්වීම් ලබාදීමට වැඩි අවස්ථාවක් පවතින බව ද තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.10 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.10.1 පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග පිළිබඳ ගැසට් නිවේදනයේ නෛතිකභාවය

පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග ගැසට් කිරීමේදී මිනුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මායිම් සැලැස්මක් නොමැති වීම නිසා එම ගැසට් නිවේදන වල නෛතිකභාවය අධිකරණය ඉදිරියේ ඔප්පු කිරීමේදී ගැටළු ඇති වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මීට ප්‍රධාන හේතුව වන්නේ මාර්ග මැනීමේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මිනුම් ගාස්තුව ගෙවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පළාත් පාලන ආයතන වලට නොමැති වීම බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සඳහා අදාළ වන නීතිය තුළ සඳහන් වන්නේ මාර්ගය පිළිබඳ ගැසට් කළ යුතු බව පමණක් බවත් එක් එක් පළාත් පාලන ආයතන සාදන අනුනීති මඟින් ගැසට් කළ යුතු ආකාරය දක්වා ඇති බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරිනිය විසින් කාරක සභාවට පැහැදිලි කරන ලදී.

කෑගල්ල ආසනයේ මාර්ග බිම් සවිය වැඩසටහනෙන් මැනුම් කර දිය හැකිද යන්න ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කළහොත් බිම් සවිය වැඩසටහනෙන් මැනුම් කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.10.2 පළාත් පාලන ආයතන ගැන මහජනතාවගේ අප්‍රසාදය

පළාත් පාලන ආයතන පිළිබඳව මහජනතාව තුළ අප්‍රසාදයක් ඇතිවී තිබෙන බැවින් පළාත් පාලන ආයතන වලට ආවේණික වූ විශේෂඥ සේවය සහ පළාත් පාලන සේවය නැවත ස්ථාපිත කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 4.10.3 පළාත් පාලන ආයතන මඟින් ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම

තරුණ ව්‍යවසායකයින් හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධ වී එම ප්‍රදේශ වල ව්‍යාපාරික අවස්ථා හඳුනාගෙන ඒවා තරුණ ව්‍යවසායකයින් හට ලබාදීම සඳහා ජාතික මට්ටමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළ හැකිද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

### 4.10.4 අම්තිරිගල ප්‍රදේශයට බහුකාර්ය ගොඩනැගිල්ලක් ලබා ගැනීම

රුවන්වැල්ල ආසනයේ අම්තිරිගල නගරය සඳහා පුස්තකාල පහසුකම් සහිත බහුකාර්ය ගොඩනැගිල්ලක් සඳහා ඉඩමක් පරිත්‍යාග කර ඇති බැවින් එය මෙම වසරේ මූල්‍ය ප්‍රතිපාදන වලින් සාදා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.10.5 ගලපිටමඩ පෞද්ගලික පොළ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම

ගලපිටමඩ ප්‍රදේශයේ ඇති පෞද්ගලික පොළ ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නොමැති බැවින් ඒ සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගය ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

### 4.10.6 පළාත් ප්‍රධාන ලේකම්වරු කැඳවීම

කාරක සභාව සඳහා පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු කැඳවීමට ඇති හැකියාව පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලදී.

පළාත් පාලන කොමසාරිස්වරුන් සහ පළාත් ප්‍රධාන ලේකම්වරු කැඳවීම සඳහා කාරක සභාව තීරණය කරන්නේ නම් ඒ සම්බන්ධ ඉල්ලීමක් පළාත් ආණ්ඩුකාරවරුන්ට ඉදිරිපත් කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.11 ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.11.1 කුලියාපිටිය නගර සභාව, මහානගර සභාවක් කිරීම

කුලියාපිටිය නගර සභාව, මහානගර සභාවක් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් මෙහි වර්තමාන තත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

කුලියාපිටිය මහා නගර සභාවක් කිරීම සඳහා වූ යෝජනාව සම්බන්ධයෙන් දිස්ත්‍රික් කමිටු නිර්දේශ ලැබී නොමැති බව රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් ප්‍රභාත් අබේවර්ධන මහතා විසින් දැනුම් දෙන ලදී.

## 4.12 ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.12.1 ප්‍රාදේශීය සභා සඳහා අවශ්‍ය රථවාහන ලබාගැනීම

අකුරැස්ස ආසනයේ අකුරැස්ස, මාලිම්බඩ සහ අතුරලිය යන ප්‍රාදේශීය සභා සඳහා ජේසීබී (JCB) රථ, මෝටර් රෝවර්, ට්‍රැක්ටර් රථ සහ ගිනි නිවන රථයක් ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී

රාජ්‍ය අමාත්‍යාංශය විසින් පළාත් පාලන ආයතනවල සියලුම වාහන අවශ්‍යතා පිළිබඳ ලැයිස්තුවක් ප්‍රවාහන අමාත්‍යතුමා හට ලබාදීම සඳහා පිළියෙළ කරන බවත් නුදුරේදීම මෙම අවශ්‍යතාවය සපුරා දීමට කටයුතු කරන බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 4.12.2 පළාත් පාලන ආයතනවල කාර්මික නිලධාරීන්ගේ හිඟකම

පළාත් පාලන ආයතන වල සේවා සැපයීම සඳහා කාර්මික නිලධාරීන්ගේ අඩුවක් පවතින බව ගරු මන්ත්‍රීතුමා විසින් දන්වා සිටින ලදී.

මෙම ගැටළුව සියලුම පළාත් පාලන ආයතන සතු බැවින් මේ පිළිබඳ සලකා බලන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.13 ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා

### 4.13.1 පළාත් පාලන ආයතන වල ආදායම් වැඩි කර ගැනීම

යටියන්තොට ආසනයේ තිබෙන පළාත් පාලන ආයතන දෙක අඩු ආදායම් ලබන බැවින් එම පළාත් පාලන ආයතන වල ආදායම් වැඩි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.13.2 රථවාහන අවශ්‍යතාවය පිළිබඳව

යටියන්තොට ආසනයේ පළාත් පාලන ආයතන සඳහා ජේසීබී (JCB) රථ සහ බවුසර් රථ ලබාදෙන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.14 ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.14.1 මඩකලපුව නගර සභාව සඳහා නව නාගරික කොමසාරිස්වරයෙක් පත්කරන ලෙස ඉල්ලීම

මඩකලපුව නගර සභාවේ නාගරික කොමසාරිස් සහ නගරාධිපති අතර ගැටළුවක් ඇතිවී තිබෙන බැවින් නගර සභාවේ කටයුතු සහයෝගයෙන් කරගෙන යාම සඳහා අලුත් නාගරික කොමසාරිස්වරයෙක් පත්කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

ගරු ආණ්ඩුකාරතුමිය සමඟ සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 4.15 ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.15.1 වීථි ලාම්පු සවිකිරීම වෙනුවෙන් විදුලිබල මණ්ඩලයට මුදල් ගෙවීමට සිදුවීම

යාපනය දිස්ත්‍රික්කයේ එක් වීථි ලාම්පුවක් (විදුලි බුබුලක්) සවිකිරීම වෙනුවෙන් ප්‍රාදේශිය සභාව විසින් රු. 1500 සිට 2000 අතර මුදලක් විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු බවත් මෙම කරුණ සම්බන්ධයෙන් ගරු මහාමාර්ග අමාත්‍යවරයා සමඟද සාකච්ඡා කරන ලද නමුත් මෙතෙක් විසඳුමක් ලැබී නොමැති බවද ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත සඳහන් ආකාරයේ ගෙවීමක් කළයුතු නොමැති නමුත් වීථි ලාම්පු සවිකිරීම සඳහා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබාගතයුතු බවද කෙසේ වෙතත් මෙම කරුණ සම්බන්ධයෙන් තමා වැඩිදුරටත් සොයා බැලීමට කටයුතු කරන බවද රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දන්වා සිටින ලදී.

### 4.15.2 යාපනය මහා නගර සහා බල ප්‍රදේශය තුළ ජලාපවාහන සැලැස්මක් සකස් කිරීම

යාපනය මහානගර සභා බල ප්‍රදේශය තුළ වර්ෂාපතනය සහ පොළොවේ පිහිටීම සලකා බලා පළාත් පාලන ආයතන අතර සම්බන්ධීකරණයකින් ජලාපවාහන සැලසුම් සකස්කර නොමැති බැවින් ජලාපවාහනය සම්බන්ධ ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.15.3 තෙන්මාරච්චි ප්‍රාදේශීය සභාව බෙදා වෙන් කිරීම

යාපනය දිස්ත්‍රික්කයට අයත් තෙන්මාරච්චි ප්‍රාදේශීය සභාව කොටස් දෙකකට බෙදා වෙන් කළ යුතු බව චාවකච්චේරි සම්බන්ධීකරණ රැස්වීමේදී තීරණයවූ බැවින් එහි ප්‍රගතිය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසා සිටින ලදී.

දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී මේ සම්බන්ධ යෝජනා ඉදිරිපත්කර ඇති බවත් ඒ සඳහා නිර්දේශ ලැබීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත් රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**5.** කාරක සභාව පෙ.ව. 11.55 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

----------------------------------------------------------------------------------------------------

**ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**දෙවැනි රැස්වීම - 2021 අප්‍රේල් මස 08**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා (සභාපති)
ගරු චමල් රාජපක්ෂ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු ටිරාන් අලස් මහතා
ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු දුමින්ද දිසානායක මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු කනක හේරත් මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු සිරිපාල ගම්ලත් මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු ඩී. බී. හේරත් මහතා
ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා
ගරු සූ. නෝගරාදලිංගම් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු නසීර් අහමඩ් මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු උදයන කිරිඳිගොඩ මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු නලින් ප්‍රනාන්දු මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු මායාදුන්න චින්තක අමල් මහතා
ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු අජිත් රාජපක්ෂ මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු ගාමිණී වලේබොඩ මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු මධුර විතානගේ මහතා
ගරු වීරසුමන වීරසිංහ මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු තවරාජා කලෛයි අරසන් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා
ගරු ඩයනා ගමගේ මහත්මිය

**1. කාර්ය සටහන් සහා සම්මත කිරීම**

2020.12.01 දින පැවති ආරක්ෂක කටයුතු පිළබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේ කාර්ය සටහන් සභා සම්මත කරන ලදී.

**2. වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තාවලට කාරක සභාව එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදී.

**2.1.** 2018 වර්ෂය සඳහා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ වාර්ෂික වාර්තාව
**2.2.** 2016 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව
**2.3.** 2017 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව
**2.4.** 2018 වර්ෂය සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තාව
**2.5.** 2015 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන
**2.6.** 2016 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන
**2.7.** 2017 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන

**3. 2020.12.01 දින පැවති රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු**

**3.1 හමුදා කඳවුරු සඳහා මන්නාරම දිස්ත්‍රික්කයේ ඉඩම් අත්පත් කර ගැනීම - ගරු චාල්ස් නිර්මලනාදන් මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.10.1)**

ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරන ප්‍රදේශයේ ශ්‍රී ලංකා යුධ හමුදාව සතු අක්කර 786 ක භූමියේ විවිධ අත්‍යාවශ්‍ය යුධ හමුදා ගොඩනැගිලි පිහිටා ඇති බවත්, නව ඉදිකිරීම් එම භූමියේ නොමැති බවත් යුධ හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

මෙම කඳවුරු භූමිය ආශ්‍රිත ප්‍රදේශය තුළ කෙටි කලකදී යුධ හමුදාව විසින් අත්පත් කරගැනීම් වැඩිවීම නිසා ප්‍රදේශයේ ධීවර කර්මාන්තයේ නියැලී සිටින ජනතාවට සිදුවන අපහසුතා සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාව සමඟ සාකච්ඡා කිරීම සඳහා කණ්ඩායමක් යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශයේ කණ්ඩායමක් විසින් මීට පෙර මෙම ප්‍රදේශය පරීක්ෂා කර ඇති නමුත් ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීම පරිදි මීළඟ සතිය තුළ මේ සඳහා යුධ හමුදාවේ කණ්ඩායමක් යොමු කළ හැකි බව යුධ හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

**3.2 කිලිනොච්චි නගරයේ පුස්තකාලයක් ඉදි කිරීම සඳහා වෙන් කර ඇති ඉඩම නිදහස් කිරීම - ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.11)**

මෙම ප්‍රශ්නගත ඉඩම තුළ යුධ හමුදාවේ බලසේනාවක් ස්ථානගතව සිටින බවත් අවස්ථා කිහිපයකදී ජනතාවගේ අවශ්‍යතා සඳහා ඉඩම් කොටස් නිදහස් කර ඇති බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

පුස්තකාලයක් ඉදි කිරීම සඳහා නිදහස් කරන ලද ඉඩමේ යුධ හමුදාව විසින් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කර දුන් නමුත් කරච්චි ප්‍රාදේශීය සභාව විසින් එය විවිධ ව්‍යාපාරික කටයුතු සඳහා බදු පදනම මත ලබා දී තවදුරටත් යුධ හමුදාව පරිහරණය කරනු ලබන ඉඩම් කොටස තුළින් නැවත පුස්තකාලයක් සඳහා ඉල්ලීම් කරන බව ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

කිලිනොච්චි පොදු පුස්තකාලය සහ පාසල පිහිටා තිබූ කරච්චි ප්‍රාදේශීය සභාවට අයත්ව තිබූ ඉඩම 2009 වර්ෂයෙන් පසු යුධ හමුදාව විසින් පවරාගෙන ඇති බවත් පාසලට අයිති අක්කර 3 කින් පර්චස් 112 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් නිදහස් කර ඇති නමුත් පුස්තකාලය සඳහා ඉඩම් නිදහස්කර නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

යුධ හමුදාව විසින් පුස්තකාලය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර දී නොමැති බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් සඳහන් කරන පරිදි එසේ ගොඩනැගිල්ලක් කරච්චි ප්‍රාදේශීය සභාව විසින් ව්‍යාපාරික කටයුතු සඳහා යොදවා නොමැති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

මේ වනවිට පුස්තකාලය කරච්චි ප්‍රාදේශීය සභාවට අයත් කිරිහලක ක්‍රියාත්මක වන බව ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී. කිලිනොච්චි පොදු පුස්තකාලය ඉදිකිරීමට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබී ඇති බැවින් එම ඉඩම සහ පාසලට අයිති ඉඩම නිදහස් කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මීට පෙර ඉදිරිපත් වූ ඉල්ලීම් අනුව හමුදා කඳවුර පිහිටි මෙම භූමියෙන් ඉඩම් කොටස් වරින් වර නිදහස් කර ඇති බවත් කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවය අනුව හමුදා කඳවුරු පිහිටා ඇති බවත් යුධ හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

අධික වියදමක් දරා ඉදිකර ඇති හමුදා කඳවුරු වෙනත් ස්ථානවල ස්ථානගත කිරීම ඉතා අපහසු කාර්යයක් බැවින් වෙනත් ස්ථානයක පුස්තකාලයක් ඉදි කර දිය හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. එමෙන්ම හමුදා කඳවුරු ස්ථානගත කර ඇත්තේ පවතින අවශ්‍යතාවය අනුව බැවින් කඳවුරු පිහිටි ඉඩම් සඳහා ඉල්ලීම් නොකරන ලෙස ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

**3.3 පොලිස් ස්ථාන සඳහා ගොඩනැගිලි ඉදි කිරීමේදී ගෘහනිර්මාණ සැලසුම්කරණය කෙරෙහි අවධානය යොමු කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.12.2)**

පොලිස් ස්ථාන සඳහා ගොඩනැගිලි ඉදි කිරීමේදී ගෘහනිර්මාණ සැලසුම්කරණයේදී එම පරිසරයේ ඇති අනෙක් ගොඩනැගිලිවලට ගැළපෙන ලෙස ඉදි කිරීම් සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.4 හබරාදූව පිහිටි ඉඩමෙන් කොටසක් නාගරික වෙරළ උද්‍යානයක් සඳහා නිදහස් කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.12.3)**

හබරාදූව ප්‍රදේශයේ පිහිටි පොලිසිය සඳහා වෙන් කර ඇති ඉඩමෙන් පොලිසිය විසින් භාවිතා කරන කොටස හැර ඉතිරි ඉඩම් ප්‍රමාණය නාගරික වෙරළ උද්‍යානයක් ඉදි කිරීම සඳහා නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.5 උණවටුන සඳහා සංචාරක පොලිස් ස්ථානයක් ලබා දීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.12.5)**

උණවටුන ප්‍රදේශය සඳහා සංචාරක පොලිස් ස්ථානයක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**3.6 හපුගල ආශ්‍රිතව පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.12.6)**

වැඩි ජනගහනයක් ඇති හපුගල ප්‍රදේශය ආශ්‍රිතව පොලිස් ස්ථානයක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

පොලිසියක් ස්ථාපනය කිරීමට නියමිත බව පොලිස්පති විසින් දැනුම් දෙන ලදී.

**3.7 බූස්ස තුරඟ තරඟ පිටිය - ගරු චන්දිම වීරක්කොඩි මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.12.7)**

අධිකරණ අමාත්‍යාංශය වෙත පැවරී ඇති බූස්ස තුරඟ තරඟ පිටිය ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය හෝ ගාල්ල ශ්‍රී හෘදය කන්‍යාරාම බාලිකා විද්‍යාලය සඳහා හෝ ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.8 ගාල්ල ශ්‍රවණාගාරය සෑදීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (2020.12.01 දිනැති කාර්යය සටහනේ අයිතම අංක 4.12.8)**

ගාල්ල ශ්‍රවණාගාරය ඉදිකිරීම සිදුවන "Mix Development ව්‍යාපෘතිය" සම්බන්ධයෙන් ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් විමසීමක් කරන ලදී.

මෙම ව්‍යාපෘතියට අදාළව ප්‍රසම්පාදන කටයුතු ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින්ද ඉදිකිරීම් කටයුතු ගාල්ල දිස්ත්‍රික් ලේකම් විසින්ද සිදු කරන බව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**4. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**4.1 කහඳුව, තිබ්බොටුවාව, ඌරගහවෙල ලිපිනයේ පදිංචි කේ.බී.සී. සුරංග මහතාට හිමි ආබාධිත රණවිරු විශ්‍රාම වැටුප ලබා දෙන ලෙස කළ ඉල්ලීම (ගරු චන්දිම වීරක්කොඩි මහතා - යෝජනා අංක 3)**

සුරංග මහතාට රාජකාරියේදී ශාරීරික හානි සිදු වී ඇති බවත් දීර්ඝ කාලයක් නොදන්වා රාජකාරියට වාර්තා නොකිරීම නිසා යුධ හමුදාවෙන් ඉවත් කර ඇති බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙවැනි අවස්ථාවලදී මූලික පරීක්ෂණ සිදු කරන බවත් එම වාර්තා යුධ හමුදාපතිගේ නිගමනය සමඟ ඉදිරිපත් වීමෙන් පසු දීමනා ගෙවීම් කටයුතු සිදු කරන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී. මොහු සම්බන්ධයෙන් එම පරීක්ෂණ කටයුතු සිදුකර එම වාර්තාව අත්සන් කිරීම සඳහා පැමිණෙන ලෙස දැනුම් දී ඇති නමුත් වාර්තා කර නොමැති බව තවදුරටත් දැනුම් දෙන ලදී. ඔහු විසින් එය අත්සන් කිරීමෙන් පසු අදාළ ඉදිරි කටයුතු සිදු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**4.2 අසාධාරණ හේතුවක් මත යුධ හමුදා අධිකාරියෙන් පහ කිරීම සම්බන්ධයෙන් ගාල්ල, වංචාවල, මීගොඩ, උස්වත්ත, අංක 247/1 හි පදිංචි ජේ.කේ. ඉමදුව විතානගේ මහතා ඉදිරිපත් කළ අභියාචනය (ගරු චන්දිම වීරක්කොඩි මහතා - යෝජනා අංක 4)**

මෙම නිලධාරියා සේවයේ යෙදී සිටියදී සිදු කරන ලද විනය විරෝධී ක්‍රියා හේතුවෙන් අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය මත 2009.09.30 දින යුධ හමුදා නිත්‍ය බලසේනාවේ අධිකාරියෙන් ඉවත් කර ඇති බවත් පවතින ප්‍රතිපත්ති අනුව නැවත සේවයේ පිහිටුවීමට නොහැකි බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**4.3 ආබාධිත රණවිරුවන්ට වයස අවුරුදු 60 දක්වා වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් මාතර, වැවහමන්දුව, පොකුණහේන, "සම්පත්" ලිපිනයේ පදිංචි බී.එච්.ඩබ්ලිව්. සිල්වා මහතාගේ ඉල්ලීම (ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 123)**

**4.4 ත්‍රස්තවාදී ප්‍රහාර නොවන ආබාධිත (ස්ථිර ආබාධිත) සෙබලුන්ට ස්ථාවර දීමනාව ලබාදීම විමසීම සම්බන්ධයෙන් ඇඹිලිපිටිය, කිරළවැල්කටුව, දෙවිනුවර හාල් මෝල පාර, දෙවන පටුමග, අංක 25 ලිපිනයෙහි පදිංචි ආර්.ඩී. විමලසේන මහතාගේ ඉල්ලීම (ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 128)**

**4.5 මියගිය රණවිරු පුතු වෙනුවෙන් වැටුප ලබා ගැනීම සම්බන්ධයෙන් දෙනියාය, කොළවෙනිගම, උඩරාංගලවිල ලිපිනයෙහි පදිංචි එදිරිසිංහ ලැයිසිනා මහත්මියගේ ඉල්ලීම (ගරු බුද්ධික පතිරණ මහතා - යෝජනා අංක 150)**

ගරු බුද්ධික පතිරණ මහතා විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් යෝජනා සඳහා වන පිළිතුරු වාර්තා ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 5. වෙනත් කටයුතු

## 5.1 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.1.1 පොලිස් ස්ථානවල ස්ථානභාර නිලධාරි ලෙස උසස්වීම් ලබා දීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීම

පොලිස් ස්ථානවල ස්ථානභාර නිලධාරී ලෙස උසස්වීම් ලබා දීමේදී ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට අසාධාරණයක් සිදුවී ඇති බැවින් උසස්වීම් ලබා දීම විධිමත් අකාරයකට සිදු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

උසස්වීම් ලබා දීමේදී පසුගිය කාලයේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොමැති බව පොලිස්පති විසින් දැනුම් දෙන ලදි. මේ වනවිට සම්මුඛ පරීක්ෂණ පවත්වා අදාළ උසස්වීම් ලබා දී පොලිස් ස්ථානවලට අවශ්‍ය ස්ථානගත කිරීම් කර ඇති බවත් නැවත සම්මුඛ පරීක්ෂණ පවත්වා සුදුසු නිලධාරීන් පත් කිරීමට නියමිත බවත් පොලිස්පති විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

උසස්වීම් ලබා දීමේදී නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය මෙන්ම කාර්යසාධනය කෙරෙහිද අවධානය යොමු කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතා විසින් දැනුම් දෙන ලදී.

### 5.1.2 පොලිස් වසම් සංඛ්‍යාව වැඩි කිරීම

මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධ වැටලීම් සිදු කරන ඇතැම් අවස්ථාවලදී පොලිස් දෙපාර්තමේන්තුව විසින් විධිමත් ලෙස කටයුතු නොකරන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම්දෙන ලදී.

මෙයට හේතුව මේ වනවිට එක් පොලිස් කොට්ඨාශයකට ආවරණය කළ යුතු ප්‍රදේශය විශාල වීම බැවින් පොලිස් වසම් වැඩි කර අමතර පොලිස් ස්ථාන ලබා දිය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 5.1.3 මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිටින දරුවන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් සිරගෙවල්වල නොතබා වෙනම පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික්කය සඳහා මෙවැනි පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

රාජ්‍ය ආයතන සම්බන්ධ වී මත්ද්‍රව්‍ය වැටලීම් කටයුතු සහ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීමේ අරමුණින් නොයෙක් වැඩසටහන් ක්‍රියාත්මක කරන බව අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති, ලක්නාත් වෙලගෙදර මහතා විසින් දැනුම් දෙන ලදී.

මත්ද්‍රව්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත බව ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැඳවියන් 1000 ක් පමණ රැඳවිය හැකි පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන බවද ඔහු විසින් දැනුම් දෙන ලදී.

### 5.1.4 මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා ඒකකයක් පිහිටුවීම

යම් මූල්‍ය අපරාධයක් සම්බන්ධයෙන් ආයෝජකයන් හෝ ව්‍යාපාරිකයන් විසින් ඉදිරිපත් කරන ලද පැමිණිලි විමර්ශනය කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් මේ සඳහා අපරාධ විමර්ශන ඒකකය තුළ හෝ විශේෂ ඒකකයක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 5.2 මත්ද්‍රව්‍ය රට තුළට ප්‍රවාහනය වීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම - ගරු වීරසුමන වීරසිංහ මහතා

දකුණු වෙරළ හරහා මත්ද්‍රව්‍ය රට තුළට ගෙන ඒම බහුලව සිදුවන මාදුගගේ මෝය කට සහ වැලිගම - පොල්අතුමෝදර මෝය කට යන ස්ථානවල නාවික හමුදාවේ මුරපොළවල් දෙකක් ස්ථාපනය කිරීමට ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් කරන ලදී.

බුද්ධිඅංශවල තොරතුරු අනුව මෙම ප්‍රදේශය තුළ ජංගම පොලිසි මුරපොළවල් ක්‍රියාත්මක වන බවත් සුදුසු ස්ථානයක් හඳුනාගෙන ස්ථාවර මුරපොළක් ස්ථාපනය කිරීමට පියවර ගන්නා බවත් නාවික හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

## 5.3 ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.3.1 මත්ද්‍රව්‍ය ජාවාරම පාලනය කිරීම

ඉන්දියාවේ සිට විශාල වශයෙන් කල්පිටිය දූපත් හරහා සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 5.3.2 නිරෝධායනය සඳහා රැගෙන යාමේදී සිදුවූ අනතුර

නිරෝධායනය සඳහා රැගෙන යාමේදී සිදුවූ අනතුරක් හේතුවෙන් කාන්තාවක් දරුණු ලෙස තුවාල සිදුවීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම අවස්ථාවේදී යුධ හමුදාව මැදිහත් වී එම කාන්තාවට ප්‍රතිකාර ලබා දීමට කටයුතු කළ බව යුධ හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

### 5.3.3 පොලිසිවලට ලබා දෙන තොරතුරුවල රහස්‍යභාවය තබා ගැනීම

පාසල් දරුවන්ද ඇබ්බැහි වී ඇති මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීමේදී පොලිසිය හරහාම අදාළ පාර්ශව වෙත ඒ පිළිබඳව තොරතුරු ලැබීම සිදු වන බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

පොලිසිය හරහා මෙසේ තොරතුරු පිටතට සන්නිවේදනය වීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශේෂ ඒකකයක් පිහිටුවා ඇති බවත් ඒ අනුව යම්තාක් දුරට මෙම තත්ත්වය පාලනය වීමක් සිදුව ඇති බවත් පොලිස්පති විසින් දැනුම් දෙන ලදී.

මෙසේ තොරතුරු ලබා ගැනීමේදී රහස්‍යභාවය රැකගැනීම සඳහා යම්කිසි එක් ස්ථානයකට තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් ඇති කිරීමේ හැකියාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා දුරකථන අංකයක් හඳුන්වා දී ඇති බවත් ඒ අනුව බොහෝ දුරට තොරතුරුවල රහස්‍යභාවය රැකීම සිදුවන බවත් පොලිස්පති විසින් දැනුම් දෙන ලදී.

යම්කිසි කරුණක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් විසින් යම් පාර්ශවයක් වෙත පැමිණිලි කිරීමේදී එම පාර්ශවය විසින් ක්‍රමවත් ලෙස ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතා විසින් දැනුම් දෙන ලදී. එසේ නොකළහොත් ඔවුන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**5.4 මියගිය රණවිරුවන්ගේ යැපෙන්නන් වෙත සහන සැලසීම - ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත**

ත්‍රස්තවාදී ක්‍රියා නිසා මිය ගිය රණවිරුවන්ගේ යැපෙන්නන්ට විශ්‍රාම වැටුප ගෙවීම සම්බන්ධව රජය විසින් කරන ලද ප්‍රකාශය ජනතාව වෙත නිවැරදි ලෙස සන්නිවේදනය නොතිබීම මත ගැටළුකාරී තත්ත්වයක් ඇතිව තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එම යැපෙන්නන් වෙත සහන සැලසීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියමිත බවත් මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශව කැඳවා දැනුවත් කිරීමට කටයුතු කරන ලද බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**5.5 කුඩා පරිමාණයෙන් මැණික් ගැරීමේ නියැලෙන ජනතාව සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම - ගරු අකිල එල්ලාවල මහතා**

සම්ප්‍රදායක් ලෙස අප්‍රේල් මාසයට ආසන්න කාලයේදී ජනතාවට මැණික් ගැරීම සඳහා පොලිසිය ඇතුළු සියලු අධිකාරීන් විසින් අවසර ලබා දෙන නමුත් මේ වනවිට රත්නපුර සමන් දේවාලය අසල සම්ප්‍රදායක් ලෙස මෙම කටයුත්තේ නියැලී සිටි සියලු දෙනාම පොලිස් භාරයට ගෙන ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයක් පදනම් කරගෙන පොලිසිය සහ ආරක්ෂක අංශ මෙසේ කටයුතු කිරීම තුළින් රත්නපුර දිස්ත්‍රික්කයේ මැණික් ගැරීමේ කර්මාන්තයේ නියැලී සිටින සාමාන්‍ය ජනතාව අපහසුතාවයට පත් වන බව ගරු ගාමිණී වලේබොඩ මහතා විසින් දැනුම් දෙන ලදී. එමෙන්ම මෙවැනි ක්‍රියා හේතුවෙන් රජයද අපකීර්තියට පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී මෙම කර්මාන්ත සඳහා අනුමැතිය ලබා දී ඇති පුද්ගලයින්ට බාධාවක් නොවන ලෙස ක්‍රියාත්මක විය යුතු බව ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා විසින්ද දැනුම් දෙන ලදී.

කැළණි ගඟ ආශ්‍රිතව කුඩා පරිමාණයෙන් මැණික් ගැරීමේ කර්මාන්තයේ යෙදී සිටින ජනතාවද මෙවැනි ක්‍රියාමාර්ග හේතුවෙන් අපහසුතාවයට පත්ව ඇති බව ගරු මිලාන් ජයතිලක මහතා විසින්ද දැනුම් දෙන ලදී.

කුඩා පරිමාණයෙන් නොව විශාල පරිමාණයෙන් අනවසරයෙන් මැණික් ගැරීමේ සහ වැලි ගොඩ දැමීමේ නියැලී සිටින අය සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි. නිවැරදි ලෙස පොලිස් ස්ථාන වෙත උපදෙස් ලබා නොදීම හේතුවෙන් මෙවැනි සිදුවීම් සිදුවන බැවින් මේ පිළිබඳ අවධානය යොමු විය යුතු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ පිළිබඳ අවධානය යොමු කරන බව පොලිස්පති විසින් දැනුම් දෙන ලදී.

## 5.6 මඩකලපුව දිස්ත්‍රික්කයේ යුධ හමුදාව භාරයේ ඇති පාසල නිදහස් කිරීම - ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

මඩකලපුව දිස්ත්‍රික්කයේ සිත්තණ්ඩි හමුදා කඳවුර සඳහා එම ප්‍රදේශයෙහි පිහිටි පාසල යුධ හමුදාව විසින් මීට වසර ගණනාවකට පෙර අත්පත් කරගෙන තිබීම මත මෙම පාසල වෙනත් කුඩා ස්ථානයක පවත්වා ගෙන යන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී. වැසි කාලයේදී එම ස්ථානයේ ගංවතුර තත්ත්වයක් ඇති වන බැවින් මෙම සිසුන් වෙනුවෙන් පාසල නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහි පිහිටා ඇති හමුදා කඳවුර ස්ථාපනය කිරීම සඳහා මීට වසර දෙකකට පෙර අක්කර 25 ක ඉඩම් ප්‍රමාණයක් පුන්නකුඩා ප්‍රදේශයේ වෙන් කර ඇති බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

හමුදා කඳවුර ස්ථාපනය කිරීමට ගරු ගෝවින්දම් කරුණාකරම් මහතා විසින් යෝජනා කරන ලද පුන්නකුඩා ප්‍රදේශයේ ඉඩම ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කලාපයක් වන බැවින් එම ඉඩම ඒ සඳහා සුදුසු නොවන බව ගරු නසීර් අහමඩ් මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් යුධ හමුදාපති වෙත උපදෙස් ලබා දෙන ලදී.

## 5.7 ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.7.1 පන්නල - කඳානගෙදර නගරය සඳහා පොලිස් ස්ථානයක් ස්ථාපනය කිරීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පන්නල - කඳානගෙදර නගරයෙහි ඇති පොලිස් මුරපොළ වෙනුවට එහි පොලිසියක් ස්ථාපනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

නව පොලිස් ස්ථාන 194 ක් පිහිටුවීමේ යෝජනාව යටතේ මෙය සම්බන්ධයෙන් අවධානය යොමු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. පවතින පොලිස් වසම් විශාලත්වයෙන් වැඩිනම් නව පොලිස් වසම් ඇති කිරීම සඳහා

පොලිස්පති සමඟ සම්බන්ධීකරණය වන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දෙන ලදී.

නව පොලිස් ස්ථාන අවශ්‍ය වන අවස්ථාවලදී එම යෝජනා පොලිස්පති වෙත යොමු කරන ලෙස රාජ්‍ය අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මහතා විසින් ගරු මන්ත්‍රීවරුන් වෙත දැනුම් දෙන ලදී.

### 5.7.2 පොලිස් ස්ථානවල තරුණ පොලිස් නිලධාරින්ගේ හිඟය

කුරුණෑගල පන්නල පොලිසිය සඳහා තරුණ පොලිස් නිලධාරින්ගේ හිඟයක් ඇති බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම වසරේදී පොලිස් නිලධාරින් 10,000 ක් බඳවා ගැනීමට නියමිත බැවින් එහිදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ හැකි බව පොලිස්පති විසින් දැනුම් දෙන ලදී.

## 5.8 වන විනාශය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා විශේෂ ඒකකයක් පිහිටුවීම - ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

මේ වනවිට විශාල වන විනාශයන් සිදු කරන බවට චෝදනා ඇති බැවින් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම සඳහා ජනාධිපති කාර්යාලයට අනුබද්ධව ක්ෂණික විහිදුම් බලකාය වැනි විශේෂ ඒකකයක් පිහිටුවන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.
මෙසේ වන විනාශ සිදු කරන සියලුම පිරිස් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන ලෙස පොලිස්පති වෙත උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 5.9 ගරු ෆයිසාල් කාසිම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.9.1 අම්පාර-නින්තවූර් ගම්මානයේ ප්‍රාදේශීය සභාවට අයත් ඉඩමක් නිදහස් කිරීම

යුධ හමුදා කඳවුරකට ලබා දී ඇති අම්පාර නින්තවූර් ගම්මානයේ ප්‍රාදේශීය සභාවට අයත්ව තිබූ ඉඩම නිදහස් කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 5.9.2 අම්පාර දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ජාවාරම බහුලව සිදු වීම

අම්පාර දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය ජාවාරම බහුලව සිදු වන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

තවද අම්පාර වී අලෙවි මණ්ඩලයේ ඉදි කිරීම් කටයුතු සඳහා යොදවා ඇති හමුදා නිලධාරින් සඳහා ආහාර ලබා දීම එම ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ජාවාරමේ නිරත වන අය විසින් සිදු කරන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

අම්පාර වී අලෙවි මණ්ඩලයේ ගබඩා අළුත්වැඩියා කිරීම සඳහා හමුදා නිලධාරින් යොදවා ඇත්තේ යුධ හමුදාපතිගෙන් සිදු කරන ලද ඉල්ලීමක් අනුව බව ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් දැනුම් දෙන ලදී.

අම්පාර දිස්ත්‍රික්කය තුළ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරමට සම්බන්ධ පාර්ශව පිළිබඳ තොරතුරු ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් ඒ අනුව මේ පිළිබඳව අවධානය යොමු කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් ගරු ෆයිසාල් කාසිම් මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

## 5.10 ගරු රිසාඩ් බදියුදීන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.10.1 ඉස්ලාම් ආගමික පොත් තහනම් කිරීම

පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරය පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මගින් ඉස්ලාම් ආගමික පොත් කිහිපයක් තහනම් කරන ලෙසට ලබා දී ඇති නිර්දේශය සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

නමුත් සංචාරකයින් විසින් ඉස්ලාම් ආගම සම්බන්ධව මෙරටට රැගෙන එනු ලබන සියලුම පොත් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීම මත පමණක් නිදහස් කරන ලෙසට චක්‍රලේඛයක් ශ්‍රී ලංකා රේගුව විසින් නිකුත් කර තිබීම හේතුවෙන් මැදපෙරදිග රටවල සිට ආගමික පොත් රැගෙන පැමිණෙන මුස්ලිම් ජනතාව මහත් අපහසුතාවයට පත්වන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

යම්කිසි අන්තවාදී ආගමික පොතක් හඳුනාගතහොත් පමණක් එය තහනම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන බවත් ඊට අමතරව පාසල් පෙළ පොත්වල යම් අන්තවාදී ආගමික කරුණු ඇතුළත්වීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමක් සිදු කරනු ලබන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

මෙරටට රැගෙන එනු ලබන සියලුම ඉස්ලාම් ආගමික පොත් සම්බන්ධයෙන් තහනමක් පනවා නොමැති බව ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී. එමෙන්ම යම්කිසි ආගමික පොතක් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සිදු කරනු ලබන්නේ එම ආගමේ යම් විද්වත් මණ්ඩලයක් විසින් බවත් එබැවින් මෙහිදී ඉස්ලාම් ආගමට පමණක් කිසිදු අසාධාරණයක් සිදු නොවන බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

### 5.10.2 මන්නාරම - පුත්තලම මාර්ගය අබලන් වීම

මන්නාරම පුත්තලම මාර්ගයේ සමහර ස්ථාන මේ වනවිට අබලන් තත්ත්වයේ පවතින බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 5.10.3 මන්නාරම වෙරළ හරහා මත්ද්‍රව්‍ය රට තුළට ගෙන ඒම පාලනය කිරීම

මෙරටට මත්ද්‍රව්‍ය පැමිණීම වැඩි වශයෙන් සිදු වන්නේ මන්නාරම වෙරළ හරහා බැවින් මුල්ලිකුලම් සිට තලෙමන්නාරම දක්වා ආරක්ෂක අංශ සහ පොලිසිය

යොදවා ඒකාබද්ධ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර මෙම තත්ත්වය පාලනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 5.11 ගරු ඩයනා ගමගේ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.11.1 නිරෝධායන මධ්‍යස්ථාන වෙත ජනතාව රැගෙන යන බස්රථ අවදානම් ලෙස ධාවනය කිරීම

නිරෝධායන මධ්‍යස්ථාන වෙත ජනතාව රැගෙන යන බස්රථවල රියැදුරන් අනතුරුදායක ලෙස එම බස්රථ ධාවනය කිරීම හේතුවෙන් ඉතා අනතුරුදායක තත්ත්වයක් ඇතිව තිබෙන බව ගරු මන්ත්‍රීතුමිය විසින් දැනුම් දෙන ලදී. එමෙන්ම මෙම බස්රථ “ශ්‍රී ලංකා යුධ හමුදාව” ලෙස නම් කර ධාවනය කිරීම හේතුවෙන් යුධ හමුදාවටද අපකීර්තියක් ඇති වන බව ගරු මන්ත්‍රීතුමිය විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රීතුමිය විසින් සඳහන් කරන ලද කරුණු කෙරෙහි අවධානය යොමු කරන බව යුධ හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

### 5.11.2 මත්ද්‍රව්‍ය සම්බන්ධ වැටලීම් සිදු කිරීමේදී පොලිසිය විසින් අසාධාරණ ආකාරයට නිවැරදි පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම

ඇතැම් අවස්ථාවලදී මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වැටලීම් සිදු කිරීමේදී පොලිසිය විසින් අසාධාරණ ආකාරයට ඇතැම් නිවැරදි පුද්ගලයින් වෙත චෝදනා ඉදිරිපත් කර අත්අඩංගුවට ගැනීම සිදුවන බැවින් මේ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමිය විසින් ඉල්ලීමක් කරන ලදී.

## 5.12 වගා කටයුතු සඳහා ඉඩම් ලබා ගැනීම - ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

වැවිලි කර්මාන්තය තවදුරටත් දියුණු කිරීම සඳහා ඉඩම්වල අවශ්‍යතාවයක් පවතින බවත් ඒ සඳහා දැනට පොලිසිය සහ ආරක්ෂක අංශ ආශ්‍රිතව ඇති වගා කළ හැකි ඉඩම්වල භූමි ප්‍රමාණය සම්බන්ධයෙන් වැවිලි අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස ඉල්ලීමක් කර ඇති බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

## 5.13 ඉඩම් නිදහස් කිරීම - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

පේදුරුතුඩුව තැපැල් කාර්යාලයට අයත් ඉඩම් අක්කර හයෙන් අක්කර හතරක් යුධ හමුදාව විසින් අත්පත් කරගෙන ඇති බැවින් ඉතිරිව ඇති අක්කර දෙකක ඉඩම ගොඩනැගිල්ලක් තැනීමට ප්‍රමාණවත් නොවන බැවින් සම්පූර්ණයෙන් නිදහස් කර දෙන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

චාවකච්චේරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ඒලුත්තුමඩුවාල් ප්‍රදේශයේ ඇති පෞද්ගලික ඉඩම යුධ හමුදාව විසින් අත්පත් කරගෙන ඇති බැවින් එම ඉඩම නිදහස් කිරීමට කටයුතු කරන මෙන්ද ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

1987 ට පෙර කාලයේදී ජේදුරු තුඩුව හමුදා කඳවුරෙහි තැපැල් කාර්යාලයක් ක්‍රියාත්මකවූයේද යන්න සම්බන්ධයෙන් අවධානය යොමු කළ හැකි බව යුධ හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

තවද මිරිසුවිල් කඳවුර එම ස්ථානයෙන් ඉවත් කළ නොහැකි බවත් එය පෞද්ගලික ඉඩමක් නම් අයිතිය තහවුරු කර ගැනීමෙන් පසු ඒ සඳහා වන්දියක් ලබා දිය හැකි බවත් හමුදාපති විසින් දැනුම් දෙන ලදී.

## 5.14 පොලිස් ස්ථානවල පොලිස් නිලධාරීන්ගේ හිඟයක් පැවතීම - ගරු මිලාන් ජයතිලක මහතා

පොලිස් ස්ථානවල පොලිස් නිලධාරීන්ගේ අඩුවක් පැවතීම හේතුවෙන් පැමිණිල්ලක් කිරීමේදී ඒ සඳහා ක්‍රියාත්මක වීමේ හැකියාවක් නොමැති බවට එම පොලිස් ස්ථානවලින් දැනුම් දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වනවිට අනවශ්‍ය ලෙස ප්‍රභූ ආරක්ෂාව සඳහා යොදවා ඇති පොලිස් නිලධාරීන් එම ස්ථානවලින් ඉවත් කර පොලිස් ස්ථාන සඳහා අනුයුක්ත කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

## 5.15 ගරු දයාසිරි ජයසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 5.15.1 ස්වයං නිර්මාණයක් සඳහා අනුමැතිය ලබා ගැනීම

නුවර - අම්පිටිය ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් සතුන් බිය කිරීම සඳහා සකස් කර ඇති හොඳ ඉල්ලුමක් පැවති නිර්මාණයක් එහි හැඩය හේතුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් තහනම් කර ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු දයාසිරි ජයසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

මෙය විධිමත් ලෙස හඳුන්වා දීම සඳහා මෙම කරුණ ආරක්ෂණ මණ්ඩලය වෙත යොමු කර ඇති බැවින් ඒ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 5.15.2 කොළඹ දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරීන් සඳහා ඇති අඩු පහසුකම්

පොලිස් නිලධාරීන් සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ඇති අඩු පහසුකම් සහ අධික වියදම් හේතුවෙන් ඔවුන් කොළඹ දිස්ත්‍රික්කයේ රැඳී සිටීමට කැමැත්තක් නොමැති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී. මෙම නිලධාරීන් සඳහා යම්කිසි දීමනාවක් දීම තුළින් මොවුන් කොළඹ දිස්ත්‍රික්කය තුළ රඳවා තබා ගැනීමට කටයුතු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

එමෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුළ සේවය කිරීමට පොලිස් නිලධාරීන් අකමැති වීම තුළ ඇතැම් පොලිස් නිලධාරීන් කොළඹ දිස්ත්‍රික්කයේ දීර්ඝ කාලයක් සේවයේ නිරතව සිටින බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

**5.16 යාපනය මහනගර සභාවේ නගරාධිපතිගේ ක්‍රියාකලාපය - ගරු මධුර විතානගේ මහතා**

යාපනය මහනගර සභාවේ නගරාධිපති විසින් එල්.ටී.ටී.ඊ. පොලිස් නිලධාරින් යැයි පැවසෙන පුද්ගලයින් භාවිතා කළ ඇඳුමට සමාන ඇඳුමකින් සැරසුණු පුද්ගලයින් 5 දෙනෙකු යාපනය නගරය ආසන්නයේ රාජකාරියේ යෙදවීම සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කළ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

**5.17 ගොවීන් සඳහා ගිනිඅවි නිකුත් කිරීම - ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

මේ වනවිට 25% ක්ම වගා හානි සිදු වන්නේ සතුන්ගෙන් බැවින් ගොවීන් සඳහා ගිනි අවි නිකුත් කිරීම පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙහිදී ගොවි සංවිධාන සඳහා ගිනි අවි සංඛ්‍යාවක් නිකුත් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමට බලාපොරොත්තු වන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**6.** කාරක සභාව ප.ව.3.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.

---

**ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**තෙවැනි රැස්වීම - 2021 අගෝස්තු 05**

**පැමිණ සිටි සාමාජික මන්ත්‍රීන්**

ගරු ඩග්ලස් දේවානන්දා මහතා (සභාපති)
ගරු කංචන විජේසේකර මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

**පැමිණ සිටි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අමරකීර්ති අතුකෝරළ මහතා
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තා වලට එකඟ වූ කාරක සභාව ඒ පිළිබඳ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු ඩග්ලස් දේවානන්දා මහතා විසින් පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදී.

**1.1** 2017 වර්ෂය සඳහා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව
**1.2** 2018 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්
**1.3** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

**2. 2021.03.26 දින පැවැති රැස්වීමේ කාර්ය සටහන් වලින් පැන නඟින කරුණු**

**2.1 මින්නේරිය ධීවර සංස්ථාව සතු ඉඩම එළදායී කටයුත්තක් සඳහා යෙදවීම - ගරු අමරකීර්ති අතුකෝරළ මහතා**

මින්නේරිය ධීවර සංස්ථාව දියුණු කිරීමේ කටයුතු රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින බවත් මේ සඳහා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රදේශයේ උනන්දුවක් දක්වන අයට අවස්ථාවක් ලබා දිය හැකි බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

**2.2 ස්කූබා (Scuba) ක්‍රමයට මසුන් ඇල්ලීමේ තහනම ඉවත් කිරීම - ගරු කාදර් මස්තාන් මහතා**

මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති ගැසට් නිවේදනය අනුව පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා කාලය තුළ මෙම තහනම ක්‍රියාත්මක වන බව නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාවික මෙහෙයුම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

වාණිජ වරායන් සහ නාවික වරායන් ආශ්‍රිත ප්‍රදේශවල හැර සෙසු ප්‍රදේශවල රාත්‍රී කාලයේදී පමණක් ස්කූබා ක්‍රමයට මසුන් ඇල්ලීම සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් විරෝධයක් නොමැති බව ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ආරක්ෂක හේතූන් මත නොව සමුද්‍රීය සම්පත්වලට හානි වී තිබීම හේතුවෙන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම තහනම නිකුත් කර ඇති බව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**2.3 ඉරනතීවු දූපතට ගමන් කිරීමට අවසර ලබා ගැනීම - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

මෙම කලාපය තුළ විධිමත් තොටුපළ සේවාවක් ක්‍රියාත්මක නොවන බවත් ජනතාවගේ ජීවිත ආරක්ෂාව සලකා ඒ සඳහා ධීවර බෝට්ටු යොදා ගැනීම සඳහා

අවසර ලබා දිය නොහැකි බවත් නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාවික මෙහෙයුම් විසින් කාරක සභාවට දැනුම් දෙන ලදී.

ධීවර අමාත්‍යාංශය විසින් මේ සඳහා විධිමත් නියාමන අධිකාරියක් ක්‍රියාත්මක කරන්නේ නම් අදාළ අවසරය ලබා දීම ධීවර අමාත්‍යාංශයට පවරා දීමේ ගැටළුවක් නොමැති බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

නමුත් මුහුද හරහා ජනතාව ප්‍රවාහනය කිරීමේදී ජනතාවගේ ජීවිත ආරක්ෂාව සම්බන්ධයෙන් නාවික හමුදාව විසින් වගකිව යුතු බැවින් සහ මේ වනවිට නාවික හමුදාව විසින් මේ සම්බන්ධයෙන් විධිමත් නියාමන ක්‍රමවේදයක් අනුගමනය කරන බැවින් ඉරනතිවු දූපතට ගමන් කිරීමට අවසරය ලබා දීම නාවික හමුදාව විසින් සිදු කිරීම සුදුසු බව ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

## 2.4 අම්පාර - තිරුක්කෝවිල් වෙරළාසන්න ප්‍රදේශයේ ඉල්මනයිට් කැණීම් කටයුතු තහනම් කිරීම - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

පෞද්ගලික පාර්ශවයක් විසින් මෙම ප්‍රදේශයේ ඉල්මනයිට් කැණීම වෙනුවෙන් බලපත්‍රයක් සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් අයදුම් කර ඇති බව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව මෙම බලපත්‍රය නිකුත් කිරීමට අදාළ ක්‍රියාවලියේ පියවර අනුගමනය කිරීමේදී මහජනතාවගේ අදහස් ලබා ගැනීම සිදු වූ බවත් එම අදහස් සඳහා අවශ්‍ය විසඳුම් ලබා ගැනීමෙන් පසු පමණක් මෙම බලපත්‍රය නිකුත් කිරීමට කටයුතු කරන බවත් ඔහු විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මහජන අදහස් ලබා ගැනීම තෝරාගත් පිරිසකගෙන් පමණක් සිදුකර තිබීම කෙරෙහි සහ මේ සඳහා ඉදිරිපත් වූ මූලික ව්‍යාපෘතිය යෝජනාවේ හා පාරිසරික බලපෑම් ඇගැයීම් වාර්තාවේ නිරීක්ෂණය වන වෙනස්කම් කෙරෙහි නැවත අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 2.5 මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටි භාවිතයට නොගෙන අත්හැරදමා ඇති ලංකා ධීවර සංස්ථාවට අයත් ගොඩනැගිලි ඵලදායී කටයුත්තකට යොදා ගැනීම - ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

### 2.5.1 කලුවන්කර්නි හා කල්ලාරු ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිලි නැවත භාවිතයට ගත හැකි පරිදි සකස් කිරීම

ඉන්ධන පිරවුම්හලක් ආරම්භ කර ඇති කලුවන්කර්නි ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ල අලුත්වැඩියා කළ යුතු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 2.5.2 කලුවන්කර්නි ප්‍රදේශයේ පිහිටි අබලන් පාලම අලුත්වැඩියා කිරීම

මේ වනවිට මෙම ප්‍රදේශයේ පාලමක් නොමැති බැවින් සැහැල්ලු වාහන ගමන් කිරීම සඳහා පාලමක් ඉදි කර දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් මීළඟ කාරක සභා අවස්ථාවේදී වාර්තාවක් ඉදිරිපත් කරන බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

## 3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා

### 3.1 ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 63)

කිමිදී මසුන් විදීමේ තහනම ඉවත් කරන ලෙස ගාල්ල, උණවටුන ගණහේන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා කිමිදී මසුන් විදින්නන්ගේ එකමුතුව විසින් ඉදිරිපත් කළ ඉල්ලීම

සමුද්‍රීය සම්පත් විනාශ වීම අවම ප්‍රදේශයක් හඳුනාගෙන එම ප්‍රදේශය මෙම අරමුණ සඳහා වෙන් කර ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 3.2 ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 87)

කුරුණෑගල, ගල්ගමුව, උස්ගල, සියඹලන්ගමුව ධීවර සමිතියට ධීවර ආම්පන්න ලබා ගැනීම සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම

මෙම යෝජනාවට අදාළ පිළිතුරු වාර්තාව ඉදිරියේදී ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.3 ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 161)

ලංකා ධීවර සංස්ථාවේ අහිමි කළ සේවය සඳහා වන්දි මුදලක් ලබා ගැනීම සම්බන්ධයෙන් අහංගම, මිදිගම, තුර්කි නිවාස, අංක 165 ලිපිනයෙහි පදිංචි ඒ.එල්. උපරත්න මහතාගේ ඉල්ලීම

මෙම යෝජනාවට අදාළ පිළිතුරු වාර්තාව ඉදිරියේදී ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

### 3.4 ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 256)

බලපිටිය ප්‍රදේශයේ ගල්බොක්ක, වතුරගම, මංකඩ හා හරස්පොල ධීවර වරායන්හි පිහිටා ඇති ගල් බාධක ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් බලපිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති එන්.සමන් ද සිල්වා මහතාගේ ඉල්ලීම

මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණයක් සිදු කර මෙම ගල් බාධක ඉවත් කිරීම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විරෝධතාවයක් නොමැති බව දන්වා ඇති බව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ඉහත නිර්දේශය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ලද පසු අදාළ අනෙකුත් සියළු ආයතන සමඟ සාකච්ඡා කර මෙම ගල පුපුරුවා හැරීම සඳහා නාවික හමුදාවට භාර දෙන බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

**3.5 ගරු ශාන්ත බණ්ඩාර මහතා (යෝජනා අංක 347)**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව, මැඩියාව, නිකවෙලයාය එකමුතු ධීවර සමිතිය සඳහා ධීවර ආම්පන්න සහ මත්ස්‍ය පැටව් ලබා ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ඉල්ලීම

මෙම යෝජනාවට අදාළ පිළිතුරු වාර්තාව ඉදිරියේදී ගරු මන්ත්‍රීතුමා වෙත යොමු කරන බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.6 ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 378)**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සිවිල් ඉංජිනේරුවරයකු ලෙස සේවය කරමින් සිටියදී වැඩ තහනමකට ලක්වීම සම්බන්ධයෙන් පළමුවන පටුමග, එල්ස්මෝර්, ඉංගිරිය ලිපිනයේ පදිංචි ඩබ්.එන්. වික්‍රමසූරිය මහතාගේ ඉල්ලීම

මෙම පුද්ගලයා තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබූ බවත් පරිවාස කාලය තුළ මෙය අනාවරණය වීම හේතුවෙන් විධිමත් විනය පරීක්ෂණයකින් තොරව ඔහුව සේවයෙන් පහ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති බවත් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධ ලිඛිත වාර්තාවක් තමා වෙත ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**4. වෙනත් කරුණු**

**4.1 ගරු අමරකීර්ති අතුකෝරළ මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා**

**4.1.1 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වනජීවී කලාප ආශ්‍රිතව ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර ජනතාව මුහුණ දෙන ගැටළු**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බොහෝ වැව් පිහිටා ඇත්තේ වනජීවී කලාප ආශ්‍රිතව බැවින් මෙම ප්‍රදේශයේ ධීවර ජනතාවට විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුව ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් මේ සම්බන්ධයෙන් ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙම කරුණට අදාළ තොරතුරු ලබා දිය හැකි නම් ඒ සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කළ හැකි බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් ගරු මන්ත්‍රීතුමා වෙත දැනුම් දෙන ලදී.

තවද ධීවර කටයුතුවලදී නීතිවිරෝධී ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් වැටලීම් ඒකකයක් ස්ථාපනය කර ඇති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

#### 4.1.2 ජනරංජන වැව ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදී සිටින පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ධීවර ජනතාව මුහුණ දෙන ගැටළු

මැදිරිගිරිය ආසනයේ පිහිටා ඇති ත්‍රිකුණාමලය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකටම අයත් ජනරංජන වැව ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර ජනතාව අතරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ධීවර ජනතාවට විවිධ අවස්ථාවලදී සිදුවන අසාධාරණය පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ත්‍රිකුණාමලය සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකෙහිම ධීවර ජනතාවට බාධාවකින් තොරව ධීවර කටයුතුවල යෙදිය හැකි වන ලෙස වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ හැකි බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 4.2 රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.2.1 ගාල්ල ශීතාගාරය ඉදි කිරීම

ගාල්ල ශීතාගාරයක් ඉදි කිරීම සම්බන්ධයෙන් ආයෝජකයන්ට තම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

#### 4.2.2 හලාවත මෝයකටෙහි නිතරම වැලි එකතු වීම

ධීවර වරාය පිහිටා ඇති හලාවත මෝයකටෙහි නිතරම වැලි එකතු වීම හේතුවෙන් ධීවර යාත්‍රාවලට එම පිවිසුමෙන් ඇතුළට ඒමට බාධා වන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ සඳහා ස්ථිර හෝ තාවකාලික විසඳුමක් ලබා දීමට කටයුතු කළ යුතු බවද ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

#### 4.2.3 වෙරළ ඛාදනය හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ තොඩුවාව ප්‍රදේශයේ තාවකාලික ධීවර නිවාස කිහිපයකට හානි වීම

වෙරළ ඛාදනය හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ තොඩුවාව ප්‍රදේශයේ තාවකාලික ධීවර නිවාස කිහිපයකට හානි සිදුවීම සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් විමසීමක් කරන ලදී.

මෙම තත්ත්වය වැළැක්වීම සම්බන්ධයෙන් ගත හැකි පියවර පිළිබඳව මේ වනවිට විශ්ලේෂණයක් සිදු කරන බවත් ඒ අනුව ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට බලාපොරොත්තු වන බවත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

### 4.3 වැලිගම ප්‍රදේශයේ හාල්මැස්සන් ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර ජනතාවගේ ගැටළුව - ගරු දිලිප් වෙදආරච්චි මහතා

වැලිගම ප්‍රදේශයේ හාල්මැස්සන් ධීවර කර්මාන්තය සඳහා භාවිතා කරන දැල තහනම් කරමින් නිකුත් කළ නියෝගය ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ලංකාවේ ධීවර පනත අනුව හාල්මැස්සන් ධීවර කර්මාන්තය සඳහා මෙම ප්‍රදේශයේ ධීවර ජනතාව විසින් භාවිතා කරන දැල නීත්‍යානුකූල නොවන බැවින් එම දැල තහනම් කර අනෙක් ප්‍රදේශවල මෙම ධීවර කර්මාන්තය සඳහා භාවිතා කරන දැල ලබා දීම සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කළ බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

තවද මේ සම්බන්ධයෙන් ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය විසින් විධිමත් අධ්‍යයනයක් සිදුකර නිර්දේශ සහිත වාර්තාව ලබා දෙන තුරු දැනට භාවිතා කරන හැඹිලි දැල වෙනුවට මාදැල හෝ කරමල් දැල භාවිත කිරීමට නිර්දේශ කර ඇති බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් වැඩිදුරටත් දැනුම් දෙන ලදී.

මෙම ප්‍රදේශයේ මාදැල් වරායක් නොමැති බැවින් මාදැල් ලබා දිය නොහැකි නමුත් මේ සඳහා විකල්ප දැලක් ලබා දිය හැකි බවත් ඒ සඳහා අමාත්‍යාංශය මට්ටමින් මැදිහත් විය හැකි බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.4 ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

#### 4.4.1 ධීවර අමාත්‍යාංශයට අයත් ගොඩනැගිලි ධීවර කර්මාන්තය සඳහා ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනීම

හෝටල් පාසලක් සඳහා ලබා දෙන ලෙස සංචාරක අමාත්‍යාංශය විසින් ඉල්ලා ඇති මඩකලපුව දිස්ත්‍රික්කයේ කල්ලඩි පාලම ආසන්නයේ පිහිටා ඇති ලංකා ධීවර සංස්ථාවට අයත් ගොඩනැගිල්ල ධීවර අමාත්‍යාංශය යටතේම තබා ගන්නා ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

ලංකා ධීවර සංස්ථාවට මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩම සම්බන්ධයෙන් නිශ්චිත අයිතියක් නොමැති බවත් සංස්ථාවට එම ඉඩමෙහි භුක්තිය පමණක් ඇති බවත් ලංකා ධීවර සංස්ථාවේ වැඩ බලන සභාපති විසින් දැනුම් දෙන ලදී.

සංචාරක අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් වෙතින් මේ සඳහා ඉල්ලීම් කර ඇති නමුත් ලංකා ධීවර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ගොඩනැගිල්ල ලබා දීමට අකැමැත්ත දැනුම් දෙමින් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති බවත් ඔහු විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

#### 4.4.2 මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ධීවර අලෙවි සැලක් ආරම්භ කිරීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ ධීවර අලෙවි සැලක් ආරම්භ කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ වනවිට විශාල පරිමාණයෙන් ධීවර අලෙවිසැල් 25 ක් රට තුළ ආරම්භ කිරීමට කටයුතු කර ඇති බවත් ඒ අනුව එක් අලෙවිසැලක් මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවත් ලංකා ධීවර සංස්ථාවේ සභාපති විසින් දැනුම් දෙන ලදී.

මඩකලපුව දුම්රියපොළට ආසන්නයේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ගොඩනැගිල්ලක් මේ සඳහා සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් ලංකා ධීවර සංස්ථාවේ සභාපති වෙත උපදෙස් ලබා දෙන ලදී.

### 4.4.3 අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර ජනතාවගේ මාළු සොරකම් කිරීම

අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර ජනතාවගේ මාළු හොරකම් කිරීමේ කටයුතුවල නිරතව සිටින පිරිසක් සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කර ඇති නමුත් නීත්‍යානුකූල පියවර ගෙන නොමැති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ පිළිබඳව නාවික හමුදාපති දැනුවත් කිරීමට පියවර ගත් බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

මෙම මාසයේ අවසාන වනවිට මේ සම්බන්ධයෙන් මැදිහත් වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.4.4 අලුතින් මාදැල් වරායවල් ගැසට් කිරීම

අලුතින් මාදැල් වරායවල් ගැසට් කිරීමේදී, දීර්ඝ කාලයක් මාදැල් වරායවල්වල නිරතව සිටි නමුත් ගැසට් පත්‍රයට ඇතුලත් වී නොමැති ස්ථාන සඳහා අවස්ථාව ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.5 ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.5.1 බේරේ වැව ආශ්‍රිත ධීවර කර්මාන්තයේ යෙදී සිටින ජනතාව වෙනුවෙන් තොටුපොළක් ලබා දීම

කොළඹ දිස්ත්‍රික්කයේ බේරේ වැව ආශ්‍රිතව සිදු වූ සංවර්ධන කටයුතු හේතුවෙන් එම ස්ථානය මූලික කරගෙන ධීවර කටයුතුවල නිරතව සිටින ජනතාවට ධීවර තොටුපොළක් අහිමි වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙම ජනතාව වෙනුවෙන් ධීවර තොටුපොළක් ඉදි කිරීම සඳහා සුදුසු ස්ථානයක් ලකුණු කර ලබා දෙන ලෙස නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇති නමුත් ඒ සඳහා මේ වනතෙක් ප්‍රතිචාරයක් නොලැබුණු බැවින් නැවත එම ඉල්ලීම ඉදිරිපත් කරන බව ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.5.2 කොරලවැල්ල මාදැල් වරාය මුහුදු ඛාදනයට ලක්වීම

මුහුදු ඛාදනය හේතුවෙන් පරිහානියට ලක්ව ඇති කොරලවැල්ල පිහිටි මාදැල් වරායවල් දෙක සංවර්ධනය කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී පරිහානියට ලක්ව ඇති මාදැල් වරායවල් සංවර්ධනය කිරීමට හෝ එසේ නොහැකිනම් වෙනත් විකල්ප ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වන බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

එසේම වත්මන් තත්ත්වය සලකා මේ වනවිට පවතින මාදැල් පනත සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

## 4.6 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.6.1 ගාල්ල නගරයේ ධීවර වෙළෙඳසැල් ක්‍රමවත් ලෙස ඉදි නොවීම

ගාල්ල අධිවේගී මාර්ගයෙන් පිට වන ස්ථානයේ ඇති ධීවර වෙළෙඳසැල් ක්‍රමවත් ලෙස ඉදි නොවීම හේතුවෙන් එම ප්‍රදේශයේ ආකර්ශනීය බව නැති වී ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් ධීවර අමාත්‍යාංශය මැදිහත් වී ක්‍රමවත් ලෙස මෙම වෙළෙඳසැල් ඉදි කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී. එසේ ඉදිකරනු ලබන වෙළෙඳසැල් ලබා දීමේදී අය කිරීමක් සිදු කිරීමට කටයුතු කළ හැකි බවද ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

### 4.6.2 ගාල්ල ධීවර වරාය සංවර්ධනය කිරීම

ගාල්ල ධීවර වරාය සංවර්ධනය කිරීමේ සැලසුම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර මේ වනවිට පාරිසරික බලපෑම් ඇගැයීම් (Environmental Impact Assessment -EIA) සහ සමාජීය බලපෑම් ඇගැයීම් (Social Impact Assessment - SIA) සම්බන්ධ අධ්‍යයන කටයුතු සිදු කෙරෙමින් පවතින බව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී.

### 4.6.3 විසිතුරු මත්ස්‍යයන් ආනයන සහ ප්‍රති අපනයනය කිරීම

විසිතුරු මත්ස්‍යයන් ආනයනය සහ ප්‍රති අපනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සඳහා ක්‍රියාත්මක වන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීමෙන් ඒ සඳහා බලපත්‍ර ලබා ගත හැකි බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

ගාල්ල විසිතුරු මසුන් ඇති කිරීමේ නිරතව සිටින සංවිධානයක් විසින් විසිතුරු මසුන් ප්‍රති අපනයනය සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති නමුත් එය ප්‍රතික්ෂේප වී ඇති බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙතින් ඉල්ලීමක් කරන ලදී.

විසිතුරු මසුන් ඇති කිරීමේ සංවිධානවල තම ව්‍යාපාර සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම සඳහා පියවර ගෙන ඇති බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

## 4.7 පේදුරු තුඩුවේ ධීවර වරායෙහි ප්‍රගතිය - ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

පේදුරු තුඩුවේ ධීවර වරායෙහි ප්‍රගතිය ඇතුළුව උතුරු පළාතේ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ පිළිබඳව ආසියානු සංවර්ධන බැංකුව සහ කොරියානු එක්සිම් බැංකුව (EXIM Bank) සමඟ සාකච්ඡා කර පළමුව මූල්‍ය ආධාර ලබා දීමට කටයුතු කරන ආයතනය සමඟ ඉදිරි කටයුතු ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

උතුරු පළාතේ බහුදින ධීවර කටයුතු ක්‍රියාත්මක නොවන බැවින් ඒ සඳහා ධීවරයන්ට අවශ්‍ය දැනුම, ධීවර ආම්පන්න ලබා දී ඔවුන් පුහුණු කිරීමට බලාපොරොත්තු වන බවත් මෙම ධීවරයන් සඳහා සහනාධාර යෝජනා ක්‍රමයක් යටතේ බහුදින ධීවර යාත්‍රා ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් දැනුම් දෙන ලදී.

බහුදින ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රියාවලිය සාගර විශ්වවිද්‍යාලය හරහා සිදු කිරීමේ කටයුතු මේ වනවිට ආරම්භ කර ඇති බව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දැනුම් දෙන ලදී.

## 4.8 ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.8.1 ඉන්දියානු ධීවරයන් විසින් උතුරු ධීවර මුහුදු ප්‍රදේශයට අනවසරයෙන් ඇතුල් වීම

පසුගිය ජූලි 22 වන දින ඉන්දියානු ධීවරයන් විසින් උතුරු ධීවර මුහුදු ප්‍රදේශයට අනවසරයෙන් ඇතුල් වී දේශීය ධීවරයන්ගේ ධීවර උපකරණ විනාශ කර බලවත් හානියක් සිදු කර ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව මෙම හානිය කෙරෙහි පූර්ණ අවධානය යොමු කර එම ධීවර ජනතාව සඳහා වන්දියක් ලබා දීමට කටයුතු කරන ලෙසත් එමෙන්ම රජයන් දෙක අතර එකඟතාවයක් ඇති වන තුරු නාවික හමුදාව විසින් මෙම ඉන්දියානු ධීවරයන්ගේ

පැමිණීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙසේ ඉන්දියානු ධීවරයන් අනවසරයෙන් මෙරට උතුරු මුහුදු සීමාවට ඇතුල්වීම නතර කිරීමට සාකච්ඡා මාර්ගයෙන් උත්සාහයන් ගනිමින් සිටින බවත් අනවසරයෙන් ඇතුල් වූ ඉන්දියානු ධීවරයන් අත්අඩංගුවට ගැනීමේ කටයුතුවල නාවික හමුදාව නිරත වූ බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඉහත සිදුවීමේදී මෙරට ධීවර ජනතාව වෙනුවෙන් වන්දි ලබා දීම සම්බන්ධයෙන් ඉන්දීය පාර්ශ්ව සමඟ සාකච්ඡා කිරීමේදී වන්දි ලබා දීම වෙනුවට වෙනත් මාර්ගයකින් සහන ලබා දෙන බව එම පාර්ශ්ව විසින් සඳහන් කළ බවත් ගරු සභාපතිතුමා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

### 4.8.2 මුහුදු කූඩැල්ලන් වගාවේ යෙදී සිටින උතුරු පළාතේ ධීවර ජනතාවගේ ගැටළු

මුහුදු කූඩැල්ලන් වගාවේ යෙදී සිටින උතුරු පළාතේ ධීවර ජනතාව තම ජීවනෝපාය සිදු කරගෙන යාමේදී විවිධ ගැටළුවලට මුහුණ දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

අගෝස්තු මස 10 වන දින පූනාරි ප්‍රදේශයේදී රැස්වීමක් පැවැත්වෙන බැවින් එහිදී මේ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා සහභාගි වන ලෙස ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.8.3 මුලතිව් නගරය ආසන්නයේ පිහිටි නාවික හමුදා කඳවුර හේතුවෙන් ධීවරයන්ට අවසර නොලැබීම

මුලතිව් නගරය තෙක් ගමන් කරන මාර්ගයේ වම් පස පිහිටා ඇති නාවික හමුදා කඳවුර හේතුවෙන් එම ප්‍රදේශය ආශ්‍රිතව ධීවර කටයුතු සඳහා අවසර නොලැබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාවික මෙහෙයුම්, කපිතාන් (ජලමානක) ජී.එච්.ජී.එස්. උදයංග මහතා වෙත උපදෙස් දෙන ලදී.

## 4.9 ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.9.1 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ධීවරයන් තිදෙනෙක් අතුරුදන් වීම

පසුගිය මැයි මස 23 වන දින ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ධීවරයන් තිදෙනෙක් අතුරුදන් වී ඇති බවත් මේ පිළිබඳ ගරු සභාපතිතුමා සහ ගරු රාජ්‍ය අමාත්‍යතුමා දැනුවත් කළ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ සම්බන්ධයෙන් වත්මන් තත්ත්වය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

මේ සම්බන්ධයෙන් කලාපීය රටවල් සමඟද සාකච්ඡා කරමින් තවදුරටත් පරීක්ෂණ කටයුතු සිදු කරන නමුත් තවමත් කිසිදු තොරතුරක් ලැබී නොමැති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.9.2 යාපනය දිස්ත්‍රික්කයට අයත් මයිලෙට්ටි ධීවර වරාය නැවතත් ධීවර අමාත්‍යාංශය යටතට පවරා ගැනීම

මේ සම්බන්ධයෙන් වන නීතිමය තත්ත්වය සහ සීමාවන් පිළිබඳ අවධානය යොමු කළ යුතු බවත් ගරු මන්ත්‍රීතුමා විසින් සඳහන් කරනු ලබන යෝජනාව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව සාකච්ඡා කර තීරණය කළ හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.9.3 වෙනත් ප්‍රදේශවලින් පැමිණෙන ධීවරයන් උතුරු නැගෙනහිර පළාත්වල ධීවර කටයුතුවල නියැලීම

මෙරට දකුණු ප්‍රදේශයේ ධීවරයන් මයිලෙට්ටි ප්‍රදේශයට පැමිණ ධීවර කටයුතුවල නියැලීම නිසා එම ප්‍රදේශයේ ජනතාවගේ ජීවනෝපායට තර්ජනයක් ඇතිව තිබෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

### 4.9.4 උතුරු නැගෙනහිර පළාත්වල ධීවර වරායන් සංවර්ධනය කිරීම

මෙම පළාත්වල ධීවර ජනතාවගේ පහසුකම් ලබා දීම පිළිබඳව සහ පේදුරු තුඩුව, ගුරුනගර්, පේසාලෙයි වැනි ප්‍රදේශවල ධීවර වරායන් සංවර්ධනය කිරීම පිළිබඳවත් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මෙසේ ධීවර වරායන් සංවර්ධනය කිරීමට මෙන්ම ධීවර ජනතාවට අවශ්‍ය පුහුණුව ලබා දීම සඳහා යම්කිසි කාලයක් ගතවන බවත් ණය පහසුකම් යටතේ ඔවුන්ට අවශ්‍ය ධීවර ආම්පන්න ලබා දීමෙන් ගැටළු බොහෝමයක් විසඳිය හැකි බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

විශාල ජනතාවක් සිටින ප්‍රදේශයක කොටසක් සඳහා පමණක් පුහුණුවක් ලබා දීම සම්බන්ධයෙන් සහ ගැඹුරු මුහුදේ ධීවර කටයුතුවල යෙදී සිටින ධීවර ජනතාව සඳහා පුහුණුවක් ලබා දීමේදී ඇති වන අඩුපාඩු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.10 ගරු සුදත් මංජුල මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.10.1 කෑගල්ල දිස්ත්‍රික්කයේ මිරිදිය ධීවර කර්මාන්තය

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මිරිදිය ධීවර කර්මාන්තයේ නියැලී සිටින වැව්වලට 2017 දී යම් මත්ස්‍ය පැටව් විශේෂයක් එකතු කළ නමුත් එය අසාර්ථක වූ බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මෙහිදී යම් අධ්‍යයනයක් සිදු කර දැනට මෙම වැව්වල සිටින මත්ස්‍ය ප්‍රජාවට හානියක් නොවන ලෙස මෙසේ මත්ස්‍ය පැටව් එකතු කිරීම සුදුසු බව ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලදී.

මෙම ක්‍රියාවලියට සම්බන්ධ වැව් සම්බන්ධ තොරතුරු ලිඛිතව ඉදිරිපත් කරන ලෙසත් ඒ අනුව අවධානය යොමු කළ හැකි බවත් රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

**4.10.2 කෑගල්ල දිස්ත්‍රික්කයේ සුරතල් මසුන් ඇති කිරීමේ ව්‍යාපාරය**

රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෙම ව්‍යාපාරයේ නිරතව සිටින සංගම් එක් කාලයකදී සුරතල් මසුන් අලෙවි කිරීමේ ගැටළුවකට මුහුණ දෙන බව ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

එබැවින් රාජ්‍ය මැදිහත්වීමෙන් මෙම මසුන් මිලදී ගැනීම විධිමත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**4.10.3 කෑගල්ල දිස්ත්‍රික්කය තුළ මුහුදු මාළු සඳහා අධික මිලක් ගෙවීමට සිදු වීම**

මෙම ගැටළුවට විසඳුමක් ලෙස කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති සියලු උප නගරවල ධීවර වෙළෙඳසැල් ආරම්භ කරන ලෙසත් රුවන්වැල්ල නගරයේ තොග ධීවර අලෙවිසැලක් ආරම්භ කරන ලෙසත් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

මේ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දිය හැකි බවත් ගරු මන්ත්‍රීතුමා විසින් දැනුම් දෙන ලදී.

මේ වනවිට වෙරළාසන්න නොවන රට අභ්‍යන්තරයේ ප්‍රදේශවල ධීවර අලෙවිසැල් ජාලය වැඩි කිරීමට ධීවර සංස්ථාව තීරණයක් ගෙන ඇති බැවින් ගරු මන්ත්‍රීතුමා අවශ්‍ය සහයෝගය ලබා දෙන්නේ නම් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ හැකි බව රාජ්‍ය අමාත්‍ය, ගරු කංචන විජේසේකර මහතා විසින් දැනුම් දෙන ලදී.

**5.** කාරක සභාව ප.ව. 4.00 ට 2021.09.09 දින තෙක් කල් තබන ලදී.

---

**අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**
**තෙවැනි රැස්වීම - 2021 සැප්තැම්බර් 10**

**පැමිණි සාමාජික මන්ත්‍රීන්**

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (සභාපති)
ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු විජිත බේරුගොඩ මහතා (රාජ්‍ය අමාත්‍ය)
ගරු (වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය (රාජ්‍ය අමාත්‍ය)
ගරු චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු අනුප පස්කුවල් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

**පැමිණි සාමාජික නොවන මන්ත්‍රීන්**

ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු ඩග්ලස් දේවානන්ද මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

**1. වාර්ෂික වාර්තා සලකා බැලීම**

පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද පහත සඳහන් වාර්ෂික වාර්තා සලකා බැලීමෙන් අනතුරුව එම වාර්ෂික වාර්තාවලට කාරක සභාව එකඟ වූ අතර ඒ පිළිබඳව කාරක සභාවේ වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් 2021 සැප්තැම්බර් මස 21 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්විය යුතු යයි ද තීරණය කරන ලදී.

**1.1** 2016 සහ 2017 වර්ෂ සඳහා ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තා
**1.2** 2019 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව
**1.3** 2019 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.4** 2019 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව
**1.5** 2019 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශන
**1.6** 2019 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන
**1.7** 2019 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්
**1.8** 2019 වර්ෂය සඳහා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව
**1.9** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්
**1.10** 2019 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්
**1.11** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව
**1.12** 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව

නියමිත කාලය තුල වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොමැති අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල වාර්ෂික වාර්තා ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු සලසන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**2. 2021.03.10 දින පැවති කාරක සභාවේ දෙවන රැස්වීමේ කාර්ය සටහන්වලින් පැන නඟින කරුණු**

**2.1 "ශ්‍රී ලංකාවේ නීතිය අධ්‍යාපන විෂයයක් වශයෙන් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම" (2021.03.10 දින පැවති කාරක සභාවේ අයිතම අංක 03)**

ඉහත විෂය සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා තමාගේ සභාපතිත්වයෙන් යුතුව අනුකාරක සභාවක් පත් කරන ලද බව රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා පැවසීය. එකී අනුකාරක සභාව මගින් පත්කරන ලද රජයේ නීතිඥ සංගමයේ නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරීන් සහ වෙනත් රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත තාක්ෂණ කමිටුව මගින් කරුණු විමර්ශනය කිරීම සඳහා සාකච්ඡා වට කීපයක් පැවැත් වූ බවත් රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය මත එම කමිටුවේ වාර්තාව ලබාදීම ප්‍රමාද වී ඇති බවත් රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා තවදුරටත් දැනුම්දෙන ලදී.

ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් අනු කාරක සභාව මෙම විමර්ශනය සඳහා ලබා ගැනීමට බලාපොරොත්තුවන ප්‍රවේශය පිළිබඳව දැනුම් දීමක් කරන ලදී.

නීතිය වෙනම විෂයක් වශයෙන් නොව 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා උගන්වනු ලබන පුරවැසි අධ්‍යාපනය විෂයෙහි කොටසක් වශයෙන් පාසැල් විෂය ධාරාවට ඇතුලත් කිරීමට අපේක්ෂා කරනු ලබන බව රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් තවදුරටත් දැනුම් දෙන ලදී.

ඉහත කරුණුවලට අමතරව පාසැල් දරුවන්ගේ යුතුකම් මෙන්ම පුරවැසි අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන කරුණුද නීතිය හා සමාජය අතර පවතින සම්බන්ධතාව පිළිබඳ කරුණුද පාසැල් විෂයමාලාවට ඇතුලත් කරන ලෙස ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් ඉල්ලීමක් කරන ලදී.

**2.2 ගුරුවරුන් බඳවා ගැනීම සඳහා තරඟ විභාග පැවැත්වීම - ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය (2021.03.10 දින පැවති කාරක සභා අයිතම අංක 11.2)**

උපාධිධාරීන් ගුරු අභ්‍යාසලාභීන් ලෙස බඳවාගැනීම සම්බන්ධයෙන් පවතින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රයෝගික පරීක්ෂණයකින් තාවකාලික ගුරුවරුන් ලෙස බඳවා ගැනීමෙන් පසුව වසර 03 ක පරිවාස කාලයකින් පසු විභාගයක් පවත්වා සේවයේ ස්ථිර කරනු ලබන බව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් පී. කේ. එස්. සුභෝදිනී මහත්මිය පැවසීය. විදේශ භාෂා ඉගැන්වීම සඳහා විදේශ භාෂා සම්බන්ධයෙන් උපාධියක් ලබා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇති බවත් උතුරු නැගෙනහිර පාසැල්වල ගුරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇති බවත් තවදුරටත් දැනුම්දෙන ලදී.

මෙරට ගුරු ශිෂ්‍ය අනුපාතය වර්තමානය වන විට 17:1 වශයෙන් පවතින බවත් විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා තාක්ෂණ විෂයන් සඳහා ගුරුවරුන්ගේ හිඟයක් පවතින බැවින් ගුරුවරුන් නියමිත පරිදි පාසැල්වලට ස්ථානගත කිරීමේ ගැටළු පවතින බවත් රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පෙන්වා දෙන ලදී.

උපාධිධාරී අභ්‍යාසලාභී ගුරුවරුන් 18,000 ක් මේ වන විට අධ්‍යාපන කාර්යාලවලට හා පාසැල්වලට අනුයුක්ත කර ඇති බවත් විද්‍යාපීඨ 19 ක් විශ්ව විද්‍යාල මට්ටමට ගෙන ඒමට යෝජනා කර ඇති බවත් රාජ්‍ය අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් දැනුම් දෙන ලදී.

ගුරුවරුන් බඳවාගැනීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත් ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා සහ අදහස් ලබාගැනීමට දැනට තීරණය කොට ඇති බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විෂයානුබද්ධව හා පාසැල්වල පවතින පුරප්පාඩු අනුව ගුරුවරු බඳවාගැනීම් සිදුකළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව තොරතුරු රැස් කොට දත්ත ගබඩා නිර්මාණය කර ඇති බවත් සියළු පළාත්වල ආණ්ඩුකාරවරුන් දැනුවත් කර බඳවාගැනීම් සම්බන්ධයෙන් තීරණයක් ගෙන ගරු මන්ත්‍රීවරුන්ට දැනුම් දීමට කටයුතු කරන බවත් අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

දැනට අභ්‍යාසලාභීන් ලෙස බඳවාගෙන ඇති 18,000 ක් වන උපාධිධාරීන් වසර 3 ක පුහුණු කාලයෙන් පසුව පැවැත්වෙන තනතුර ස්ථිර කිරීමේ පරීක්ෂණයෙන් අසමත් වුවහොත් ඔවුනට අත්විය හැකි ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් යම්කිසි පියවරක් ගෙන තිබේද යන්න පිළිබඳව ගරු ජයන්ත සමරවීර මහතා විසින් විමසා සිටින ලදී.

පාසැල් කම්කරුවන් ලෙස බඳවාගෙන ඇති උපධිධාරීන්ටද අභ්‍යාසලාභී ගුරුවරුන් ලෙස පත්වීමට හැකි ක්‍රමවේදයක් සකසා දෙන ලෙස ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවේ යෝජනාවක් ලෙස පවතින කැබිනට් පත්‍රිකාවේ ගැටළුකාරී තත්ත්වයන් සංශෝධනය කර නව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළ යුතු බව අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව සති 02 ක් තුල සියළු බලතල ඇතිව ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අනුකමිටුව පත් කිරීමට පියවර ගන්නා බවත් එම කමිටුවේ වාර්තාව පදනම් කරගෙන ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගනු ලබන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

**2.3 යාපනය විශ්ව විද්‍යාලයේ ගැටළුකාරී තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව මාධ්‍යයට නිකුත් කිරීම - ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා (2021.03.10 දින පැවති කාරක සභාවේ අයිතම අංක 11.14.3)**

මේ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.

**2.4 උතුරු මැද පළාතේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් අනුයුක්ත කිරීම - ගරු. එච්. නන්දසේන මහතා (2021.03.10 දින පැවති කාරක සභාවේ අයිතම අංක 11.16)**

මෙම කාරණය සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳව ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු යොමු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසන ලදී.

**3. ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා**

**3.1 අධ්‍යාපනයේ රාජ්‍ය භාෂා මාධ්‍ය ක්‍රමයෙන් විතැන් වෙමින් ඉංග්‍රීසි මාධ්‍ය ඒ තැනට පැමිණෙමින් තිබීම නිසා මව් භාෂා දියුණුව නැතිවී යාම - ගරු වාසුදේව නානායක්කාර මහතා (යෝජනා අංක 410)**

මෙම යෝජනාව ඉදිරි කාරක සභා රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුලත් කරන මෙන් ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

**3.2 රජයේ පාසැල්වල ඉස්ලාම් ආගම විෂය උගැන්වීම සඳහා වූ මව්ලවි ගුරු පත්වීම් පුරප්පාඩු හා එම අවශ්‍යතා පිරවීම - ගරු රාවුෆ් හකීම් මහතා (යෝජනා අංක 75)**

**3.3 බදුල්ල අල් - අදාන් මහා විද්‍යාලය සහ බණ්ඩාරවෙල සර් රාසික් පරීද් මහා විද්‍යාලය ජාතික පාසැල් බවට උසස් කිරීම - ගරු රාවුෆ් හකීම් මහතා (යෝජනා අංක 76)**

**3.4 බ/ප/කො දෙමටගොඩ කයිරියා බාලිකා මහා විද්‍යාලය දෙමටගොඩ කොළඹ 9 හා බප/කො/අල් හික්මා විද්‍යාලය කොළඹ 12 ජාතික පාසැල් බවට පත් කිරීම - ගරු රාවුෆ් හකීම් මහතා (යෝජනා අංක 77)**

**3.5 ගාල්ල තලාපිටිය දප/ගා මුස්ලිම් බාලිකා විද්‍යාලය ජාතික පාසැලක් බවට උසස් කිරීම - ගරු රාවුෆ් හකීම් මහතා (යෝජනා අංක 78)**

**3.6 අප රටේ පාසැල්වල විෂයානුබද්ධ ගුරු අවශ්‍යතාව කොපමණද යන්න - ගරු ලසන්ත අලගියවන්න මහතා (යෝජනා අංක 98)**

**3.7 වාද්දුව, දෙල්දූව, ගනේවත්ත පුරාණ විහාරස්ථානයේ මූලික පිරිවෙනක් ආරම්භ කිරීම - ගරු ජයන්ත සමරවීර මහතා - (යෝජනා අංක 114)**

**3.8 මාර/යටියන මහා විද්‍යාලයට පානීය ජලය පිරිපහදු කිරීමේ පද්ධතියක් ලබාගැනීම - ගරු බුද්ධික පතිරණ මහතා - (යෝජනා අංක 115)**

**3.9 පාසැල්වල ක්‍රීඩා පුහුණුකරුවන් හා උපදේශකයන් හට වේතන හෝ යැපීම් දීමනාවක් ගෙවීම - ගරු උදයන කිරිඳිගොඩ මහතා - (යෝජනා අංක 116)**

**3.10 පළාත්සභා පාසැල්වල පුස්තකාල සහයක ඇතුළු අනධ්‍යයන පුරප්පාඩු පුරවාලීම - ගරු උදයන කිරිඳිගොඩ මහතා - (යෝජනා අංක 117)**

**3.11 සෞඛ්‍ය උපදෙස් මත පුළුල් අධ්‍යනයකින් පසු පාසැල් විවෘත කිරීම - ගරු උදයන කිරිඳිගොඩ මහතා (යෝජනා අංක 118)**

අංක 3.2 සිට 3.11 දක්වා යෝජනාවන්ට අදාළ පිළිතුරු එම ගරු මන්ත්‍රීවරුන් වෙත යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.12 2019 පැරණි හා නව නිර්දේශය මත විභාගයට පෙනී සිටි දරුවන්ට සිදුවී ඇති අසාධාරණය හා ඒ අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පාදක කර ගන්නා ක්‍රම වේදය - ගරු උදයන කිරිඳිගොඩ මහතා (යෝජනා අංක 119)**

2019 වසරේ උසස්පෙළ විභාගයට සහභාගී වූ ශිෂ්‍යයන් මේ වන විට විශ්ව විද්‍යාලවලට තෝරාගෙන අවසන් කර ඇති බවත් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සිදුකෙරෙමින් පවතින බවත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පැවසීය.

ගරු උදයන කිරිඳිගොඩ මහතා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.13 ගා /අම්පේගම මහා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත්කිරීම සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 121)**

ගා/අම්පේගම මහා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත් කිරීමට කටයුතු කර ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.14 කේ.එච්. ලක්මාල් ඉන්දික මහතාගේ දියණිය 2021 වර්ෂයේ ගාල්ල සිරිමම විද්‍යාලයේ පළමු වසර සඳහා ඇතුලත් කර නොගැනීම - ගරු. චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 122)**

මෙම කරුණ පිළිබඳව සලකා බලන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**3.15 2019 උසස්පෙල සිසුන්ට විශ්ව විද්‍යාල ප්‍රවේශ ලකුණු ක්‍රමවේදය නිසා සිදුවූ අසාධාරණය සම්බන්ධව - ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 127)**

අසාධාරණයට ලක්වූ දරුවා මේ වන විට රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට තෝරාගෙන ඇති බව විශ්ව විද්‍යාල කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා විසින් දැනුම් දෙන ලදී.

ගරු බුද්ධික පතිරණ මහතා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.16 සහෝදර පදනම මත මාතර රාහුල විද්‍යාලයේ පළමු ශ්‍රේණියට දරුවා ඇතුලත් කර ගැනීම සම්බන්ධයෙන් මාතර ජේ.කේ. සුසිලා නිල්මිණී මහත්මියගේ ඉල්ලීම - ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 142)**

ගරු බුද්ධික පතිරණ මහතා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.17 මාතර පඹුරන සාරිපුත්ත ද්විතීයක විද්‍යාලයට ඉංජිනේරු තාක්ෂණවේදය සඳහා ගුරුවරයකු සහ එම පාසැලට තාක්ෂණවේදය සඳහා පන්තියක් ලබාදීම - ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 173)**

ගරු බුද්ධික පතිරණ මහතා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.18 හබරාදූව පැරණි අභයදාන විදුහල පිහිටි ඉඩම ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය වෙත පවරා දීම. - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 189)**

මෙම කාරණය සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ මතය විමසා ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබාදෙන ලදී.

**3.19 මාර / යටියන මහා විද්‍යාලයට පානීය ජලය පිරිපහදු කිරීමේ පද්ධතියක් ලබා ගැනීම - ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 192)**

ගරු මන්ත්‍රීතුමා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.20 උපාධිධාරීන් උපාධි විෂයට අදාල නොවන තනතුරුවලට අනුයුක්ත කර තිබීම සහ විවිධ උසස්වීම් සහ වැටුප් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම මගින් ඇතිවී තිබෙන විෂමතාවයන් සඳහා විසඳුමක් ලබාගැනීම සහ තවත් කරුණු - ගරු බුද්ධික පතිරණ මහතා (යෝජනා අංක 195)**

ගරු මන්ත්‍රීතුමා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.21 ඩබ්.එච්. ගගන හංස සෙනෙත්මාල් දරුවා 2019 වර්ෂයේ ගා/රිච්මන්ඩ් විද්‍යාලයේ 4 වන ශ්‍රේණියට ඇතුලත් කර නොගැනීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 203)**

ගරු මන්ත්‍රීතුමා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

**3.22 එච්.බී.ජී තේජ ශ්‍රී ආසිංසනා දියණිය 2021 වර්ෂයේ ගා / සංඝමිත්තා බාලිකා විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර නොගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාව - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 204)**

මෙම දරුවාගේ ඉල්ලීම පිළිබඳව සලකා බලා කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**3.23 එන්.ඩබ්.ජී. වොසදි සුගන්ධරා දියණිය 2021 වර්ෂයේ කිසිදු පාසැලකට ඇතුලත් කර නොගැනීම - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 205)**

මෙම දරුවාගේ ඉල්ලීම පිළිබඳව සලකා බලා කටයුතු කරන මෙන් ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබා දෙන ලදී.

**3.24 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අනියම් කම්කරු ඩබ්.කේ සංසදාස මහතාට විශ්‍රාම වැටුප නොලැබීම. - ගරු චන්දිම වීරක්කොඩි මහතා (යෝජනා අංක 206)**

ඩබ්.කේ සංසදාස මහතා දේශපාලන පළිගැනීම් කමිටු තීරණ මත නැවත සේවයේ පිහිටුවා ඇති බවත් නැවත සේවයේ පිහිටුවීමේදී වයස අවු. 45 ඉක්මවා තිබීමේ හේතුව මත ඔහුට විශ්‍රාම වැටුප ලබාදීම ප්‍රතික්ෂේප වී ඇති බවත් ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් පෙන්වා දෙන ලදී.

සංසදාස මහතාට විශ්‍රාම වැටුප ලබාදීමට ඇති හැකියාව පරීක්ෂා කර අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබාදෙන ලදී.

**3.25 බෝතලේගම මහා විද්‍යාලයට ශ්‍රවනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම - ගරු ජයන්ත සමරවීර මහතා (යෝජනා අංක 217)**

ගරු මන්ත්‍රීතුමා වෙත මෙම යෝජනාවට අදාල පිළිතුරු යවා ඇති බව අමාත්‍යාංශයේ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී කොළඹ දිස්ත්‍රික්කයේ පාසැල් ජාතික පාසැල් බවට පත්කිරීම සම්බන්ධයෙන් ගරු යදාමිණී ගුණවර්ධන මහතා විසින් අදහස් දක්වන ලදී.

**4. වෙනත් කටයුතු**

**4.1 ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ක්‍රීඩා හා කලා කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා ගුරුවරුන් ලබාදීම - ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ක්‍රීඩා කුසලතාවයන් මෙන්ම සංගීත, නැටුම්, චිත්‍ර, කථිකත්වය වැනි අනෙකුත් කුසලතාවයන් වැඩිදියුණු කිරීම සඳහා එම විෂයන්හි ප්‍රවීනතාවයන් සහිත ගුරුවරුන් පාසැල්වලට අනුයුක්ත කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදි.

**4.2 පාසැල්වලට ගුරුවරුන් බඳවා ගැනීම සම්බන්ධ කටයුතු - ගරු විජිත බේරුගොඩ මහතා**

පාසැල්වලට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ගැසට් නිවේදන නිකුත් කරනු ලබන්නේ කුමන කාල වකවානුවක ද යන්න පිළිබඳව සහ ගුරුවරුන් බඳවා ගැනීම් සම්බන්ධයෙන් සියළු පලාත්වල අදාළ නිලධාරීන් යම් එකඟතාවයකට පැමිණ ඇද්ද යන්න පිළිබඳව ගරු මන්ත්‍රීතුමා විසින් විමසීමක් කරන ලදී.

සියළු පළාත්වල ගුරුවරුන් සම්බන්ධ දත්ත එක් රැස්කර පරිඝණකගත කර ඇති බවත් ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත් අමාත්‍යාංශ ලේකම් විසින් දැනුම් දෙන ලදී.

## 4.3 ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.3.1 මොරටුව ද සොයිසා විද්‍යාලය ජාතික පාසැලක් බවට පත් කිරීම.

මොරටුව ද සොයිසා විද්‍යාලය, ජාතික පාසැලක් බවට පත්කිරීමට කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.3.2 බෝමිරිය ජාතික පාසැලට ස්ථිර විදුහල්පතිවරයකු පත්කිරීම.

බෝමිරිය ජාතික පාසැලේ ස්ථිර විදුහල්පතිවරයා නිවාඩු ලබා විදේශගතව ඇති බැවින් වැඩ බලන විදුහල්පතිවරියක පත් කර ඇති නමුත් ඇයට පාසැලේ කටයුතු ක්‍රමානුකූලව කරගෙන යාමට බාධා පැමිණ ඇති බව ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම පාසැලේ වැඩ බලන විදුහල්පතිනියට තනතුරට අදාල සියළු බලතල වරප්‍රසාද හා පහසුකම් ලබාදී රාජකාරී කටයුතු නියමිත අයුරින් සිදුකිරීමට අවශ්‍ය පසුබිම සකසා දෙන ලෙස ගරු සභාපතිතුමා විසින් අමාත්‍යාංශයේ ලේකම්ට උපදෙස් ලබාදෙන ලදී.

### 4.3.3 රජයේ හා පුද්ගලික විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන්ට ෆයිසර් එන්නත ලබාදීම.

රජයේ හා පුද්ගලික විශ්ව විද්‍යාලවල ශිෂ්‍යයන්ට ෆයිසර් එන්නත ලබාදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීවරයා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.4 ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට වෛද්‍ය ශිෂ්‍යයන් 100 ක් ඇතුලත් කර ගැනීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමිය විසින් විමසීමක් කරන ලදී.

ඒ පිළිබඳව කරුණු පරීක්ෂා කර ගරු මන්ත්‍රීතුමිය වෙත ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.

## 4.5 කොවිඩ් තත්ත්වය හේතුවෙන් ආදායම් බිඳවැටී ඇති විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට ණය පහසුකම් ලබාදීම ඇතුළු තවත් කරුණු - ගරු අනූප පැස්කුවල් මහතා

### 4.5.1 කොවිඩ් තත්ත්වය හේතුවෙන් අදායම් බිදවැටී ඇති විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට ණය පහසුකම් ලබාදීම.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ආදායම් මට්ටම් පහත වැටීම නිසා පළමු වසර තුල ණය පහසුකම් ඉල්ලා නොමැති නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත කරන ලද විශ්වවිද්‍යාල 12 ක 2,3 වසරවල අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා ණය පහසුකම් ඉල්ලා සිටින සිසුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.5.2 ඉංජිනේරු සේවයේ යෙදී සිටින්නන්ට ලබාදෙනු ලබන රු.15,000/- ක දීමනාව විශ්වවිද්‍යාලවල සේවය කරන ඉංජිනේරුවන්ට ලබා දීම.

මෙරට ඉංජිනේරු සේවයේ යෙදී සිටින නිලධාරීන්ට 2012 වසරේ සිට ලබා දෙන ලද රු.15,000/- දීමනාව විශ්වවිද්‍යාලවල සේවය කරන ඉංජිනේරුවන්ටද ලබාදීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.5.3 විශ්වවිද්‍යාලවල සේවය කරනු ලබන තොරතුරු තාක්ෂණ නිලධාරීන්ගේ ගැටළු.

විශ්වවිද්‍යාලවල සේවය කරනු ලබන තොරතුරු තාක්ෂණ නිලධාරීන්ට උසස්වීම් පටිපාටියක් නොමැතිවීම වැනි ගැටළු රාශියක් පවතින බැවින් එම ගැටළු සාකච්ඡා කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.5.4 සාගර විශ්වවිද්‍යාලය ජාතික විශ්ව විද්‍යාලයක් බවට පත්කිරීම

සාගර විශ්වවිද්‍යාලය විශ්ව විද්‍යාල කොමිෂන් සභාව යටතට පවරාගෙන ජාතික විශ්වවිද්‍යාලයක් බවට පත්කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.5.5 පිරිවෙන් අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේලාගේ ඉල්ලීම්.

පිරිවෙන් අධ්‍යාපනය ලබන භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන විෂය මාලාවන්ට ආයුර්වේදය, ජ්‍යොතිෂය, ගුප්ත විද්‍යාව වැනි විෂයන් ඇතුළත් කරන ලෙස ඉල්ලීම් කරන බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

## 4.6 ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

### 4.6.1 බටේමුල්ල ජාතික පාසැලට විදුහල්පතිවරයකු ලබාගැනීම

බටේමුල්ල ජාතික පාසැලේ පරිපාලන කටයුතු දැනට ගුරුවරයෙකු මගින් සිදු කරන බැවින් එම පාසැලට ස්ථිර විදුහල්පතිවරයකු අනුයුක්ත කරන ලෙස ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ඉල්ලීමක් කරන ලදී.

### 4.6.2 ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතනය (එන්එස්බීඑම් සරසවිය) නැවත විවෘත කිරීම

සිසුන් 30,000 ක් පමණ ඉගෙනුම ලබන එන්එස්බීඑම් සරසවියේ වෛද්‍ය හා ඉංජිනේරු පීඨ නැවත විවෘත කිරීමට කටයුතු කරන මෙන් ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලීමක් කරන ලදී.

**5.** කාරක සභාව ප.ව.12.30 ට දින නියමයක් නොමැතිව කල් තබන ලදී.